# 3

## සුපිළිපන් දේශයක් කරා
## සුපිළිපන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ
## වැඩමුළු මාලාව

රාජ්‍ය නිලධාරීන් සඳහා

# එක්දින වැඩමුළු මාර්ගෝපදේශ සංග්‍රහය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

# සුපිළිපන් දේශයක් කරා

සුපිළිපන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළු මාලාව

රාජ්‍ය නිලධාරීන් සඳහා

# එක්දින පුහුණු මාර්ගෝපදේශ සංග්‍රහය

CIABOC

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

රාජ්‍ය නිලධාරීන් සඳහා දූෂණ විරෝධී පුහුණු වැඩමුළු මාලාව

## එක්දින පුහුණු මාර්ගෝපදේශ සංග්‍රහය

**ප්‍රථම මුද්‍රණය - 2020 අගෝස්තු**

ISBN- 978-624-5040-20-9

ප්‍රකාශනය
**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
36, මලලසේකර මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.
Tel : +94 112 596360 / 1954
Mob : +94 767011954
E-mail : ciaboc@eureka.lk

මුද්‍රණය
**SWIES PRINT PACK**
124 A, Negombo Road, Kadana.

9 786245 040209

# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පණිවුඩය

"දූෂණය හිම ගුලියක් වැනිය. එය පෙරළීයෑම ආරම්භ වූ විට අනිවාර්යයෙන්ම විශාල වේ" ("Corruption is like a ball of snow" once it's set a rolling it must increase") යැයි 19 වන සියවසේ විසූ ඉංග්‍රීසි ලේඛකයෙකු වන චාල්ස් කොල්ටන් පවසා තිබේ. මානව ශිෂ්ටාචාරයේ ආරම්භක අවධිය තරම්ම ඉපැරණි ඉතිහාසයකට හිමිකම් කියන දූෂණය නමැති සංසිද්ධිය පසුගිය වසර දහස් ගණනක කාල වකවානුව පුරා ලොව දියුණු-නොදියුණු රටවල් රැසක් වෙළාගනිමින් පැතිරෙමින් පවත්නා බව දූෂණයේ ප්‍රමාණය මැන බලන ජාත්‍යන්තර දර්ශක අනුව පෙනී යයි.

එහෙත් වත්මන් ලෝකයේ තවත් සමහර රටවල් දූෂණය නැමැති, කළු හිම ගුලි, පෙරළීම වැළැක්වීමට පමණක් නොව ඒවා සාර්ථකව දිය කර හරිමින් දූෂණය මැඩලිය හැකි සංසිද්ධියක් බව ක්‍රියාවෙන් ඔප්පු කර පෙන්වීමටද මේ වන විට සමත් වී තිබේ.

පොදු ජන ජීවිත මත විනාශකාරී ලෙස බලපෑම් කරමින් තිබෙන දූෂණය මැඩලීමට වෙර දැරූ විවිධ මට්ටම්වලට අයත් දූෂණ විරෝධීන් පසුගිය වකවානුව පුරා වැඩි පරිශ්‍රමයක් දරන ලද්දේ දූෂණ ව්‍යසනය සීමා කිරීමට අවශ්‍ය ආයතනික හා නෛතික ව්‍යුහයන් ශක්තිමත් කිරීම කෙරෙහිය.

එහෙත් නූතන ලෝකය තුළ දූෂණය මැඩලීමේ ජයග්‍රහණයන් අත්කරගෙන ඇති රටවල් සිය සාර්ථකත්වයේ නිදසුන් මගින් පෙන්වා දෙන්නේ ආයතනික හා නෛතික ව්‍යුහයන් ශක්තිමත් කිරීම පමණක් දූෂණය මැඩලීමට සාර්ථක ප්‍රතිකර්මයක් නොවන බවය. දූෂණය ජය ගැනීම සඳහා ඊට අවශ්‍ය ආයතනික හා නෛතික ව්‍යුහයන් සවිමත් කිරීමට සමාන්තරව පොදු ජනතාව දූෂණය සම්බන්ධයෙන් දැනුම්වත්, සංවේදී සහ ක්‍රියාශීලී පිරිසක් බවට පත් කිරීම ඉලක්ක කරගත් අධ්‍යාපනික ක්‍රියාවලියක් පැවැතීමේ අවශ්‍යතාවද මේ වන විට ලොව පුරා දූෂණ විරෝධී අරගල තුළ ප්‍රමුඛ කරුණක් ලෙස පිළිගැනීමට ලක්ව තිබේ.

"ශ්‍රී ලංකාව ලොව විශිෂ්ටතම දේශයක් බවට පත් කිරීම උදෙසා, සුපිළිපන් හදැති අභිමානවත් ශ්‍රී ලාංකේය පරපුරක් බිහි කිරීම" පරමාදර්ශී අභිලාශය හා දැක්ම කොටගනිමින් සම්පාදනය කොට ඇති ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීමෙහිදීද දූෂණයට එරෙහි සටනට විශාල ප්‍රජාවක් දායක කර ගැනීම කෙරෙහි ප්‍රමුඛ අවධානයක් යොමු කර තිබේ. ඉදිරි පස් වසර තුළ (2019-2023) ක්‍රියාවට නැංවීමට නියමිත එම ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි දෙවන උපායමාර්ගය වන්නේ සාරධර්ම මත පදනම් වූ අධ්‍යාපනය හා ප්‍රජා සහභාගීත්වයයි. සැලසුමේ සෙසු උපාය මාර්ග ලෙස නිවාරණ කටයුතු, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන ශක්තිමත් කිරීම සහ නීති හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හඳුනාගෙන තිබේ.

සාරධර්ම මත පදනම්වූ අධ්‍යාපනය හා ප්‍රජා සහභාගීත්වය යටතේ ළමුන් හා තරුණයින් සඳහා සුපිළිපන් අධ්‍යාපනය ලබාදීම, රාජ්‍ය අංශයේ දැනුම්වත්භාවය වැඩි කිරීම, වගවීම සම්බන්ධ මහජන ඉල්ලුමක් ඇති කිරීම ආදී විවිධ ක්‍රියාකාරකම් රැසක් හඳුනාගෙන ඇත. රාජ්‍ය නිලධාරීන් අතරින් තෝරාගත් 400ක් අල්ලස්-දූෂණ විෂයය පිළිබඳ පුහුණුකරුවන් වශයෙන් පුහුණු කර, ඔවුන් මගින් සමස්ත රාජ්‍ය සේවයෙන් 25% ක් ඉක්මවන පිරිසක් දූෂණ විරෝධය පිළිබඳව දැනුම්වත් පිරිසක් බවට පත්කර ගැනීමේ ඉලක්කයද ජාතික ක්‍රියාකාරී සැලැස්මේ උපායමාර්ග අතර ප්‍රමුඛ අංගයකි. එම අවශ්‍යතාව සපුරාලීමේ අරමුණින්, රාජ්‍ය නිලධාරීන් සඳහා දූෂණ විරෝධී එක්දින පුහුණු වැඩසටහන් ඉලක්ක කරමින් සම්පාදනය කරන ලද එක්දින පුහුණු මාර්ගෝපදේශ සංග්‍රහය කෘතිය ශ්‍රී ලංකාව තුළින් අල්ලස දූෂණය මැඩලීම සඳහා රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීමේ කාර්යයට විශාල පිටිවහලක් වනු ඇතැයි විශ්වාස කරමු.

ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම වෙනුවෙන් මූල්‍ය අනුග්‍රහය සහ තාක්ෂණික සහය ලබාදෙමින් අපට සහය වන අන්තර් ජාතික සංවර්ධනය සඳහා වූ ඇමෙරිකානු ඒජන්සිය මගින් ක්‍රියාත්මක ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ වගවීම ශක්තිමත් කිරීමේ (SDGAP) ව්‍යාපෘතියටත්, කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ මාර්ගෝපදේශ යටතේ මෙම ග්‍රන්ථය සම්පාදනය කළ SDGAP වැඩසටහනේ උපදේශකවරයෙකු වන ආනන්ද ධර්මප්‍රිය ජයසේකර මහතාට සහ එම කාර්යයට දායක වූ සැමටත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ස්තුතිය හිමි වේ.

## රාජ්‍ය නිලධාරීන් සඳහා දූෂණ විරෝධී පුහුණු වැඩසටහන
## එක්දින පුහුණු මාර්ගෝපදේශ සංග්‍රහය

**පෙළගැස්ම** **පිටුව**


**පිවිසුම් දොරටුව** 07

**මාර්ගෝපදේශ සංග්‍රහය හැඳින්වීම** 09

**පුහුණු මෙවලම් සහ සම්පත්** 11

**පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම** 13

**සැසි සැලැස්ම හා අන්තර්ගතය** 15

**සමාරම්භක සැසිය - වැඩසටහන හඳුන්වාදීම හා සමායෝජනය** 17
**දෙවැනි සැසිය - දූෂණය හඳුනාගැනීම** 19
දූෂණය යනු කුමක්ද ?
දූෂණයේ විවිධ ස්වරූපයන්
දූෂණය නිසා අහිමිවන ජාතික ධනය සහ එහි ප්‍රතිවිපාක

**දූෂණයට එරෙහි ජාත්‍යන්තරය**
දූෂණයට එරෙහි ගෝලීය පෙළගැස්ම
දූෂණය ජයගැනීම : හොංකොං ආදර්ශය

**තෙවැනි සැසිය - දූෂණයට එරෙහි ශ්‍රී ලාංකික පෙළගැස්ම** 23
දූෂණයට වැටබඳින නීතිරීති
අල්ලස් කොමිසමේ බලතල හා කාර්යභාරය

**සිව්වැනි සැසිය - දූෂණය පිටුදැකීමේ ශ්‍රී ලාංකික සැලසුම්** 25
සුපිළිපන් රාජ්‍ය සේවකයා සතු හරයාත්මක භාවිතාව
සුපිළිපන්භාවය හඳුනාගැනීම
තෑගි රීති පිළිබඳ ප්‍රතිපාදන
බැඳියාවන් අතර ගැටුම පිළිබඳව රීති
සුපිළිපන්භාවයට අදාළව ආයතන සංග්‍රහයේ පවත්නා ප්‍රතිපාදන
දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම

**පස්වැනි සැසිය - දූෂණ අවධානම් තත්ත්වයන් හඳුනා ගැනීම** 29

**සමාප්ති සැසිය** 31
Power Point **ඉදිරිපත් කිරීම් සහ අත්පත්‍රිකා** 33

**ඇමිණුම්** 71
වැඩසටහන් න්‍යාය පත්‍රය (ආකෘතිය)
වැඩමුළුව පිළිබඳව වාර්තාව
ඇගයීම් පත්‍රය

1

# පිවිසුම් දොරටුව

## 1.1 පසුබිම

ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා ජාතික සැලැස්මක් සැකසීමට 2017-ඔක්තෝබර් 24 වැනිදින කැබිනට් අනුමැතිය හිමිවූ අතර ඒ අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වය සහිතව සකස් කළ ජාතික සැලැස්මට 2019 පෙබරවාරි 05 වන දා කැබිනට් අනුමැතිය හිමිවිය. ඒ අනුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේද සහය ඇතිව 2019 මාර්තු 18 වැනිදා සිට එම ජාතික සැලැස්ම ක්‍රියාවට නැංවීම ඇරඹිණි.

දූෂණ විරෝධී සැලැස්මේ දෙවන උපාය මාර්ගය වන "සාරධර්ම පදනම් කරගත් අධ්‍යාපනය හා ප්‍රජාව සම්බන්ධ කරගැනීම" යටතේ "රාජ්‍ය අංශයේ දැනුම්වත්භාවය වැඩි කිරීම" ශීර්ෂය යටතේ රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීම පිළිබඳ වගකීමක්" අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඇත. එම වගකීම ඉටුකිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීම වෙනුවෙන් මෙම වැඩසටහන් මාලාව සැලසුම්කර ඇත.

**2 රාජ්‍ය අංශයේ දැනුම්වත්භාවය වැඩි කිරීම**
පුහුණු වැඩසටහන් සඳහා සුපිළිපන් මොඩියුල, මූලික වැඩසටහන් සඳහා සුපිළිපන් ආචාර ධර්ම, ය කියා පිළිබඳ දැනුම්වත් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් සඳහා අල්ලස්-දූෂණ පිළිබඳ ප්‍රශ්න ඇතුළත් කිරීම, අන්තර් ආයතන තරග හා අත්දැකීම් හුවමාරු වැඩසටහන් - ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලස්ම - 43 පිටුව

## 1.2 පුහුණු වැඩසටහනේ තේමාව

සුපිළිපන් ශ්‍රී ලංකාවක් (ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැළැක්වීම සහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්මේ තේමාව)

## 1.3 පුහුණු වැඩසටහන් මාලාවේ අරමුණු

1. රාජ්‍ය නිලධාරීන් තුළ දූෂණ විරෝධී ආකල්ප වර්ධනය කිරීම. (ආකල්ප වර්ධනය)
2. දූෂණය හා එහි ප්‍රතිවිපාක පිළිබඳව රාජ්‍ය නිලධාරීන්ට අවබෝධයක් ලබාදීම. (දැනුම වර්ධනය)
3. දූෂණය අවම කිරීමේ ක්‍රමවේද භාවිතය පිළිබඳව හැකියාවන් වර්ධනය කිරීම. (කුසලතා වර්ධනය)
4. එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතියේ (UNCAC) දූෂණ වැළැක්වීමේ පරිච්ඡේදයෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාළ රාජ්‍ය අංශයේ සියලු ආයතන සම්බන්ධ කරගනිමින් සහසම්බන්ධතාවයක් ඇති කිරීම.

## 1.4 සමස්ත පුහුණු වැඩසටහන් මාලාවේ ඉලක්ක

වසරක කාලයක් ඇතුළත සමස්ත රාජ්‍ය සේවකයින්ගෙන් හතරෙන් එකක් අල්ලස, දූෂණය හා සුපිළිපන්භාවය පිළිබඳව දැනුම්වත් පිරිසක් බවට පත්කිරීම.

## 1.5 රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් මාලාව

දූෂණ විරෝධී ඒක්දින පුහුණු වැඩමුළුවක් පැවැත්වීම පිළිබඳව පළාත් මට්ටමින්/අමාත්‍යාංශ හා ස්වාධීන කොමිෂන් සභා නියෝජිතයින් වශයෙන් විධිමත්ව පුහුණුව ලැබූ පුහුණුකරුවන් 400 දෙනෙකු විසින් මෙම මාර්ගෝපදේශ සංග්‍රහය භාවිත කරමින් පුහුණු වැඩමුළු මාලාව සැලසුම්කර ක්‍රියාත්මක කරනු ලැබේ. එක් වැඩසටහනකට සහභාගී කරගනු ලබන නිලධාරීන් සංඛ්‍යාව 50 කි. ඒ අනුව සමස්ත පුහුණුකරුවන්ගේ සංචිතය විසින් එක් පුහුණුකරුවෙකු පුහුණු වැඩසටහන් 20 බැගින් වනසේ වැඩසටහන් 8000 ක් පවත්වා රාජ්‍ය නිලධාරීන් 400000ක් වෙත දූෂණ විරෝධය සහ සුපිළිපන්භාවයේ වටිනාකම පිළිබඳ දැනුම හා පුහුණුව ලබාදීමට අපේක්ෂා කෙරේ.

## 1.6 පුහුණු වැඩසටහන සඳහා සහභාගිවන්නන් තෝරාගැනීම

අදාළ ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශය අනුව පුහුණු වැඩසටහනට සහභාගි වීමට උනන්දුවක් දක්වන ඕනෑම තරාතිරමක රාජ්‍ය නිලධාරියෙකු/නිලධාරිනියක පුහුණු වැඩසටහන සඳහා සහභාගී කරගැනීමට සුදුසුකම් ලබයි.

## 1.7 පුහුණු වැඩසටහනේ පුහුණුකරුවන්/සම්පත්දායකයින්

පුහුණු වැඩසටහන සඳහා පුහුණුකරුවන්/සම්පත්දායකයින් තෝරාගැනීමේදී ඔහුගේ/ඇයගේ දැනුම්වත්භාවය සහ පුහුණුකරුවෙකු වශයෙන් කටයුතු කිරීමේ හැකියාව සේම රාජකාරී ජීවිතය තුළ සුපිළිපන්භාවය සම්බන්ධයෙන් ඉහළ පිළිගැනීමක් සහිත නිලධාරියෙකු වීම යන කාරණය කෙරෙහිද විශේෂ අවධානයක් යොමු කිරීම වැදගත්ය. ඔවුන් දූෂණ විරෝධී පුහුණුකරුවන් පුහුණු කිරීමේ තෙදින වැඩමුළුවට (TOT) සහභාගීවී එම පුහුණුව සාර්ථකව නිමකළ පුහුණුකරුවෙකු විය යුතුය. එක් වැඩමුළුවකට පුහුණුකරුවන් දෙදෙනෙකුවක් සහභාගී වීම සුදුසුය.

පුහුණු වැඩසටහන සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ (CIABOC) නිලධාරීන් මෙන්ම කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන එම විෂය පිළිබඳ පුළුල් අවබෝධයක් ඇති සුපිළිපන්භාවයකින් යුත් වෙනත් පුහුණුකරුවන්ද අවශ්‍යතාව අනුව සහභාගී කරගත හැකිය.

## 1.8 පුහුණු වැඩසටහන් ඇගයීම

සෑම පුහුණු වැඩසටහනක්ම ඇගයීමට ලක්කළ යුතුය. සහභාගීවන්නන් වෙත ලබාදෙන ඇගයීම් පත්‍රයක් මගින් එය සිදුකළ හැකිය. පුහුණු වැඩසටහන පිළිබඳ කෙටි වාර්තාවක්ද සමග එම ඇගයීමේ අවසන් ප්‍රතිඵල අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (CIABOC) වෙතද එවීමට පුහුණුකරුවන් වගබලාගත යුතුය. (74 වන පිටුවේ සඳහන් ඇමිණුම-02 බලන්න)

## 1.9 පුහුණු වැඩසටහන් මෙහෙයවීම හා සම්බන්ධීකරණය

දූෂණ විරෝධී පුහුණුකරුවන් පුහුණු කිරීමේ තෙදින වැඩමුළුව සාර්ථකව නිමකළ පුහුණුකරුවෙකුට, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිවාරණ අංශයේ මාර්ගෝපදේශ මත අදාළ රාජ්‍ය ආයතනය සමග ඍජුව සම්බන්ධවී පුහුණු වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කළ හැකිය.

2

# මාර්ගෝපදේශ සංග්‍රහය හැඳින්වීම

## 2.1 හැඳින්වීම

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් දීප ව්‍යාප්තව සංවිධානය කරනු ලබන, අල්ලස-දූෂණය පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවේ පුහුණුකරුවන්/සම්පත්දායකයින් වශයෙන් සහභාගීවන පුහුණුකරුවන්ගේ භාවිතය සඳහා මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සම්පාදනය කර ඇත.

## 2.2 මාර්ගෝපදේශ සංග්‍රහය නිර්මාණය කිරීම

මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සැකසීම සඳහා අවශ්‍ය මූලික තොරතුරු සම්පාදනය කරගන්නා ලද්දේ 2019 අගෝස්තු 23, 24, 25 යන දිනවල මීගමුවේදී පැවැති දූෂණ විරෝධී පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව සඳහා සහභාගී වූ පුහුණුලාභීන් එහිදී ඉදිරිපත් කරන ලද අදහස් හා යෝජනා ඇසුරිණි.

එම යෝජනා අනුව මූලික වශයෙන් සැසි සැලැස්ම සකස්කළ අතර පසුව විෂය විශේෂඥයින්ගේ අදහස් හා යෝජනා ලබාගනිමින් මෙම මාර්ගෝපදේශ සංග්‍රහය නිර්මාණය කර ඇත. එම මාර්ගෝපදේශ සංග්‍රහය 2020 පෙබරවාරි 16, 17, 18 යන දිනවල වස්කඩුවේ පැවැති බස්නාහිර පළාත් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන සඳහා භාවිත කරමින් පරීක්ෂාවට ලක්කිරීමෙන් අනතුරුව තවදුරටත් කරුණු ඇතුළත් කරමින් හා අවසන් වශයෙන් සංස්කරණයට ලක්කරමින් මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සම්පාදනය කර තිබේ.

## 2.3 අන්තර්ගතය

එක්දින පුහුණු වැඩමුළුවේ සැසි සැලැස්ම, පුහුණුකරුවන් හා සංවිධායකයින් සඳහා අවශ්‍ය මඟ පෙන්වීම්, පුහුණු වැඩසටහන තුළදී පුහුණුලාභීන්ට ලබාදෙන අත් පත්‍රිකා, ලිපි ලේඛන හා වෙනත් මුද්‍රිත ද්‍රව්‍ය පිළිබඳ තොරතුරුද, පුහුණු වැඩසටහන ඇගයීම සඳහා ඇගයුම් ආකෘතියකින්ද මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සමන්විතය. සහභාගිවන්නන්ගේ තරාතිරම අනුව පුහුණුකරුවන්ට, පුහුණු වැඩසටහනේ වෙනස්කම් සිදුකරගැනීමට අවශ්‍යනම් ඒ සඳහා සුදුසු මාර්ගෝපදේශයන්ද මෙයට ඇතුළත්කර තිබේ.

## 2.4 පුහුණු ක්‍රමවේද

රාජ්‍ය නිලධාරීන් සඳහා දූෂණ විරෝධී පුහුණු වැඩසටහන් පැවැත්වීම පිළිබඳව මූලික පුහුණුවක් ලැබූ අයෙකුට පරිශීලනය කළහැකි ආකාරයට මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සැලසුම් කර තිබේ. වැඩමුළුව සඳහා බාහිර පුද්ගලයින් සම්බන්ධ කරගැනීමට සිදුවන අවස්ථාවකදී ඔවුන්ට මූලික මාර්ගෝපදේශයක් ලබාදීම අත්‍යාවශ්‍ය වන අතර එම බාහිර පුද්ගලයා ආරාධිත දේශකවරයෙකු/සම්පත්දායකයෙකු ලෙස හඳුන්වාදීම වඩාත් සුදුසුය.

පුහුණු සැසි සඳහා මාර්ගෝපදේශ සංග්‍රහය තුළ සඳහන් පුහුණු ක්‍රමවේදයන් භාවිත කළ යුතු අතර ඒ සඳහා පුහුණුකරු තුළ පූර්ව සූදානමක් පැවැතීම අත්‍යාවශ්‍ය වේ.

## 2.5 පුහුණුලාභීන්

පුහුණුලාභීන් වශයෙන් රාජ්‍ය සේවය තුළ ඕනෑම තරාතිරමක පුද්ගලයින් පුහුණු කිරීම සඳහා මෙම මාර්ගෝපදේශ සංග්‍රහය භාවිත කළ හැකිය. එහෙත් සහභාගීවන්නන්ගේ තරාතිරම, කවර භාෂා මාධ්‍යයන්ගෙන් වැඩකරන පුද්ගලයින්ද යනවග ආදී තොරතුරු පූර්වයෙන් දැනගෙන ඒ අනුව සුදුසු අත් පත්‍රිකා සහ ලිපි ලේඛන සූදානම් කරගැනීම කෙරෙහි පුහුණුකරුවන් අවධානය යොමු කළ යුතුය. පවර් පොයින්ට් ඉදිරිපත් කිරීම් සහ පැහැදිළි කිරීම් වලදීද සහභාගීවන්නන්ගේ මට්ටම පිළිබඳව සැළකිලිමත් වියයුතු අතර ඒ අනුව ඒවා සුදුසු පරිදි සංස්කරණය කරගැනීම කෙරෙහි පුහුණුකරුවන්ගේ අවධානය යොමු කළ යුතුය.

3

# පුහුණු මෙවලම් සහ සම්පත්

## 3.1 හැඳින්වීම

මෙම පුහුණු මොඩියුලය සම්පාදනය කර ඇත්තේ රාජ්‍ය නිලධාරීන් සඳහා එක්දින පුහුණු වැඩසටහනකට ගැලපෙන අයුරිණි. එක් දිනක් තුළ අල්ලස හා දූෂණයට අදාළ විෂය කරුණු සියල්ල ආවරණය කිරීමේදී මුහුණ දීමට සිදුවන දුෂ්කරභාවය සලකා වැඩමුළුව තුළදී සහභාගීවන්නන්ට මූලික අවබෝධයක් ලබාදී, වැඩිදුර දැනුම්වත්භාවය සඳහා කියවීමට අවශ්‍ය තොරතුරු අත් පත්‍රිකා ලෙස මෙම මොඩියුලයට ඇතුළත්කර තිබේ. එසේම පුහුණුකරුවන්ගේ පරිශීලනයට අවශ්‍ය මෙවලම් සහ සම්පත්වල ලේඛනයක්ද, ඒ ඒ අවස්ථාවලදී ක්‍රියාකළයුතු ආකාරය පිළිබඳව මාර්ගෝපදේශද මෙම මොඩියුලයට ඇතුළත්ය. මෙම මොඩියුලය මගින් සාකච්ඡා කරන විෂයයන්ට අදාළව පුහුණුකරුවන්ගේ දැනුම්වත්භාවය වැඩිදුරටත් වර්ධනය කර ගැනීම සඳහා පුහුණුකරුවන් සඳහා සම්පාදිත සම්පත් අත්පොත පරිශීලන කරනු ඇතැයිද අපේක්ෂා කෙරේ. පුහුණු වැඩසටහනේදී භාවිත කරන PPT, වීඩියෝ සහ සෙසු උපාංග පුහුණු මොඩියුලය සමඟ මෘදු පිටපත් ලෙස පෙන්ඩ්‍රයිව් එකක් මගින් සපයා ඇත.

මෙම පුහුණු මෙවලම් සහ සම්පත් කට්ටලය ප්‍රධාන වශයෙන් කොටස් 2 කින් සමන්විතය.

1. වැඩසටහනේදී පුහුණුකරුවන්ගේ පරිශීලනය සඳහා අවශ්‍ය මෙවලම් හා සම්පත් (උදා-PPT, වීඩියෝ, අත්පොත් ආදිය)
2. පුහුණුව ලබන රාජ්‍ය නිලධාරීන්ට බෙදාදීම සඳහා අවශ්‍ය ලේඛන (උදා-අත් පත්‍රිකා)

## 3.2 පුහුණු මෙවලම් සහ සම්පත් කට්ටලයේ අන්තර්ගතය

### 3.2.1 පුහුණුකරුවන්ගේ පරිශීලනය සඳහා අවශ්‍ය මෙවලම් හා සම්පත්

1. 1954 අංක 11 දරන අල්ලස් පනත
2. 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත
3. 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත
4. ආයතන සංග්‍රහය
5. දූෂණ වැළැක්වීමේ ජාතික සැලැස්ම සම්බන්ධ ජනාධිපති ලේකම් චක්‍රලේඛ

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ප්‍රකාශන**

1. ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම
2. සුපිළිපන් අත්පොත
3. තෑගි රීති අත්පොත
4. බැඳියාවන් අතර ගැටුම් පිළිබඳ රීති අත්පොත
5. නෛතික සංශෝධන සඳහා වන යෝජිත ප්‍රතිපත්ති (අත්පොත-4)
6. සුපිළිපන් පුහුණුකරුවන් සඳහා සම්පත් අත්පොත

### කෙටි වීඩියෝපට

1. ගෙදර යමු සුපිළිපන් හදවතින් (ගීතය)
2. ජාත්‍යන්තර දූෂණ විරෝධී දින ක්‍රියාකාරකම් -වීඩියෝපට
3. අල්ලස ඔබට ඔබම කරගන්නා අපහාසයකි.
4. දූෂණයේ දම්වැල බිඳදමමු.

### එක්දින පුහුණු වැඩසටහන සඳහා අවශ්‍ය ලේඛන හා මෙවලම්

1. පුහුණු වැඩසටහනේ න්‍යාය පත්‍රය (ඇමිණුම 01 බලන්න)
2. පුහුණු වැඩසටහනේ ඇගයීම්පත්‍රය (ඇමිණුම 02 බලන්න)
3. සහභාගිවන්නන් ලියාපදිංචි කිරීමේ ලේඛන
4. පුහුණු වැඩසටහන පිළිබඳව වාර්තා කිරීමේ ආකෘතිය (ඇමිණුම 03)
5. අත් පත්‍රිකා
6. Power Point Presentations (PPT)

### 3.2.2 සහභාගීවන්නන්ට බෙදාදීම සඳහා අවශ්‍ය ලේඛන /ද්‍රව්‍ය

1. අත් පත්‍රිකා අංක 01 - දූෂණය යනු කුමක්ද?
2. අත් පත්‍රිකා අංක 02 - දූෂණයේ විවිධ ස්වරූප
3. අත් පත්‍රිකා අංක 03 - දූෂණයේ ප්‍රතිවිපාක
4. අත් පත්‍රිකා අංක 04 - දූෂණයට වැට බඳින නීති රීති
5. අත් පත්‍රිකා අංක 05 - සුපිළිපන්භාවය යනු කුමක්ද?
6. අත් පත්‍රිකා අංක 06 - දූෂණය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම
7. CIABOC ස්ටිකර් / අත් පත්‍රිකා

4

# පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම

## 4.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවෙන් අල්ලස හා දූෂණය තුරන් කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා අල්ලස හා දූෂණය පිළිබඳව රාජ්‍ය නිලධාරීන් තුළ දැනුම්වත්භාවයක් ඇතිකිරීම "දූෂණ විරෝධී එක්දින පුහුණු වැඩසටහන් මාලාවේ" ප්‍රධාන අරමුණයි. සම්පත්දායකයින්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව යටතේ පුහුණුව ලැබූ පුහුණුකරුවන් වශයෙන් වැඩසටහන් සංවිධානය කරන බැවින් ඒවා ඉතා හොඳින් සැලසුම් සහගතව සිදුකිරීම පිළිබව අවධානය යොමු කළ යුතුය.

## 4.2 පුහුණු වැඩසටහනේ ශාලා පහසුකම්

පුහුණු වැඩසටහනක් සඳහා 50 දෙනෙකු සහභාගී කරවාගැනීමට අපේක්ෂා කරන බැවින් ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිත ශාලාවක් තෝරාගත යුතුය. ඇතැම් ශාලා මධ්‍යයේ කණු පවතින බැවින් සියලු දෙනාට බාධාවකින් තොරව පුහුණුකරු සහ ප්‍රක්ෂේපණ තිරය පෙනෙන සේ ශාලාව සකස්කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්ය. ශාලාව සැකසීමේදී සහභාගීවන්නන්ට කුඩා කණ්ඩායම් වශයෙන් අසුන් ගතහැකි ආකෘතියක් භාවිතා කිරීම වැඩසටහනට පහසුවකි.

## 4.3 පුහුණු කාර්ය මණ්ඩලය

පුහුණු කාර්ය මණ්ඩලය පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතුය.

### 4.3.1 වැඩසටහන් සංවිධායක/පහසුකාරක

වැඩසටහන පවත්වන ආයතනයේ නිලධාරියෙකු එක්දින පුහුණු වැඩසටහනේ වැඩසටහන් සංවිධායක/පහසුකාරක වශයෙන් පත්කරගත යුතුය. වැඩසටහනට සහභාගීවන්නන්ට ඇරියුම් කිරීමේ සිට ශාලා පහසුකම් සැලසීම, ආහාර-තේ සැපයීම් පිළිබඳව සොයාබැලීම, පුහුණුකරුවන් සමඟ සම්බන්ධීකරණ කටයුතු, පුහුණු උපකරණ සූදානම් කරගැනීම, අත් පත්‍රිකා මුද්‍රණය කරගැනීම ආදී සියලු කටයුතුවල ප්‍රධාන වගකීම පැවැරෙන්නේ වැඩසටහන් සංවිධායක/පහසුකාරක වෙතය..

සහභාගිවන්නන් පිළිගැනීම, පුහුණු වැඩසටහනේ අරමුණු පැහැදිලි කිරීම සහ සම්පත්දායකයින්/පුහුණුකරුවන් හඳුන්වාදීමද වැඩසටහන් සංවිධායක/පහසුකාරක වෙත පැවැරෙන බැවින් ඒ සඳහා සූදානමකින් සිටීම වැදගත්ය. සම්පත්දායකයින්/පුහුණුකරුවන් හඳුන්වාදීම සඳහා PPT slide එකක් භාවිත කිරීම වඩාත් සුදුසුය. මෙම වැඩසටහන් සංවිධායක/පහසුකාරක දූෂණ විරෝධී වැඩසටහන් මෙහෙයවීම පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව CIABOC යටතේ පුහුණුව ලැබූ පුහුණුකරුවෙකු නොවන බැවින් ඔහුට හෝ ඇයට අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම සම්පත්දායකයින්/පුහුණුකරුවන් විසින් සිදුකළ යුතුය.

#### 4.3.2 සම්පත්දායකයින් /පුහුණුකරුවන්

එක්දින පුහුණු වැඩසටහනේ සම්පත්දායකයින්/පුහුණුකරුවන් දෙදෙනාම CIABOC යටතේ දූෂණ විරෝධී වැඩසටහන් පැවැත්වීම ගැන පුහුණුකරුවෙකු වශයෙන් පුහුණුව ලැබූ අයෙකු විය යුතුය. ඊට අතිරේකව අවශ්‍යතාවය මත CIABOC නිලධාරීන්ද සම්පත්දායකයින්/පුහුණුකරුවන් වශයෙන් සහභාගී කරගත හැකිය.

#### 4.3.3 සහය පුහුණුකරුවන්

සම්පත්දායකයින්/පුහුණුකරුවන්ට අවශ්‍යයැයි හැඟෙන්නේනම් පුහුණුකරුවන්ට සහය වීම සඳහා සහය පුහුණුකරුවෙකු සම්බන්ධ කරගත හැකිය.

## 4.4 සහභාගීවන්නන්ට ලබාදිය යුතු ලිපිලේඛන

සහභාගීවන්නන් පුහුණු වැඩසටහනට පැමිණ ලියාපදිංචි වන අවස්ථාවේදීම පහත ලිපිලේඛන ලබාදිය යුතුය.

1. වැඩසටහන පිළිබඳ න්‍යාය පත්‍රය (ඇමිණුම 01)
2. සහභාගිවන්නන්ගේ තොරතුරු ලබාගැනීමේ ආකෘතිය
3. CIABOC ප්‍රකාශන කට්ටලය
4. සටහන් පොත
5. පෑන

අත් පත්‍රිකා සූදානම් කර තබාගෙන ඒ ඒ සැසි අවසානයේදී බෙදාදෙන්න.

## 4.5 සුපරීක්ෂක ලැයිස්තුව

| කාර්යය | වගකීම |
|---|---|
| 1. පුහුණු වැඩසටහන පිළිබඳ මූලික සාකච්ඡාව | ☐ |
| 2. පුහුණු වැඩසටහන සඳහා දින වෙන්කර ගැනීම හා වැඩසටහන් සංවිධායක/පහසුකාරක පත්කර ගැනීම. | ☐ |
| 3. පුහුණු පරිශ්‍ර වෙන්කර ගැනීම. | ☐ |
| 4. පුහුණුකරුවන්/සම්පත්දායකයින් ස්ථිර කරගැනීම. | ☐ |
| 5. පුහුණුවන්නන් කණ්ඩායම තෝරාගැනීම හා ඔවුන්ට දැනුම්දීම. | ☐ |
| 6. පුහුණු ද්‍රව්‍ය හා උපකරණ කට්ටල සූදානම් කරගැනීම. | ☐ |

## 4.6 පුහුණු වැඩසටහන සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ

| | |
|---|---|
| 1. ෆයිල් කවර | 55 |
| 2. සටහන් පොත් | 55 |
| 3. පෑන් | 55 |
| 4. පර්මනන්ට් මාකර් පෑන් | 10 |
| 5. වයිට්බෝඩ් මාකර් පෑන් | 03 |
| 6. ස්ටෙප්ලර් කටු පැකට් | 01 |
| 7. ස්ටෙප්ලර් මැෂින් | 01 |
| 8. සෙලෝටේප් | 01 |
| 9. බ්ලූටැග් | 01 |
| 10. Flip Chart කඩදාසි | 25 |
| 11. Flip Chart පුවරුව | |
| 12. ප්ලෑෂ් කාඩ් | 50 |
| 13. ප්‍රක්ෂේපණ තිරයක් සමඟ ප්‍රොජෙක්ටරය | |
| 14. Extension code | |

5

# රාජ්‍ය නිලධාරීන් සඳහා දූෂණ විරෝධී එක්දින පුහුණු වැඩසටහන

## සැසි සැලැස්ම හා අන්තර්ගතය

| කාලය | සැසිය | අන්තර්ගතය | පුහුණුකරු සඳහා මාර්ගෝපදේශ | පුහුණු ක්‍රමවේද | සහභාගීවන්නන්ට ලබාදිය යුතු අත් පත්‍රිකා සහ මෙවලම් |
|---|---|---|---|---|---|
| 9.00 - 9.30 | සමාරම්භක සැසිය | පිළිගැනීම හා අරමුණ පැහැදිළි කිරීම<br><br>සම්පත්දායකයින් හඳුන්වාදීම<br><br>ආයතන ප්‍රධානියාගේ කථාව | අත්සන් ලේඛනය න්‍යාය පත්‍රය සූදානම්දැයි පරීක්ෂාකර බලන්න | | එක්දින වැඩසටහනේ න්‍යාය පත්‍රය |
| 9.30 - 10.30 | දූෂණය හඳුනාගැනීම<br><br>දූෂණයට එරෙහි ජාත්‍යන්තරය | දූෂණය යනු කුමක්ද?<br><br>දූෂණයේ විවිධ ස්වරූපයන්<br><br>දූෂණය නිසා අහිමිවන ජාතික ධනය සහ එහි ප්‍රතිවිපාක<br><br>දූෂණයට එරෙහි ගෝලීය පෙළගැස්ම<br><br>දූෂණය ජය ගැනීම: හොංකොං ආදර්ශය | (PPT-01)/(PPT-02)/(PPT- 03) භාවිත කරන්න.<br><br>පුහුණුකරුවන් සඳහා සම්පත් අත්පොත් දෙවන පරිච්ඡේදය කියවන්න. (පිටු අංක 26-39)<br><br>සම්පත් අත්පොත (පිටු අංක 45-53 කියවන්න)<br><br>(PPT-04) සම්පත් අත්පොත (පිටුව 54) | ▪ Power Point ඉදිරිපත් කිරීම්<br><br>▪ සාකච්ඡා<br><br>▪ වීඩියෝ දර්ශන<br><br>▪ කුඩා කණ්ඩායම් සාකච්ඡා | දූෂණය යනු කුමක්ද? (අත් පත්‍රිකා-අංක 01)<br><br>දූෂණයේ විවිධ ස්වරූප හඳුනාගැනීම සඳහා ප්‍රශ්නාවලිය<br><br>දූෂණයේ විවිධ ස්වරූප (අත් පත්‍රිකා-අංක 02)<br><br>දූෂණයේ ප්‍රතිවිපාක (අත් පත්‍රිකා-අංක 03)<br><br>දූෂණයේ ප්‍රතිවිපාක-වීඩියෝ |
| 10.30-11.00 | | තේ පානය | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11.00-12.30 | දූෂණයට එරෙහි ශ්‍රී ලාංකික පෙළගැස්ම | දූෂණයට වැට බඳින නීතිරීති (PPT-05)<br><br>අල්ලස් කොමිසමේ බලතල හා කාර්යභාරය (PPT-06) | වැඩිදුර කියැවීම් සඳහා සම්පත් අත්පොත (පිටුව 57-67)<br><br>වැඩිදුර කියැවීම් සඳහා සම්පත් අත්පොත (පිටුව 68-73) | ■ Power Point ඉදිරිපත් කිරීම්<br>■ සාකච්ඡා<br>■ වීඩියෝ දර්ශන | දූෂණයට වැටබඳින නීතිරීති (අත් පත්‍රිකා-අංක 04) |
| **12.30-13.30** | | **දිවා ආහාරය** | | | |
| 13.30-14.30 | දූෂණය පිටුදැකීමේ ශ්‍රී ලාංකික සැලසුම් | සුපිළිපන් රාජ්‍ය සේවකයා සතු හරයාත්මක භාවිතාව<br><br>සුපිළිපන්භාවය හඳුනාගැනීම<br><br>බැඳියාවන් අතර ගැටුම් පිළිබඳව රීති<br><br>තෑගි රීති පිළිබඳ ප්‍රතිපාදන<br><br>සුපිළිපන්භාවයට අදාළව ආයතන සංග්‍රහයේ පවත්නා ප්‍රතිපාදන<br><br>දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම | සුපිළිපන්භාවය යනු කුමක්ද? (PPT-07)<br><br>බැඳියාවන් අතර ගැටුම් පිළිබඳව රීති (PPT-08)<br><br>තෑගි රීති යනු කුමක්ද? (PPT-09)<br><br>වැඩිදුර කියැවීම් සඳහා සම්පත් අත්පොත (පිටුව 81-88) | බැඳියාවන් අතර ගැටුම හා තෑගි රීතිවලට අදාළ සිදුවීම් පිළිබඳව සාකච්ඡා කරමින් ඒ පිළිබඳ සංවාදයක් ඇති කිරීම | සුපිළිපන්භාවය යනු කුමක්ද? (අත් පත්‍රිකා-අංක 05)<br><br>බැඳියාවන් අතර ගැටුම පිළිබඳ රීති - මුද්‍රිත අත්පත්‍රිකාව<br><br>තෑගි රීති පිළිබඳ ප්‍රතිපාදන - මුද්‍රිත අත් පත්‍රිකාව<br><br>දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම (සංක්ෂිප්ත) (අත් පත්‍රිකා-අංක 06) |
| 14.30-15.30 | ආයතන තුළ පවත්නා දූෂණ අවධානම් හඳුනාගැනීම | අල්ලස හා දූෂණය පිටුදැකීම සඳහා ආයතනික ක්‍රියාකාරී සැලසුම් සැකසීම | **කණ්ඩායම් ක්‍රියාකාරකම**<br>ඔබගේ ආයතනය තුළ අල්ලස් හෝ දූෂණ අවධානම් පවත්නා අංශ මොනවාද?<br><br>එයින් වඩාත්ම අවධානම් සහගත අංශ 4 ක් හඳුනාගනිමින් එම අංශවල පවත්නා අවධානම විස්තර කරන්න<br><br>වැඩිදුර සඳහා සම්පත් අත්පොත (89-97 පිටු) | කණ්ඩායම් සාකච්ඡාව හා ඉදිරිපත් කිරීම | |
| 15.30-16.00 | සමාප්ති සැසිය | පුහුණුව ලැබූවන්ගේ ප්‍රතිචාර,ඇගයීම සහ ස්තුතිය | | | ඇගයීම් පත්‍රිකා (ඇමිණුම-02) |
| **16.00-16.30** | | **තේ පානය හා විසිරයාම** | | | |

# පළමු සැසිය

## වැඩසටහන හඳුන්වාදීම හා සමායෝජනය

(කාලය - මිනිත්තු 30)
පෙ.ව 9.00 සිට පෙ.ව 9.30 දක්වා

## සැසියේ අරමුණු

- වැඩමුළුවේ අරමුණු පැහැදිළි කිරීම.
- පුහුණුකරුවන් හා සහභාගීවන්නන්ගේ අරමුණු අතර සමායෝජනයක් ඇති කිරීම.
- සමස්ත වැඩමුළුව සඳහා හිතකර පසුබිමක් සකසා ගැනීම.

## සැසියේ අන්තර්ගතය

- පිළිගැනීම හා අරමුණ පැහැදිළි කිරීම.
- සම්පත්දායකයින් හඳුන්වාදීම.
- සහභාගිවන්නන් හඳුනාගැනීම.
- පුහුණු වැඩසටහන සම්බන්ධ එකඟතා ඇතිකර ගැනීම.

### සැසි සූදානම සඳහා උපදෙස්

සමාරම්භක සැසියට පෙර පුහුණුවන්නන් ලියාපදිංචි කිරීම සහ ඔවුන්ට පුහුණුවට අදාළ කළමනා සැපයීම සිදුකළ යුතුය. සහභාගීවන්නන් ශාලාව වෙත පැමිණෙන විට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ (CIABOC) ප්‍රවර්ධන වැඩසටහන් සහ දූෂණ නිවාරණ ක්‍රියාකාරකම් පිළිබඳ ඡායාරූප එකතුවක් හෝ CIABOC ක්‍රියාකාරකම් පිළිබඳ වීඩියෝවක් තිරයේ දිස්වන්නට සැළැස්විය හැකිය.

(උදා-දෙසැ.09 දූෂණ විරෝධී දින වැඩසටහනේ හෝ දූෂණ නිවාරණ වැඩසටහන්වල ඡායාරූප එකතුවක්/වීඩියෝවක්)

සමාරම්භක සැසිය මෙහෙයවීම - වැඩසටහනේ සංවිධායක විසින් සිදුකරනු ලැබේ.

## පියවර 1

**පිළිගැනීම, අරමුණ පැහැදිළි කිරීම**

කාලය විනාඩි - 07 (පෙ.ව 9.00-9.07)

**වැඩසටහන් සංවිධායක/පහසුකාරක සඳහා සටහන**

වැඩසටහනේ සංවිධායක විසින් පිරිස පිළිගැනීම සිදුකරන්න. මෙම වැඩසටහන ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැලැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලසුම අනුව ක්‍රියාත්මකවන වැඩසටහනක් බවත්, වැඩමුළුවට සහභාගීවන සියලු දෙනා පුහුණුවෙන් පසු රාජ්‍ය නිලධාරීන්ගේ දූෂණ විරෝධී ජාලයට සම්බන්ධ වන බවත් අරමුණ පැහැදිළි කිරීමේදී සන්නිවේදනය කිරීම වැදගත්ය.

## පියවර 2

**සම්පත්දායකයින් හඳුන්වාදීම.**

කාලය විනාඩි - 03 (පෙ.ව 9.07-9.10)

**වැඩසටහන් සංවිධායක/පහසුකාරක සඳහා සටහන**

සම්පත්දායකයින්/පුහුණුකරුවන් හඳුන්වා දෙන්න. හඳුන්වාදීම සිදුකරණ අවස්ථාවේ පුහුණුකරුවන්ගේ ඡායාරූපයක් සහ විස්තර සහිත Power Point Slide එකක් ප්‍රක්ෂේපණ තිරයේ දිස්වන්නට සලස්වන්න. සම්පත්දායකයින්/පුහුණුකරුවන්ගේ වෘත්තීය පසුබිම, විෂයයට අදාළ උසස් අධ්‍යාපන සුදුසුකම්/ක්ෂේත්‍රයට සිදුකරන ලද මෙහෙය ඊට ඇතුළත් කළ හැකිය.

හඳුන්වාදීම අවසානයේ සම්පත්දායකයින්ට සැසිය සඳහා ඇරියුම් කරන්න.

## පියවර 3

**ආයතන ප්‍රධානී හෝ විශේෂ ආරාධිතවරයාගේ කෙටි අදහස් දැක්වීම.**

කාලය විනාඩි - 10 (පෙ.ව 9.10-9.20)

**වැඩසටහන් පහසුකාරක සහ පුහුණුකරු සඳහා සටහන**

ආයතන ප්‍රධානී හෝ විශේෂ ආරාධිතවරයාට මාතෘකාවක් ලබාදියයුතු නම්, සුපිළිපන් රාජ්‍ය සේවයක් කරා යන ගමනේදී රාජ්‍ය නිලධාරීන් වෙත පැවැරෙන වගකීම වැනි මාතෘකාවක් ලබාදිය හැකිය.

## පියවර 4

**සහභාගීවන්නන් හඳුනාගැනීම.**

කාලය විනාඩි - 10 (පෙ.ව 9.20-9.30)

**වැඩසටහන් පහසුකාරක සහ පුහුණුකරු සඳහා සටහන**

සහභාගීවන්නන් සියලුදෙනා හඳුනාගැනීම වැදගත් නමුත් 50 දෙනෙකුගේ කණ්ඩායමක් හඳුනා ගැනීමට සැලකියයුතු කාලයක් ගතවේ. එබැවින් අවිධිමත් ලෙස පිරිස හඳුනාගනිමින් සහභාගිවන්නන් පිළිබඳ යම් අදහසක් ඇතිකර ගැනීමටත්, පුහුණුකරු සහ පුහුණුවන්නන් අතර පවත්නා දුරස්ථභාවය අවම කරගනිමින් මිත්‍රශීලී ප්‍රවේශයක් ඇතිකර ගැනීමටත් මෙම කෙටි වේලාව පාවිච්චි කරන්න.

පුහුණු වැඩසටහන තුළ සහභාගිවන්නන් කටයුතු කළ යුත්තේ කෙසේද? යන්න පිළිබඳව එකඟතා (Ground rule) ඇතිකර ගැනීමද මෙම අවස්ථාවේම සිදුකළ හැකිය.

# දෙවන සැසිය

## දූෂණය හඳුනාගැනීම

(කාලය - පැය 01 යි)
පෙ.ව 9.30 සිට පෙ.ව 10.30 දක්වා

### සැසියේ අරමුණු

- දූෂණය යනු කුමක්දැයි? විවිධ නිර්වචන ඇසුරින් අවබෝධ කිරීම.
- දූෂණයේ විවිධ ස්වරූපයන් පිළිබඳව අවබෝධයක් ලබාදීම.
- දූෂණය නිසා අහිමිවන ජාතික ධනය සහ එහි ප්‍රතිවිපාක
- දූෂණයට එරෙහි ගෝලීය පෙළගැස්ම හා දූෂණය ජයගැනීම පිළිබඳ නිදර්ශන ගැන අවබෝධයක් ලබාදීම.

### සැසියේ අන්තර්ගතය

- දූෂණය යනු කුමක්ද? - විවිධ නිර්වචන/නීතිමය නිර්වචන ඇසුරින් පැහැදිළි කිරීම.
- දූෂණයේ විවිධ ප්‍රභේද සහ ස්වරූපයන් තේරුම් ගැනීමට සැලසීම.
- දූෂණය නිසා අහිමිවන ජාතික ධනය සහ දූෂණයට එරෙහි ගෝලීය පෙළගැස්ම පිළිබඳව සාකච්ඡා කිරීම.
- දූෂණය ජයගැනීම පිළිබඳ හොං කොං ආදර්ශය පැහැදිළි කිරීම.

#### සැසි සූදානම සඳහා උපදෙස්

සම්පත්දායකයින්/පුහුණුකරුවන් සැසිය මෙහෙයවන අතර සංවිධායක/පහසුකාරක හෝ සහය පුහුණුකරුට කාල කළමනාකරණය සඳහා සහය විය හැකිය. සැසියේ අවසන් විනාඩි 15/10/5 සන්නිවේදනය කිරීම සඳහා Card පත්‍රයක් පෙන්වා සංඥා කිරීම හෝ වෙනත් සුදුසු ක්‍රමවේදයක් පිළිබඳව එකඟතාවයකට එළඹෙන්න.

සැසිය අතරතුර සම්පත්දායකයින්ට යම් සහයක් අවශ්‍යනම් පහසුකාරක හෝ සහය පුහුණුකරු ඒ සඳහාද සූදානමින් සිටිය යුතුය.

මෙම සමස්ථ වැඩසටහනම ඉතා හොඳින් සැලසුම් කරන ලද සාමූහික කාර්යයක් බව සහභාගිවන්නන්ට ඒත්තු යන අයුරින් සෑම අංගයක් කෙරෙහිම අවධානය යොමු කිරීම වැදගත්ය.

## පියවර 1
### දූෂණය යනු කුමක්ද?
කාලය විනාඩි - 10 (පෙ.ව 9.30-9.40)

#### පුහුණුකරු සඳහා සටහන

PPT-01 භාවිත කරමින්, සහභාගිවන්නන් සමග බුද්ධි කලම්බන සාකච්ඡාවකට යමින් සැසිය අරඹන්න. "දූෂණය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? දූෂණය යන වචනය ඇසූ පමණින් මතකයට නැගෙන විවිධ දූෂණ වර්ග මොනවාද? දූෂණය සමාජයට හානිදායී වන්නේ ඇයි?" යනාදී සරල ප්‍රශ්න කිහිපයක් සහභාගීවන්නන් වෙත යොමුකරමින් PPT-01හි සඳහන් නිදර්ශන කෙරෙහි සහභාගීවන්නන්ගේ අවධානය යොමුකරවන්න. ඒවා දූෂණද? නැද්ද? යන්න විමසමින් සාකච්ඡාව ඇරඹිය හැකිය.

අවසානයේදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ (CIABOC) දූෂණය පිළිබඳ නිර්වචනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් එහි මූලිකාංග ගැන සාකච්ඡා කරන්න.

CIABOC නිලධාරියෙක් සහභාගීවන අවස්ථාවකදී මෙම සැසිය එම නිලධාරියාට පැවරිය හැකිය.

## පියවර 2
### දූෂණයේ විවිධ ප්‍රභේද සහ ස්වරූපයන්
කාලය විනාඩි - 20 (පෙ.ව 9.40-10.00)

#### සම්පත්දායක/පුහුණුකරු සඳහා සටහන

PPT-02 හි ප්‍රථම Slide ය පමණක් භාවිත කරමින් අල්ලස්-දූෂණ, වංචා-දූෂණ යන යුගල පද වලින් අදහස් වන්නේ දූෂණයේ එකම ස්වරූපයක්ද? නැතහොත් එයින් වෙන වෙන අර්ථ නිරූපනය වේදැයි? සහභාගීවන්නන් වෙත ප්‍රශ්නයක් යොමුකරවමින් බුද්ධි කළම්භනයක් සිදුකරන්න.

සහභාගිවන්නන්ට විවිධ ප්‍රතිචාර ලබාදීමට ඉඩ සලසාදී දූෂණය යන්නෙහි වඩාත් පුළුල් අර්ථයක් පවත්නා බවත් අල්ලස, වංචා යනු දූෂණයේ විවිධ ප්‍රභේද බවත් පැහැදිළි කරමින් සෙසු ප්‍රභේද විස්තර කිරීමට පෙර පියවර-3 වෙත යොමුවන්න.

## පියවර 3

#### සම්පත්දායක/පුහුණුකරු සඳහා සටහන

දූෂණයේ විවිධ ප්‍රභේදයන්ට නිදසුන් ලෙස ගතහැකි සිදුවීම් ඇතුළත් කෙටි ප්‍රශ්නාවලියක් (ඇමිණුම 01) ආවරණය කරන ලද කවරයක බහා, සහභාගීවන්නන් කණ්ඩායම් වශයෙන් අසුන්ගෙන සිටින මේස වෙත බෙදාදෙන්න. සැසිය අවසානයේ සියලුම කණ්ඩායම් වලින් එම ප්‍රශ්න වලට ප්‍රතිචාර අපේක්ෂා කරන බව දැනුම් දෙන්න.

අනතුරුව PPT-02 ඉතිරි Slide සාකච්ඡා කරන්න.

## පියවර 4

**දූෂණයේ විවිධ ප්‍රභේද සහ ස්වරූපයන් (කණ්ඩායම් ක්‍රියාකාරකම)**

කාලය විනාඩි - 10 (පෙ.ව 10.00-10.00)

### සම්පත්දායක/පුහුණුකරු සඳහා සටහන

දූෂණයේ විවිධ ස්වරූප (Hand out-2) අත් පත්‍රිකාවද කණ්ඩායම් වෙත බෙදාදී, කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කරමින් කෙටි ප්‍රශ්නාවලියට ප්‍රතිචාර ලබාදෙන ලෙස දැනුම් දෙන්න.

සියලු කණ්ඩායම් පිළිතුරු සැපයීමෙන් පසු එම පිළිතුරු සාකච්ඡා කරමින් දූෂණයේ විවිධ ස්වරූපයන් ගැන වැඩිදුරටත් පැහැදිළි කරන්න.

## පියවර 5

**දූෂණයේ බලපෑම සහ ප්‍රතිවිපාක**

කාලය විනාඩි - 10 (පෙ.ව 10.10-10.20)

### සම්පත්දායක/පුහුණුකරු සඳහා සටහන

දූෂණයේ බලපෑම සහ එහි ප්‍රතිවිපාක පිළිබඳව සහභාගීවන්නන්ගෙන් අදහස් විමසමින් සැසිය අරඹන්න. සාකච්ඡාවේදී දූෂණය පොදුවේ සමාජයට හානිදායී වනවා පමණක් නොව පෞද්ගලිකව තම තමන්ගේ ජීවිතවලටද අහිතකර ලෙස බලපාන බව සහභාගිවන්නන්ට ඒත්තු ගැන්වීමට උත්සාහ කරන්න.

## පියවර 6

### සම්පත්දායක/පුහුණුකරු සඳහා සටහන

අල්ලස ඔබට ඔබම කරගන්නා අපහාසයකි. කෙටි වීඩියෝ පටය ප්‍රදර්ශනය කරමින් ඒ ගැන සාකච්ඡා කරන්න.

## පියවර 7

### සම්පත්දායක/පුහුණුකරු සඳහා සටහන

දූෂණයේ හානිය පිළිබඳ දැක්වෙන කෙටි වීඩියෝ පටයක් (උදාඃශල්‍යකර්මය) ප්‍රදර්ශනය කරමින් එවැනි තත්ත්වයන් පැවැතීම නිසා රටකට, සමාජයකට සිදුවන හානිය සාකච්ඡා කරන්න.

## පියවර 8

### සම්පත්දායක/පුහුණුකරු සඳහා සටහන

PPT-03 භාවිත කරමින් දූෂණයේ බලපෑම සහ එහි ප්‍රතිවිපාක පිළිබඳව සාකච්ඡා කරන්න.

දූෂණ සංජනන දර්ශකය (CPI) අනුව පසුගිය වසර 17 ක කාලය පුරාම ශ්‍රී ලංකාව පසුවන්නේ දූෂිතභාවයෙන් වැඩි රටක් වශයෙන් බව PPT-03 ඇසුරින් පෙන්වා දෙමින් එම තත්ත්වය වෙනස් කිරීමට රාජ්‍ය නිලධාරීන් වශයෙනුත්, පුරවැසියන් වශයෙනුත් සියලු දෙනාට විශාල වගකීමක් පැවරී ඇති බව අවධාරණය කරන්න. (CPI දීර්ඝ වශයෙන් විස්තර කිරීම අවශ්‍ය නොවේ. PPT ඇසුරින් පසු ගිය 17 වසර පුරා රටවල් 180 ක් අතර ලංකාවට හිමිව ඇති ස්ථානයත්, ලකුණු 100 න් ශ්‍රී ලංකාවට හිමිව ඇති ලකුණු ප්‍රමාණයත් පෙන්වාදීම ප්‍රමාණවත්ය.)

## පියවර 9

### දූෂණයට එරෙහි ජාත්‍යන්තරය

කාලය විනාඩි - 10 (පෙ.ව 10.20-10.30)

### පුහුණුකරු සඳහා සටහන

දූෂණයට එරෙහි ගෝලීය පෙළගැස්ම හා ප්‍රවණතා පිළිබඳව විනාඩි කිහිපයක් කෙටියෙන් සාකච්ඡා කරන්න. එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතිය (UNCAC), අපරාධ හා මත්ද්‍රව්‍ය සඳහා වූ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC), ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් දූෂණ සංජනන දර්ශකය (CPI), ගෝලීය දූෂණ බැරෝමීටරය, විවෘත ආණ්ඩුකරණ හවුල්කාරිත්වය, තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG)වැනි දූෂණයට එරෙහි ගෝලීය ප්‍රවනතා රැසක් ක්‍රියාත්මකවන බව සඳහන් කිරීම ප්‍රමාණවත්ය.

(වැඩිදුර දැනුම සඳහා සුපිළිපන් පුහුණුකරුවන් සඳහා සම්පත් අත්පොත P 36-43 කියවන්න.)

## පියවර 10

### පුහුණුකරු සඳහා සටහන

### දූෂණය ජයගැනීම: හොං කොං ආදර්ශය

දූෂණය ජයගැනීම: හොං කොං ආදර්ශය PPT-04 ඉදිරිපත් කරන්න.

දූෂණය ජයගත හැකි දෙයක් බවත්, මේ වනවිට දූෂණය අවම කිරීමට සහ එහි පැවැත්ම දුර්වල කිරීමට සමත්වී ඇති රටවල සාර්ථක නිදසුන් ශ්‍රී ලංකාවටද අදාළ කරගතහැකි බවත් ඉහත නිදර්ශනය ඇසුරින් සාකච්ඡා කරන්න.

මෙවැනි ක්‍රියාමාර්ග වලට යොමුවීමට අපට ඇති බාධාවන් මොනවාදැයි සහභාගිවන්නන් සමඟ කෙටි සාකච්ඡාවකට යන්න.

# තෙවන සැසිය

## දූෂණයට එරෙහි ශ්‍රී ලාංකික පෙළගැස්ම

(කාලය - පැය 01 විනාඩි 30)
පෙ.ව 11.00 සිට පෙ.ව 12.30 දක්වා

### සැසියේ අරමුණු

- දූෂණය අවම කිරීම සිදුකළ හැකි කාර්යයක් බවට අවබෝධයක් ලබාදීම.
- කොමිෂන් සභාවේ දූෂණ වැලැක්වීමේ ක්‍රමෝපායයන් පිළිබඳව අවබෝධයක් ලබාදීම.
- දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම ගැන මූලික අවබෝධයක් ලබාදීම.

### සැසියේ අන්තර්ගතය

- දූෂණයට වැට බඳින විවිධ නීති පිළිබඳව මූලික අවබෝධයක් ලබාදීම.
- අල්ලස් කොමිසමේ බලතල හා කාර්යභාරය පැහැදිළි කිරීම.

### පියවර 1

කාලය විනාඩි - විනාඩි 30 (පෙ.ව 11.00-11.30)

**පුහුණුකරු සඳහා සටහන**

PPT-05 භාවිත කරමින් දූෂණය වැලැක්වීම සඳහා දැනට පවත්නා විවිධ නෛතික ප්‍රතිපාදන සාකච්ඡා කරන්න. සැසිය අවසානයේ දූෂණයට වැටබඳින නීති අත් පත්‍රිකා අංක 04 සහභාගිවන්නන්ට බෙදාදෙන්න. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ (CIABOC) නිලධාරියෙකු/නිලධාරිනියක සිටින අවස්ථාවලදී මෙම සැසිය එම නිලධාරියාට පැවරිය හැකිය.

### පියවර 2

කාලය විනාඩි - විනාඩි 60 (පෙ.ව 11.30-ප.ව 12.30)

**පුහුණුකරු සඳහා සටහන**

අල්ලස් කොමිසමේ බලතල හා කාර්යභාරය PPT-06 භාවිත කරමින් හැකි පමණ සරලව, සාකච්ඡා ස්වරූපයෙන් සිදු කරන්න.

සැසිය අවසානයේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිළිබඳව සම්පාදනය කර ඇති විශේෂ අත් පත්‍රිකාව සහභාගිවන්නන් වෙත බෙදාදෙන්න.

# සිව්වන සැසිය

## දූෂණය පිටුදැකීමේ ශ්‍රී ලාංකික සැලසුම්

(කාලය - පැය 01)
ප.ව 13.30 සිට ප.ව 14.30 දක්වා

### සැසියේ අරමුණු

- දූෂණය මැඩලිය හැකි බවට සහභාගිවන්නන් තුළ ධණාත්මක ආකල්පයක් ඇති කිරීම.
- රාජ්‍ය නිලධාරීන් තුළ සුපිළිපන්භාවයේ වටිනාකම පිළිබඳව සංවේදීභාවයක් ඇති කිරීම.
- රාජ්‍ය සේවකයෙකුගේ සුපිළිපන්බව තහවුරු කිරීම සඳහා පවත්නා නීතිමය ප්‍රතිපාදන පිළිබඳව අවබෝධයක් ලබාදීම.

### සැසියේ අන්තර්ගතය

- සුපිළිපන් රාජ්‍ය සේවකයා සතු හරයාත්මක භාවිතාව
- සුපිළිපන්භාවය හඳුනාගැනීම
- රාජ්‍ය සේවකයින් තුළ ස්වයං විනය ඇතිකර ගැනීම
- බැඳියාවන් අතර ගැටුම පිළිබඳ සංකල්පය
- තෑගි රීති පිළිබඳ ප්‍රතිපාදන
- අල්ලස් හෝ දූෂණ නිවාරණ ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ ආයතනික වගකීම්

### පියවර 1

කාලය විනාඩි - 10 (ප.ව 13.30-13.340)

**පුහුණුකරු සඳහා සටහන**

රැකියා ක්ෂේත්‍රය වශයෙන් රාජ්‍ය සේවය තෝරාගත්තේ ඇයි? වැනි සරල ප්‍රශ්නයක් සහභාගීවන්නන් වෙත යොමුකර ඔවුන් සමග ඉතා සුහදව සාකච්ඡාව ඉදිරියට ගෙනයමින් රාජ්‍ය සේවයට ඇතුල්වීමට ලැබෙන දුර්ලභ අවස්ථාවත්, රාජ්‍ය සේවාවේ වටිනාකමත්,රාජ්‍ය සේවයේ යෙදීම තුළින් මහජනතාවට සේවයක් කරමින් තමන්ටත් වටිනාකමක් ඇතිකර ගැනීමට හිමිවී ඇති වටිනා ප්‍රතිලාභයක් ගැන ඔවුන් සමඟ සාකච්ඡා කරන්න.

රාජ්‍ය නිලධාරියෙකුගේ වටිනාකම තව දුරටත් වර්ධනය කරගන්නේ කෙසේද? පවත්නා වටිනාකම් ඔප මට්ටම් කරගන්නේ කෙසේද? යන්න පිළිබඳව බුද්ධි කළම්භනයක යෙදෙමින් ඊලඟ පියවරට යොමුවන්න.

## පියවර 2

කාලය විනාඩි - 10 (ප.ව 13.40-13.50)

**පුහුණුකරු සඳහා සටහන**

PPT-07 භාවිත කරමින් සුපිළිපන්භාවය යනු කුමක්ද? යන්න සාකච්ඡා කරන්න. එම සාකච්ඡාව ඉදිරියට ගෙනයමින් රාජ්‍ය සේවය තුළ තමාව පාලනය කිරීමට ප්‍රධානියෙකු/පාලකයෙකු නොමැති අවස්ථාවකදී වුවද ස්වයං විනයක් ඇතිව කටයුතු කිරීමට ඇති හැකියාව සහ ඒ සඳහා පවත්නා විවිධ මාර්ගෝපදේශ පිළිබඳව සහභාගිවන්නන්ගේ අවධානය යොමු කරවමින් ඊලඟ පියවරට යොමුවන්න.

## පියවර 3

**පුහුණුකරු සඳහා සටහන**

රාජ්‍ය සේවකයින් සිය රාජකාරී කටයුතු ඉටුකිරීමේදී මුහුණ දීමට සිදුවන බැඳියාවන් මොනවාද? රාජකාරිය නිසි පරිදි ඉටුකිරීමට බාධාවන එම බැඳියාවන්ගෙන් මිදෙන්නේ කෙසේද? බුද්ධි කළම්භන සාකච්ඡාවකට යමින් පියවර 04 ට ප්‍රවේශ වන්න.

## පියවර 4

කාලය විනාඩි - 10 (ප.ව 13.50-14.00)

**පුහුණුකරු සඳහා සටහන**

PPT - 08 භාවිත කරමින් බැඳියාවන් අතර ගැටුම පිළිබඳව මූලික අදහසක් ලබාදෙන්න.

"බැඳියාවන් අතර ගැටුම් පිළිබඳ රීති"

මාර්ගෝපදේශ අත්පොත 3 සහභාගිවන්නන්ට පෙන්වා එම අත්පොත අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කිරීමට සහභාගීවන්නන් තුළ උනන්දුවක් ඇතිකරවන්න. එම මාර්ගෝපදේශ සංග්‍රහ CIABOC වෙබ් අඩවියෙන් බාගත කිරීමට මාර්ගෝපදේශ ලබාදෙන්න. (https://sinhala.ciaboc.gov.lk/) එසේම බැඳියාවන් අතර ගැටුම පිළිබඳ මුද්‍රිත අත් පත්‍රිකාව සහභාගිවන්නන්ට බෙදාදෙන්න.

## පියවර 5

කාලය විනාඩි - 10 (ප.ව 14.00-14.10)

**පුහුණුකරු සඳහා සටහන**

රාජ්‍ය සේවකයෙකුට තමන්ට ලැබෙන ත්‍යාගයක් භාරගත නොහැකිද? අල්ලස හා ත්‍යාගය අතර වෙනසක් පවතීද? ඒ වෙනස කුමක්ද? සහභාගීවන්නන් සමඟ සාකච්ඡාවකට යමින් සැසිය අරඹන්න. අනතුරුව පියවර 06 ට ප්‍රවේශ වන්න.

## පියවර 6

**පුහුණුකරු සඳහා සටහන**

PPT-09 භාවිත කරමින් ත්‍යාග රීති සම්බන්ධ මූලික කරුණු සාකච්ඡා කරන්න.

"තෑගි රීති"

මාර්ගෝපදේශ අත්පොත 2 සහභාගිවන්නන්ට පෙන්වා එම අත්පොත අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කිරීමට සහභාගීවන්නන්ට උනන්දුවක් ඇතිකරවන්න. එම මාර්ගෝපදේශ සංග්‍රහ CIABOC වෙබ් අඩවියෙන් බාගත කිරීමට මාර්ගෝපදේශ ලබාදෙන්න. (https://sinhala.ciaboc.gov.lk/) එසේම එය ඇසුරින් සකසා ඇති "තෑගි රීති" මුද්‍රිත අත් පත්‍රිකාව සහභාගිවන්නන්ට බෙදාදෙන්න.

## පියවර 7

කාලය විනාඩි - 10 (ප.ව 14.10-14.20)

**පුහුණුකරු සඳහා සටහන**

අත් පත්‍රිකා අංක - 06 සහභාගිවන්නන් වෙත බෙදාදෙමින් අල්ලස් හෝ දූෂණ නිවාරණ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සංක්ෂිප්තව පැහැදිළි කරන්න.එම සැලසුම යටතේ පැවැරෙන ආයතනික වගකීම් පිළිබඳව සහභාගිවන්නන් සමග සාකච්ඡා කරන්න.

ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම සහභාගි වන්නන්ට පෙන්වා එම අත්පොත අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කිරීමට සහභාගීවන්නන්ට උනන්දුවක් ඇතිකරවන්න. මේ සම්බන්ධ වීඩියෝ පටය තිබේනම් වීඩියෝ පටය ප්‍රදර්ශනය කරමින් එම සාකච්ඡාව ගෙනයා හැකිය.

## පියවර 8

කාලය විනාඩි - 10 (ප.ව 14.20-14.30)

**පුහුණුකරු සඳහා සටහන**

සිවිවන සැසිය යටතේ සාකච්ඡා කළ කරුණු නැවත සැකෙවින් සිහිපත් කරමින් සහභාගිවන්නන්ට ගැටලු ඇත්නම් ඒවා නිරවුල් කරන්න.

# පස්වන සැසිය

## ආයතන තුළ පවත්නා දූෂණ අවධානම් හඳුනාගැනීම

(කාලය - පැය 01)
පෙ.ව 14.30 සිට පෙ.ව 15.30 දක්වා

### සැසියේ අරමුණු

- රාජ්‍ය ආයතන තුළ අල්ලස හා දූෂණය ඇති වීමට තිබෙන අවධානම් හඳුනා ගැනීම සහ එම අවදානම් අවම කිරීමට කළහැකි මැදිහත්වීම හඳුනාගැනීම.

### සැසියේ අන්තර්ගතය

- සහභාගිවන්නන් නියෝජනය කරන ආයතන තුළ දූෂණයට පවත්නා අවධානම් සහගත තත්ත්වයන් හඳුනාගැනීමේ ක්‍රමවේද සහ ඊට යෙදිය හැකි පිළියම් සාකච්ඡා කිරීම.

### ක්‍රමවේදය

**කණ්ඩායම් ක්‍රියාකාරකම**

- ආයතනය තුළ පවත්නා අල්ලස් හෝ දූෂණ අවධානම් පවත්නා අංශ මොනවාදැයි සාකච්ඡා කිරීම සහ එම අවධානම විස්තර කිරීම.

**පුහුණුකරු සඳහා සටහන**

විවිධ ආයතන නියෝජනයක් පවත්නා අවස්ථාවලදී එක් ආයතනයක පිරිස් එක් කණ්ඩායමකට ඇතුළත් වනසේ කණ්ඩායම් බෙදන්න.එකම ආයතනයක පිරිස් සහභාගීවන අවස්ථාවලදී ආයතනයේ විවිධ අංශ නියෝජනය කරන පිරිස් එක කණ්ඩායමකට ඇතුළත් වනසේ කණ්ඩායම් බෙදිය හැකිය. සහභාගිවන්නන්ගේ සංඛ්‍යාව අනුව කණ්ඩායම් 4කට හෝ 5කට සීමාකරගන්න.

**කණ්ඩායම් ක්‍රියාකාරම්**

සෑම කණ්ඩායමක්ම සාකච්ඡා කරමින් පැය 1/2ක කාලයක් තුළ පහත ප්‍රශ්න දෙකට පිළිතුරු සොයන ලෙස උපදෙස් දෙන්න. ක්‍රියාකාරකම අවසානයේ කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීම් සිදුකරන්න.

- ඔබගේ ආයතනය තුළ අල්ලස් හෝ දූෂණ අවධානම් පවත්නා අංශ මොනවාද?
- එයින් වඩාත්ම අවධානම් සහගත අංශ 4 ක් හඳුනාගනිමින් එම අංශවල පවත්නා අවධානම විස්තර කරන්න.

# සමාප්ති සැසිය

(කාලය - පැය 1/2)
ප.ව 15.30 සිට ප.ව 16.00 දක්වා

## සැසියේ අරමුණු

- සුපිළිපන්භාවය වර්ධනය කරගැනීමේ වටිනාකම ගැන නැවත ස්මරණය කිරීම.
- පුහුණු වැඩසටහන ඇගයීම සඳහා අවශ්‍ය දත්ත ලබාගැනීම.
- සහභාගීවූවන්ගේ ප්‍රතිචාර ලබාගැනීම.
- සහභාගිවූවන් ඇගයීම සහ ඔවුන්ට ස්තුතිය පළකිරීම.

## සැසියේ අන්තර්ගතය

- වැඩමුළුවේ සාකච්ඡාකළ කරුණු නැවත ස්මරණය කිරීම.
- "ගෙදර යමු සුපිළිපන් හදවතින් ගීතය" මගින් සන්නිවේදනය කරන පණිවිඩය කෙරෙහි සහභාගි වන්නන්ගේ අවධානය යොමුකරවීම.
- ඇගයීම
- ස්තුතිය

## ක්‍රමවේදය

- සහභාගිවන්නන් සමග සාකච්ඡා
- පවර්පොයින්ට් සහ වීඩියෝ ඉදිරිපත් කිරීම්

## පුහුණුකරු සඳහා සටහන

දිනය තුළ සාකච්ඡා කළ කරුණු සියල්ල සංක්ෂිප්තව සඳහන් කරමින් සුපිළිපන්භාවය වර්ධනය කරගැනීමේ වටිනාකම පිළිබඳවත්,දූෂණය මැඩලීමේ සමාජ මෙහෙවරට දායක වීමේ වැදගත්කම පිළිබඳවත් සහභාගිවන්නන් සමග කෙටි සාකච්ඡාවකට යන්න.එය දූෂණය අවම කළහැකි දෙයක් බවට සහභාගිවන්නන් තුළ විශ්වාසයක් ඇතිකරවන ආකාරයේ කතාබහක් විය යුතුය.

එම සාකච්ඡාව අවසානයේ වීඩියෝව ප්‍රදර්ශනය කරමින් "ගෙදර යමු සුපිළිපන් හදවතින් ගීතය " වාදනය කරන්න.

අනතුරුව ඇගයීම් පත්‍රිකාව සහභාගිවන්නන් වෙත බෙදාදී ප්‍රතිචාර ලබාගන්න.

වැඩමුළුවට සහභාගීවූ සියළු දෙනා රාජ්‍ය නිලධාරීන්ගේ දූෂණ විරෝධී ජාලය වෙත සම්බන්ධ කරගන්නා බව පවසමින්,එම ජාලය සමඟ ක්‍රියාකාරීව සම්බන්ධවන ලෙස ඇරියුම් කරමින්( මෙය වැඩසටහනේ අවසානයක් නොව නව ගමනක ආරම්භයක් බව ප්‍රකාශ කරමින්)ස්තුතියෙන් අනතුරුව වැඩසටහන අවසන් කළ හැකිය.

සහභාගිවන්නන්ටද අදහස් පළකිරීමට අවස්ථාවක් ලබාදෙන්න.

# PPT-01 දූෂණය යනු කුමක්ද?

**දූෂණය යනු කුමක්ද?**

CIABOC-Oneday workshop-PPT 01

1

**ඔබ වෙසෙන සමාජය තුළත් මෙවැනි දේ සිදුවන්නේද?**

- නියමිත ප්‍රමිතියෙන් තොරව ඉදිකිරීම් අවසන්කර ඇති කොන්ක්‍රීට් මාර්ගයේ අවසන් ගෙවීම ලබාගැනීම සඳහා, එය නිසි ප්‍රමිතියෙන් යුතුව පවතින බවට වාර්තාවක් ලබාදෙන ලෙසත්,ඒ වෙනුවෙන් රු10,000/=ක මුදලක් වෙන්කර තිබෙන බවත් කොන්ත්‍රාත්කරු කාර්මික නිලධාරියාට යෝජනා කරයි.
- භාණ්ඩ තොගයේ බිල්පතෙහි ගැනුම්කරු ලෙස කාර්යාලයේ නම සඳහන්කර ,බිල්පතට 5% ක වට්ටමක් ලබාදී ,ඉතිරි 10% වට්ටම වෙනම කවරයක බහා මුදලින් ලබාදෙන්නැයි නිලධාරී පිරිස අලෙවි කළමනාකරුට යෝජනා කරයි.
- සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියට තමා ඇඟිලි නොගසන බවත්,එය ඕනෑ විදියකට නිදහසේ සිදුකර නිවාස බෙදාදීම සඳහා මෙම ලේඛනයේ නම් සඳහන් 10 දෙනා ඇතුළුව තවත් කිහිපදෙනෙකු තෝරාගන්නැයි ඇමතිවරයා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ප්‍රධානියාට කියයි.

2




3

**දූෂණය යනු ...**

දූෂණය (Corruption) යනු **“බලය වංක හෝ වංචාසහගත ලෙස යොදාගැනීමයි.”**

- *- ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය*

- **“විශේෂයෙන්ම බලවත් පුද්ගලයින්ගේ නීති විරෝධී හෝ වංක චර්යාව”** දූෂණයයි.

*- මරියම්-වෙබ්ස්ටර් ශබ්ද කෝෂය*

4

**දූෂණය ගැන විවිධ නිර්වචන කිහිපයක්**

- රජයේ තනතුරු තම පෞද්ගලික ප්‍රයෝජනය උදෙසා වැරදි අන්දමින් යොදා ගැනීම දූෂණයයි.
  -ලෝක බැංකුව
- දූෂණය යනු පෞද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ පුද්ගලයින් අතර සිදුවන පොදු භාණ්ඩ නීති විරෝධී ලෙස පෞද්ගලික භාණ්ඩ බවට පත් කිරීමේ ගනුදෙනුවකි.
  - ර්ඩින් හෝම්ස්

5

**දූෂණය යනු...**

දූෂණය යනු පැවැරී ඇති බලය පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා අයථා ආකාරයට යොදා ගැනීමයි.

-ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සංවිධානය

මහජන නිලධාරියෙකු පෞද්ගලිකත්වය, ඥාතිත්වය, මිත්‍රත්වය, ධනය හෝ බලය වැනි පෞද්ගලික අරමුණු නිසා අවශ්‍ය වගකීම් උල්ලංඝනය වන පරිදි හැසිරීම දූෂණයයි.

- කොලින් හේ

6

•

"මහජන දේපළ භාරව සිටින රාජ්‍ය නිලධාරීන් එකී දේපළ පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා යොදා ගන්නේදැයි සෙවීම, ජලයේ පිහිනන මාළුවකු එම ජලය බීමට ගන්නේදැයි සෙවීම මෙන් දුෂ්කරය"

-කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය (ක්‍රි.පූ.400 )

7

• "නඩුකාරයා දැකීමට මුදල් ඇතොත් නඩුව හරි වුවත්, වැරදි වුවත් ඊට බයක් නැත්තේය, යන්න මේ රටේ ප්‍රකට කීමක් වී තිබේ"

ක්‍රි.ව. 1681දී රචිත රොබට් නොක්ස්ගේ "ලංකාද්වීපය පිළිබඳ ඓතිහාසික විස්තරය" (එදා හෙළ දිව)

8

• 2002 දී දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සාකච්ඡාවට බඳුන් කිරීම ආරම්භ වූ අවස්ථාවේදී දූෂණය යන්නෙන් හැඟවෙන අර්ථය රටින් රටට සහ සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් වන බැවින් එය නිශ්චිතව අර්ථ නොදක්වා ඒ වෙනුවට දූෂණයේ ස්වරූපයන් සහ ක්‍රියාවන් ප්‍රධාන සංකල්ප කිහිපයක් යටතේ සාකච්ඡා කිරීමට තීරණය කර ඇත.

9

**දූෂණය පිළිබඳ ශ්‍රී ලාංකික නීතිමය නිර්වචනය**

( අල්ලස් පනතේ 70 වන වගන්තිය අනුව)

• ආණ්ඩුවට අයුතුසහගත ලෙස හෝ නීති විරෝධී ලෙස පාඩු සිදු කිරීමේ හෝ තමා වෙත හෝ යම් තැනැත්තෙකු වෙත අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස අර්ථලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් සිදු කිරීමේ චේතනාවෙන්

හෝ ආණ්ඩුවට හෝ යම් තැනැත්තෙකුට අයුතු ලෙස පාඩු සිදු විය හැකි බව නැතහොත් යම් තැනැත්තෙකුට අයුතු සහගත ලෙස හෝ නිති විරෝධී ලෙස අර්ථලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් හෝ වාසියක් සැලසෙන බව දැන දැනම පහත දැක්වෙන යම් ක්‍රියාවක්,

10

එනම්:-

(අ) රජයේ සේවකයෙකු වශයෙන් වූ ස්වකීය ධූරය ප්‍රකාර කිරීමට වෙනත් යම් රජයේ සේවකයෙකුට බලය පැවැරී ඇති යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීමට වෙනත් යම් රජයේ සේවකයෙකු පොළඹවන;

(ආ) රජයේ සේවකයෙකු වශයෙන් වූ ස්වකීය ධූරය ප්‍රකාර තමාට දැනගැනීමට ලැබෙන යම් තොරතුරක් පාවිච්චි කරන;

(ඇ) රජයේ සේවකයෙකු වශයෙන් වූ ස්වකීය ධූරය ප්‍රකාර යම් තීරණයක් ගැනීමෙහිලා සහභාගී වන;

(ඉ) රජයේ සේවකයෙකු වශයෙන් වූ ස්වකීය ධූරය කෙළින්ම හෝ අන්‍යාකාරයකින් හෝ පාවිච්චි කිරීමෙන් යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීමට වෙනත් යම් තැනැත්තකු පොළඹවන,

ක්‍රියාවක් දූෂණයකි.

11



12

**රාජ්‍ය නිලධාරීන් සඳහා දූෂණ විරෝධී පුහුණු වැඩසටහන**
අත් පත්‍රිකා - අංක 01

## දූෂණය යනු කුමක්ද?

අල්ලස හා දූෂණය මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිටම විශ්වීය සංසිද්ධියක් ලෙස පැවැතී ඇති බවට ඉතිහාසය පුරා සාක්ෂි හමු වේ.

ක්‍රි.පූ.400 තරම් ඈත අතීතයේදී රචනා කරන ලදැයි සැලකෙන කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය ග්‍රන්ථය රාජ්‍ය නිලධාරීන් විසින් සිදු කරන දූෂණ විමර්ශනය කිරීමේ දුෂ්කරතාව පිළිබඳව සඳහන් කරමින් පෙන්වා දෙන්නේ, "මහජන දේපළ භාරව සිටින රාජ්‍ය නිලධාරීන් එකී දේපළ පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා යොදා ගන්නේදැයි සෙවීම, ජලයේ පිහිනන මාළුවකු එම ජලය බීමට ගන්නේදැයි සෙවීම මෙන් දුෂ්කර" බවය.

"නඩුකාරයා දැකීමට මුදල් ඇතොත් නඩුව හරි වුවත්, වැරදි වුවත් ඊට බයක් නැත්තේය, යන්න මේ රටේ ප්‍රකට කීමක් වී ඇති" බව ක්‍රි.ව 1681දී රචිත රොබට් නොක්ස්ගේ "ලංකාද්වීපය පිළිබඳ ඓතිහාසික විස්තරය" ග්‍රන්ථයෙහි (එදා හෙළ දිව) සඳහන් වේ.

ආගමික ඉගැන්වීම්වලද ඈත අතීතයේ සිටම දූෂණය පිළිබඳව විවිධ ආකාරයෙන් සාකච්ඡා කර තිබේ. බෞද්ධ දර්ශනයට අනුව දස රාජ ධර්මයට අනුකූලව රාජ්‍ය පාලනය කිරීමේදී දූෂණයෙන් තොරව රාජ්‍ය පාලනය සිදුකිරීමත්, සෑම මට්ටමකම දූෂණ වෙනුවෙන් ක්‍රියාත්මක වීමත් රජුගේ වගකීමක් ලෙස සැලකිණි.

"නුඹලා සොරකම් නොකළ යුත්තාහු" යැයි ක්‍රිස්තුස්වහන්සේද සිය අනුගාමිකයින්ට ප්‍රකාශ කර තිබේ. බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ 1883දී සම්මත කරන ලද දණ්ඩ නීති සංග්‍රහය මගින් දූෂණයේ ප්‍රධාන ප්‍රභේදයක් වන අල්ලස ශ්‍රී ලංකාව තුළ නෛතික වරදක් ලෙස නම් කර ඇත.

## දූෂණය පිළිබඳ විවිධ නිර්වචන

දූෂණය යනු කුමක්ද? යන්න කෙරෙහි වඩාත් ගැඹුරින් සලකා බැලීමේදී ඒ පිළිබඳ ලොව පුරා පිළිගත් නිශ්චිත නිර්වචනයක් මෙතෙක් ඉදිරිපත්වී නොමැති බව පෙනේ. එහෙත් දූෂණය යනු කවර ආකාරයක සංසිද්ධියක්දැයි තේරුම් ගැනීමට පහසු කරවන, විවිධ නිර්වචන රැසක් ඒ පිළිබඳව අධ්‍යයනය කිරීමේදී හමු වේ. ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයට අනුව දූෂණය (Corruption) යන්නෙහි අර්ථය "බලය වංක හෝ වංචාසහගත ලෙස යොදාගැනීමයි." මරියම්-වෙබ්ස්ටර් ශබ්ද කෝෂය දූෂණය අර්ථ දක්වන්නේ "විශේෂයෙන්ම බලවත් පුද්ගලයින්ගේ නීති විරෝධී හෝ වංක චර්යාව" යනුවෙනි.

### විවිධ සංවිධාන විසින් ඉදිරිපත්කර ඇති තවත් එවැනි නිර්වචන කිහිපයක්:

- රජයේ තනතුරු තම පෞද්ගලික ප්‍රයෝජනය උදෙසා වැරදි අන්දමින් යොදා ගැනීම දූෂණයයි.
  - ලෝක බැංකුව
- අල්ලස් ලබා ගන්නා පුද්ගලයාගෙන් සිදු විය යුතු රාජකාරිය හෝ ඔහුගෙන් විය යුතු හැසිරීම් රටාවෙන් වෙනස් වන අන්දමින් ඍජුව හෝ වක්‍රව අල්ලසක් හෝ වෙනයම් වැරදි සහගත ලාභයක් ඉල්ලීම පිළිගැන්වීම, දීම හෝ ලබාදීම දූෂණය නම් වේ.
  - යුරෝපා සංගමය
- දූෂණය යනු පැවැරී ඇති බලය පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා අයථා ආකාරයට යොදා ගැනීමයි.
  - ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සංවිධානය
- මහජන නිලධාරියෙකු පෞද්ගලිකත්වය, ඥාතිත්වය, මිත්‍රත්වය, ධනය හෝ බලය වැනි පෞද්ගලික අරමුණු නිසා අවශ්‍ය වගකීම් උල්ලංඝනය වන පරිදි හැසිරීම දූෂණයයි.
  - කොලින් හේ

- දූෂණය යනු පෞද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ පුද්ගලයින් අතර සිදුවන පොදු භාණ්ඩ නීති විරෝධි ලෙස පෞද්ගලික භාණ්ඩ බවට පත් කිරීමේ ගනුදෙනුවකි.
  - ඊඩින් හෝමිස්

මෙම විවිධ නිර්වචන අනුව පුළුල් අර්ථයෙන් සැලකූවිට දූෂණය රාජ්‍ය අංශයට පමණක් සීමා කළ නොහැකි බවත්, එය ව්‍යාපාරික ක්ෂේත්‍රය විසින් දේශපාලඥයින්ට සහ රාජ්‍ය නිලධාරීන්ට අල්ලස් ලබාදීම් ආදී සිදුවීම්වල සිට රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශය තුළම ලාභ ප්‍රයෝජන උදෙසා බලය අයථා ලෙස භාවිත කිරීම් සිදුකෙරෙන, ලොකු-කුඩා මට්ටමේ නීති විරෝධී ක්‍රියා සහ ගනුදෙනු දක්වා පුළුල් පරාසයක විහිද පවත්නා සංසිද්ධියක් බවත් පැහැදිලි වේ.

2002 වර්ෂයේදී දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සාකච්ඡාවට බඳුන් කිරීම ආරම්භ වූ අවස්ථාවේදී දූෂණය යන්නෙන් හැඟවෙන අර්ථය රටින් රටට සහ සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් වන බැවින් එය නිශ්චිතව අර්ථ නොදක්වා ඒ වෙනුවට දූෂණයේ ස්වරූපයන් සහ ක්‍රියාවන් ප්‍රධාන සංකල්ප කිහිපයක් යටතේ සාකච්ඡා කිරීමට තීරණය කර තිබේ.

## දූෂණය පිළිබඳ ශ්‍රී ලාංකික නීතිමය නිර්වචනය

දූෂණය යනු කුමක්ද? යන්නට ජාත්‍යන්තරව පිළිගත් නිශ්චිත නිර්වචනයක් නොමැති වුවද නීතිමය අවශ්‍යතා සඳහා ශ්‍රී ලංකාවට අදාළව දූෂණය පිළිබඳ පැහැදිලි නිර්වචනයක් සම්පාදනය කරගෙන තිබේ. එම අර්ථ නිරූපනය සඳහන් වන්නේ 1994 අංක 20 දරන අල්ලස් (සංශෝධන) පනත මගින් සංශෝධිත 1954 අංක 11 දරන අල්ලස් පනතේ 70 වන වගන්තිය තුළය.

### එම වගන්තියට අනුව දූෂණය යනු,

"ආණ්ඩුවට අයුතුසහගත ලෙස හෝ නීති විරෝධී ලෙස පාඩු සිදු කිරීමේ හෝ තමා වෙත හෝ යම් තැනැත්තෙකු වෙත අයුතු සහගත ලෙස හෝ නීති විරෝධී ලෙස අර්ථලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් සිදු කිරීමේ චේතනාවෙන් හෝ ආණ්ඩුවට හෝ යම් තැනැත්තෙකුට අයුතු ලෙස පාඩු සිදු විය හැකි බව, නැතහොත් යම් තැනැත්තෙකුට අයුතු සහගත ලෙස හෝ නිති විරෝධී ලෙස අර්ථලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් හෝ වාසියක් සැලසෙන බව දැන දැනම පහත දැක්වෙන යම් ක්‍රියාවක්, එනම්:-

- රජයේ සේවකයෙකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර කිරීමට වෙනත් යම් රජයේ සේවකයෙකුට බලය පැවැරී ඇති යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීමට වෙනත් යම් රජයේ සේවකයෙකු පොළඹවන;

- රජයේ සේවකයෙකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර තමාට දැනගැනීමට ලැබෙන යම් තොරතුරක් පාවිච්චි කරන;

- රජයේ සේවකයෙකු වශයෙන් වූ ස්වකීය ධුරය ප්‍රකාර යම් තීරණයක් ගැනීමෙහිලා සහභාගී වන;

- රජයේ සේවකයෙකු වශයෙන් වූ ස්වකීය ධුරය කෙළින්ම හෝ අන්‍යාකාරයකින් හෝ පාවිච්චි කිරීමෙන් යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීමට වෙනත් යම් තැනැත්තකු පොළඹවන;

ක්‍රියාවක් දූෂණයක් ලෙස අර්ථ නිරූපනය කර ඇත.

අල්ලස් පනතට අනුව එවැනි ක්‍රියාවක් අපරාධ වරදක් වේ. මෙම වරද සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට විමර්ශන සිදුකිරීමට බලය පවරා ඇති අතර දූෂණ වරද වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත හැකි වරදක් ලෙස සැලකේ. දූෂණය වරදට 1994 අංක 20 දරන අල්ලස් සංශෝධන පනත අනුව මහේස්ත්‍රාත් අධිකරණයක පවත්වන ලඝු නඩු විභාගයකින් වරදකරු වූ විට රුපියල් ලක්ෂය දක්වා දඩයක් හෝ වසර 10ක් දක්වා සිරදඬුවම් හෝ දඩය හෝ සිරදඬුවම යන දෙකටම යටත් විය යුතුය. පසුව 2018 අංක 22 දරන අල්ලස් (සංශෝධන) පනත මගින් අල්ලස් නඩු පවත්වාගෙන යෑම මහාධිකරණයටද පවරන ලදි.

## දූෂණය පිළිබඳ ආචාර්ය ක්ලිගාඩ් ගේ සූත්‍රය

ලොව පුරා පවත්නා පළාත් පාලන ක්‍රම පිළිබඳව අධ්‍යයනයක යෙදුන ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකු වූ රොබට් ක්ලිට්ගාඩ් (Robert Klitgaard) දූෂණයේ පැවැත්ම කෙරෙහි බලපාන සාධක සහ ඒවා දූෂණය අඩු වැඩි වීම කෙරෙහි බලපාන ආකාරය පිළිබඳව ඉතාමත් සරල සූත්‍රයක් මගින් පැහැදිලි කර දී තිබේ.

| **දූෂණය** | = | **ඒකාධිකාරිය** | + | **අභිමතානුසාරී බලය** | - | **වගවීම** |
|---|---|---|---|---|---|---|
| Corruption | = | Monopoly | + | Discretion | - | Accountability |

ක්ලිට්ගාඩ් සූත්‍රය නමින් හැඳින්වෙන එම පැහැදිලි කිරීම මඟින් ඔහු පෙන්වා දෙන්නේ ඒකාධිකාරී තත්ත්වයක් පවත්නා විටෙක රාජ්‍ය නිලධාරියෙකුට අදාළ බලතල ක්‍රියාත්මක කිරීමට අභිමතානුසාරී බලයක් පවතින්නේ නම් සහ එම නිලධාරියා කිසිදු වගවීමකට ලක් නොවන්නේ නම් එවිට දූෂිත තත්ත්වයක් නිර්මාණය වන බවයි. කාර්යක්ෂම සහ ඵලදායී රාජ්‍ය අංශයක පාලනය කරන ලද අභිමතානුසාරී බලයක් පවත්වා ගැනීම සහ අභිමතානුසාරී බලය සහ වගවීම අතර මනා සමබරතාවයක් පවත්වා ගැනීම අවශ්‍ය බවද ඔහු වැඩිදුරටත් පෙන්වා දී තිබේ.

එබැවින් ආචාර්ය ක්ලිට්ගාඩ් පෙන්වා දෙන්නේ දූෂණය අඩු කිරීම සඳහා ඒකාධිකාරය අඩු කිරීමත්, අභිමතානුසාරී බලය අඩු කිරීමත් සිදු කරන අතර වගවීම වර්ධනය කිරීම කෙරෙහිද අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වන බවයි.

# PPT-02 දූෂණයේ විවිධ ස්වරූප

## දූෂණයේ විවිධ ස්වරූපයන්

CIABOC-One day Training Module -PPT 02

1

## මහා පරිමාණ සහ සුළු පරිමාණ දූෂණ

- **මහා පරිමාණ දූෂණ** (Grand Corruption) - රජයේ ඉහළ මට්ටමින් සිදු කෙරෙන දූෂණයි.
- **සුළු පරිමාණ දූෂණ** (Petty Corruption) - ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන අවස්ථාවේදී පරිපාලන ක්‍රියාදාමය තුළ සිදු වන්නා වූ දූෂණයි.

2

## දූෂණයේ ප්‍රභේද

එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතියට අනුව පහත සඳහන් දූෂණ ක්‍රියාවන් වෙනුවෙන් රාජ්‍යයක් විසින් අපරාධ වගකීම් පැවරීම සඳහා නීති සම්පාදනය කළ යුතු බව දක්වයි.

**අල්ලස**
**නිලධාරියෙකු විසින් දේපළ අයථා ලෙස යොදාගැනීම**
**බලපෑම් සිදු කිරීම**
**නිලතල අයුතු ලෙස යොදා ගැනීම**
**අයුතු ධනවත්වීම්**
**අපරාධවලින් ලැබෙන මුදල් විශුද්ධිකරණය**
**යුක්තිය පසිඳලීමට බාධා කිරීම**

3

## අල්ලස (Bribery)

දූෂණයේ වඩාත්ම ප්‍රචලිත ආකාරයයි.

අල්ලස යනු **නීති විරෝධීව හුවමාරු වන තුටු පඬුරකි.**

යම් කාර්යයක් ඉටු කරවා ගැනීමට හෝ යම් තීරණයකට අයුතු ලෙස බලපෑම් කිරීම සඳහා මෙම තුටු පඬුරු හුවමාරු වේ.

කාර්යය ඉටු වීමට පෙර **පූර්ව ගෙවීමක්** ලෙස හෝ ඉටු වීමෙන් පසු **'පසු ගෙවීමක්'** ලෙස හුවමාරු විය හැකිය.

**තුටුපඬුර** යන්නට - මුදල්, වටිනා භාණ්ඩ, සමාගම් කොටස්, යාන වාහන, අභ්‍යන්තර රහස්‍ය තොරතුරු මෙන්ම ලිංගික හෝ වෙනත් වාසි වැනි ඕනෑම ආකාරයක **ගෙවීමක්** අයත් වේ.

4

## අල්ලස අපරාධ වරදකි.

**අල්ලසක් ඉල්ලා සිටීම** හෝ **ලබාගැනීම** මෙන්ම අල්ලසක් **ලබාදීමට තැත් කිරීම** හෝ **ලබාදීම**ද නීතිය ඉදිරියේ සමාන වරදකි.

(ශ්‍රී ලංකාවේ නීතිය තුළ රාජ්‍ය නිලධාරියෙකු විසින් අල්ලස් ලබාගැනීම හෝ රාජ්‍ය නිලධාරියෙකුට අල්ලස් ලබාදීම අපරාධ වරදකි.)

5

## නිලතල අයුතු ලෙස යොදා ගැනීම

රාජ්‍ය නිලධාරියකු විසින් තම කාර්යභාරය හෝ **ධුරය අනිසි ලෙස** ප්‍රයෝජනයට ගැනීම,

එනම්, යම් රාජ්‍ය නිලධරයකු සඳහා හෝ වෙනත් තැනැත්තකු සඳහා හෝ යම් අයුතු වාසියක් ලබා ගැනීමට **නීති කඩ කරමින් යම් ක්‍රියාවක් සිදු කිරීම** හෝ සිතාමතාම **සිදු කිරීමෙන් වැළකී සිටීම.**

6

## වංචාව

යමෙකුගේ හෝ තෙවන පාර්ශවයකගේ වාසිය තකා තවත් පුද්ගලයකු රැවටීමට ක්‍රියා කිරීම වංචාවයි.

## බලහත්කාරය

යම් ක්‍රියාවක් කිරීම හෝ නොකර සිටීම සඳහා යම් වටිනා දෙයක් හෝ මුදලක් ලබා දෙන ලෙසට බල කිරීම බලහත්කාරයයි.

7

## නීති විරෝධී සන්තෝසම්, පාරිතෝෂික, කොමිස් ලබා ගැනීම

රජය සමග යම් කටයුත්තක් කිරීමට බලාපොරොත්තු වන පාර්ශ්වයකින් යම් වටිනාකමක්, මුදලක්, ලාභයක් ලබාගැනීම මෙයින් අදහස් වේ. රජයේ නිලධාරියකු ටෙන්ඩර් අනුමත කිරීම සඳහා මුදල් හෝ කොමිස් ඉල්ලීම නිදසුන්ය.

8

### අනිසි පක්ෂපාතීත්වය

පෞද්ගලික දැනීම, පක්ෂ හිතවත්කම්, ජාතිය, ආගම, කුලය, හෝ වෙනත් කැමැත්තක් හේතු කොටගෙන රජයේ නිලධාරියකු විසින් සේවාවක් හෝ සම්පත් ලබාදීම මෙයට අයත්ය. දේශපාලන සම්බන්ධතා මත රැකියා දීම සේවාවන් ලබා දීමද මීට නිදසුන්වේ.

9

**කණ්ඩායම් ක්‍රියාකාරකම සඳහා ප්‍රශ්නාවලිය**
PPT -02/ඇමිණුම 01

## දූෂණයේ විවිධ ස්වරූපයන් හඳුනා ගැනීම සඳහා කෙටි ප්‍රශ්නාවලිය

**පහත සඳහන් සිදුවීම් අල්ලස් හෝ දූෂණ වරදක් ලෙස සැලකිය හැකිද? *ඔබේ අදහස අනුව එය අල්ලස් වරදක්ද? දූෂණ වරදක්ද? *එම වරද අයත්වන්නේ දූෂණයේ කවර ප්‍රභේදයකටද?**

1. උසස්වීම ගැන ඉක්මනින්ම සලකා බැලීමට නම් තමන්ටත් උසස් සැළකිමක් සිදුකළයුතු යැයි ආයතන ප්‍රධානියා සුරංගීට කියයි.

2. ශල්‍යකර්මය ඇරඹීමට පෙර තමා ඉල්ලා සිටි මිළට ඉඩම විකිණිය හැකිද? නැද්ද? යන්න ගැන තව වරක් කල්පනාකර තීරණයක් දෙන්නැයි රෝහල්ගතව සිටින තම අසල්වැසියා අමතා වෛද්‍යවරයා පවසයි.

3. තම සුඛසාධන සංගම් වාර්ෂික චාරිකාවේ නේවාසික ගාස්තු වියදම් බිල ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාදිය හැකිනම්, ත්‍රස්තවාදී වැරදි යටතේ ප්‍රශ්න කිරීම සඳහා අත්අඩංගුවට ගෙන සිටින සිරිමෙවන් නිදහස් කළහැකි බවත්, එම පොදු ඉල්ලීම ගැන සලකා බැලීමට නොහැකි නම් ඔහු තවදුටත් රඳවා ගැනීමේ නියෝග මත සිර අඩස්සියේ තැබීමට සිදුවන බවත් සහකාර පොලිස් අධිකාරීවරයා සිරිමෙවන්ගේ බිරිඳට පවසයි.

4. තම ඇමතිවරයාට කියා, ස්වාධීන කොමිෂන් සභාවක උසස්, ස්ථිර තනතුරක් ලබාදිය හැකියැයි පවසා අමාත්‍ය කාර්ය මණ්ඩලයක කාර්යාල කාර්ය සහයකයෙකුවන නන්දසේන, උපාධිධරයෙකු වූ පූර්ණජීවගෙන් ජීව දත්ත පතක් සමග රු ලක්ෂයක මුදලක් ඉල්ලා සිටී.

5. නගර සභා ගොඩනැගිල්ලේ ආලේප කිරීමට ගෙන්වා ඇති තීන්තවලින් ලීටර් 10 ක් සහ පින්තාරුකරුවන් සිව්දෙනෙකු තමාගේ මහගෙදරට යවා දානයට පෙර ඉක්මනින් නිවස අලුත්වැඩියා කිරීමේ කාර්යය අවසන්කර දෙන්නැයි නගර සභාවේ උසස් නිලධාරියෙකු වැඩ අධිකාරීවරයාට දූරකථනයෙන් දැනුම්දෙයි. එම තීන්ත ලීටර 10 වෙනුවට තව ලීටර් 10 ක් නගර සභාවට යවන ලෙස තමා තීන්ත සමාගමට දැනුම්දුන් බවද ඔහු වැඩිදුරටත් කියා සිටී.

6. අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම් විසින් සකස්කර එවන ලද ඉඩම් හිමිකම් ලැබිය යුත්තන්ගේ නාමලේඛනයේ නම් සඳහන් ආධාරකරුවන්ට විධිමත් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියේදී හිමිවී ඇත්තේ අඩු ලකුණු සංඛ්‍යාවක් බැවින් ඔවුන්ට ප්‍රමාණවත් ලකුණු සංඛ්‍යාවක් හිමිවන ලෙස එම ලේඛන සංශෝධනය කරන්නැයි ආයතන ප්‍රධානියා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට උපදෙස් දෙයි.

**රාජ්‍ය නිලධාරීන් සඳහා දූෂණ විරෝධී පුහුණු වැඩසටහන**
අත් පත්‍රිකා -අංක 02

## දූෂණයේ විවිධ ස්වරූප

දූෂණය එහි විවිධ ස්වරූපයන් සහ ක්‍රියාවන් අනුව අල්ලස (Bribery), මහජන මුදල් වංචා කිරීම, වංචාව, බලහත්කාරයෙන් මුදල් ලබාගැනීම ආදී වශයෙන් වර්ගීකරණයට ලක් කළ හැකිය. මෙම සංකල්පයන් අර්ධ වශයෙන් එකක් මත එකක් ක්‍රියා කරන විටද, අනෙකුත් සංකල්ප සමඟ අන්‍යෝන්‍ය වශයෙන් හුවමාරු වන විටද මෙකී සංකල්ප හරහා දූෂණයේ යම් යම් මූලික ලක්ෂණ හඳුනාගත හැකිය.

දූෂණ ගැන සඳහන් කෙරෙන බොහෝ අවස්ථාවල "වංචා-දූෂණ", "අල්ලස්-දූෂණ" වශයෙන් යුගල පද ලෙස භාවිතා වුවද අල්ලස් හෝ වංචා යනු දූෂණය තුළ එක් ස්වරූපයක් නොව එකිනෙකට වෙනස් ස්වරූපයන් දෙකකි.

### මහා පරිමාණ දූෂණ සහ සුළු පරිමාණ දූෂණ

දූෂණය, මහා පරිමාණ දූෂණ (Grand Corruption) සහ සුළු පරිමාණ දූෂණ (Petty Corruption) ලෙස ප්‍රධාන කොටස් දෙකක් යටතේ වර්ගීකරණය කළ හැකිය. මහා පරිමාණ දූෂණ යනු රජයේ ඉහළ මට්ටමින් සිදු කෙරෙන දූෂණයි. වැටි බදු වංචාව, බැඳුම්කර ගනුදෙනුව ආදී ප්‍රමුඛ දූෂණ මහා පරිමාණ දූෂණවලට නිදසුන්ය.

සුළු පරිමාණ දූෂණ යනු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන අවස්ථාවේදී පරිපාලන ක්‍රියාදාමය තුළ සිදු වන්නා වූ දූෂණයි. එදිනෙදා දෛනික කාර්යයන් ඉටු කරවා ගැනීමේදී මහජනතාවට ලබාදීමට සිදු වන විවිධ සංතෝෂම් ආදිය සුළු පරිමාණ දූෂණවලට නිදසුන්ය.

### එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතියට අනුව දූෂණයේ ප්‍රභේද

එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතියට අනුව පහත සඳහන් දූෂණ ක්‍රියාවන් වෙනුවෙන් රාජ්‍යයක් විසින් අපරාධ වගකීම් පැවැරීම සඳහා නීති සම්පාදනය කළ යුතු බව දක්වයි.

- අල්ලස
- නිලධාරියෙකු විසින් දේපළ අයථා ලෙස යොදාගැනීම
- බලපෑම් සිදු කිරීම
- නිලතල අයුතු ලෙස යොදා ගැනීම
- අයුතු ධනවත්වීම්
- අපරාධවලින් ලැබෙන මුදල් විශුද්ධිකරණය
- යුක්තිය පසිඳලීමට බාධා කිරීම

### අල්ලස (Bribery)

දූෂණයේ වඩාත්ම ප්‍රචලිත ආකාරය වනුයේ අල්ලසයි. අල්ලස යනු නීති විරෝධීව හුවමාරු වන තුටු පඬුරකි. යම් කාර්යයක් ඉටු කරවා ගැනීමට හෝ යම් තීරණයක් ගැනීම පිළිබඳව අයුතු ලෙස බලපෑම් කිරීම සඳහා යම් වාසියක් ලබාදීම, ලබාදීමට පොරොන්දු වීම හෝ ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කිරීම මෙහිදී සිදු වේ. අල්ලස් ගනුදෙනුවක් සිදු වනුයේ දෙපාර්ශ්වයේ අන්‍යෝන්‍ය අවබෝධය මතය. මෙම අල්ලස අදාළ කාර්යය ඉටු වීමට පෙර පූර්ව ගෙවීමක් වශයෙන් හෝ අදාළ කාර්යය ඉටු වීමෙන් පසු සිදු කරන 'පසු ගෙවීමක්' වශයෙන් හුවමාරු විය හැකිය. මෙම ගෙවීම නැතහොත් තුටුපඬුර යන්නට මූල්‍යමය වටිනාකමක් ඇති මුදල්, වටිනා භාණ්ඩ, සමාගම් කොටස්, යාන වාහන, අභ්‍යන්තර රහස්‍ය තොරතුරු මෙන්ම ලිංගික හෝ වෙනත් වාසි සලසා දීම වැනි ඕනෑම ආකාරයක ගෙවීමක් අයත් වේ.

ක්‍රියාවක් ඉටු කරවා ගැනීම සඳහා මෙන්ම යම් ක්‍රියාවක් නොකර හැරීම සඳහාද, තීරණ ගතයුතු නිලධාරියකු එම වගකීම ගණන් නොගෙන සිටින තත්ත්වයක් ඇති කරවා ගැනීම සඳහාද මෙම නීතිවිරෝධී තුටුපඬුරු ප්‍රදානය

සිදු විය හැකිය. අල්ලසක් ඉල්ලා සිටීම හෝ ලබාගැනීම මෙන්ම අල්ලසක් ලබාදීමට තැත් කිරීම හෝ ලබාදීමද නීතිය ඉදිරියේ සමාන වරදක් වශයෙන් සලකනු ලැබේ.

ශ්‍රී ලංකාවේ නීතිය තුළ අපරාධයක් ලෙස හඳුනාගෙන ඇත්තේ රාජ්‍ය නිලධාරියෙකු විසින් අල්ලස් ලබා ගැනීම හෝ රාජ්‍ය නිලධාරියෙකුට අල්ලස් ලබාදීම පමණි. ශ්‍රී ලංකාව තුළ පුද්ගලික අංශයේ සිදු වන අල්ලස් තවමත් අපරාධ නීතියේ කොටසක් බවට පත් වී නොමැත. ජාත්‍යන්තර දූෂණ විරෝධී සම්මුතියට අනුව රාජ්‍ය නිලධාරීන්ගේ අල්ලස, විදේශ රාජ්‍ය නිලධාරීන්ගේ අල්ලස මෙන්ම ජාත්‍යන්තර, රාජ්‍ය, සංවිධානවල නිලධාරීන්ගේ අල්ලසද අපරාධ වැරදි ලෙස හඳුනාගෙන ඇත.

### නිලධාරියෙකු විසින් දේපළ අයථා ලෙස යොදා ගැනීම

යම් රාජ්‍ය නිලධාරියෙකුගේ තනතුරට අනුව ඔහුට භාරදී ඇති යම් දේපළක්, රාජ්‍ය හෝ පුද්ගලික මුදල් හෝ ඇප හෝ වටිනාකමක් ඇති වෙනත් යම් දෙයක්, එම රාජ්‍ය නිලධාරියා විසින් ඔහුගේ හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයුතු ප්‍රතිලාභය සඳහා වංචා කිරීම, අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීම දූෂණයකි.

### බලපෑම් සිදු කිරීම

යම් ක්‍රියාවක් සිදු කරන ලෙස මුලින් ඉල්ලා සිටි තැනැත්තාට හෝ වෙනත් යම් තැනැත්තෙකුට, රාජ්‍ය පාර්ශවයේ පරිපාලනමය හෝ රාජ්‍ය අධිකාරියකින් යම් අයුතු වාසියක් ලබා ගැනීමේ අදහසකින් රජයේ නිලධරයෙකු හෝ වෙනත් තැනැත්තෙකු ඔහුගේ හෝ ඇයගේ බලපෑම පාවිච්චි කිරීම සඳහා එම රජයේ නිලධරයාට අයුතු ලාභයක් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ලබාදීමට පොරොන්දුවීම හෝ යෝජනා කිරීම හෝ ලබාදීම බලපෑම් සිදුකිරීමක් ලෙස හඳුන්වනු ලැබේ.

යම් අයුතු ලාභයක් රාජ්‍ය පාර්ශවයේ පරිපාලනමය හෝ රාජ්‍ය අධිකාරියකින් ලබා ගැනීමේ අදහසින් රජයේ නිලධාරයෙකු හෝ වෙනත් තැනැත්තෙකු ඔහුගේ හෝ ඇයගේ බලපෑම පාවිච්චි කිරීම සඳහා එම රජයේ නිලධාරයාට අයුතු වාසියක් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ලබාදීමට ඉල්ලා සිටීම හෝ භාර ගැනීමට බලපෑම් සිදු කිරීමද මීට අයත් වේ.

### නිලතල අයුතු ලෙස යොදා ගැනීම

යම් රාජ්‍ය නිලධාරියකු විසින් තම කාර්යභාරය හෝ ධුරය අනිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම, එනම් යම් රාජ්‍ය නිලධරයකු සඳහා හෝ වෙනත් තැනැත්තකු සඳහා හෝ යම් අයුතු වාසියක් ලබා ගැනීමේ කාර්යය සඳහා ඔහුගේ හෝ ඇයගේ කාර්යභාරය ඉටු කිරීමේදී නීති කඩ කරමින් යම් ක්‍රියාවක් සිදු කිරීම හෝ සිතාමතාම සිදු කිරීමෙන් වැළකී සිටීම.

### අයුතු ධනවත්වීම්

නීති විරෝධී ධනවත් වීම එනම් යම් රාජ්‍ය නිලධාරියෙකුගේ නීත්‍යානුකූල ආදායමට අදාළව ඔහුට හෝ ඇයට සාධාරණ ලෙස පැහැදිලි කළ නොහැකි වත්කම්වලින් සැලකිය යුතු වැඩි වීමක් ඇති කර ගැනීම සිතා මතාම කරනු ලැබූ විට එය නීති විරෝධි ධනවත් වීමකි.

### අපරාධවලින් ලැබෙන මුදල් විශුද්ධිකරණය

යම් දේපළක් නීති විරෝධි ක්‍රමයට ලබාගෙන එහි නීති විරෝධී මූලාරම්භය සැඟවීම හෝ වසන් කිරීම සඳහා එම දේපළ පරිවර්තනය කිරීම හෝ පැවරීම මුදල් විශුද්ධිකරණය නම් වේ.

ඉහත කී ආකාරයන් හැරුණ විට පහත සඳහන් ස්වරූපයේ ක්‍රියාවන්ද දූෂණය හෙවත් දුසැරිය ලෙස හඳුන්වනු ලැබේ.

### වංචාව

යමෙකුගේ හෝ තෙවන පාර්ශවයකගේ වාසිය තකා තවත් පුද්ගලයකු රැවටීමට ක්‍රියා කිරීම මේ නමින් හඳුන්වයි. රෝගී පුද්ගලයින්ට රජයේ ආධාර ලබාදෙන අවස්ථාවකදී රජයේ වෛද්‍යවරයකුගෙන් ව්‍යාජ සහතිකයක් ලබාගෙන එම ආධාර ලබා ගැනීමට කටයුතු කිරීම මෙම ස්වරූපයේ වරදකි.

### බලහත්කාරය

යම් ක්‍රියාවක් කිරීම හෝ නොකර සිටීම සඳහා යම් වටිනා දෙයක් හෝ මුදලක් ලබා දෙන ලෙසට බල කිරීම බලහත්කාරයයි. මෙය නොකර සිටීම ශාරීරික වදහිංසා හා තුවාලවීම් දක්වා බරපතළ විය හැකිය. රෝගාතුරව රෝහල්ගතව සිටින කාන්තාවක් වෛද්‍යවරයාව කැඳවන ලෙස ඉල්ලූ විට, තමාට ඒ සඳහා මුදලක් ගෙවන ලෙස භාර හෙදිය බල කිරීම මේ ස්වරූපයේ වරදක් වේ. එය නොකර සිටීමෙන් අදාළ කාන්තාව මියයෑමටද හැකිය.

### තීරණ ගැනීමේ බලය අනිසි ලෙස භාවිතය

යමෙකුට තම බලය භාවිත කරමින් කණ්ඩායමකට අනියම් අනුග්‍රහයක් දැක්වීම හෝ කණ්ඩායමෙන් වෙනස් කොට සැලකීම මෙම වරදට අයත්ය. නීතිය වැරදි ලෙස භාවිත කරන විට හෝ යම් සුවිශේෂී තීරණයන් සාධාරණීකරණය කිරීමට විධිමත් නීති හෝ ක්‍රමවේදයන් නොමැති විට නිතරම බලය අනිසි ලෙස භාවිත කිරීම් දක්නට ලැබේ.

### අවශ්‍යතා පිළිබඳ ගැටුමෙන් අයුතු ලාභ ඉපයීම/ඇතුළත වෙළඳාම

අයුතු ධනවත් වීමේ අරමුණින් යමෙකුගේ නිලයට අයත් නොවන්නාවූ ගනුදෙනුවක නිරත වීම, තත්වයක් හෝ වෙළඳ ලාභයක් ලැබීම මින් අදහස් වේ. උදාහරණ ලෙස රාජ්‍ය නිලධාරියෙකු තමන්ට ලැබුණ තොරතුරු මත රජය යම් ප්‍රදේශයක විශාල සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යන බව දැන ගනී. ඔහු එම ප්‍රදේශයෙන් විශාල ඉඩමක් මිල දී ගෙන එම ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවසර ලබාදීම සඳහා මුල් වී ක්‍රියා කරයි. මෙම ව්‍යපෘතියේ අරමුණ සාමාන්‍ය ජනතාවට පහසුකම් සැපයීම වුවද රජයේ නිලධාරියා ඉන් අයුතු ලෙස විශාල ලාභයක් ලබයි.

### නීති විරෝධී සන්තෝසම්, පාරිතෝෂික, කොමිස් ලබා ගැනීම

රජය සමග යම් කටයුත්තක් කිරීමට බලාපොරොත්තු වන පාර්ශවයකින් යම් වටිනාකමක්, මුදලක්, ලාභයක් ලබාගැනීම මෙයින් අදහස් වේ. රජයේ නිලධාරියකු ටෙන්ඩර් අනුමත කිරීම සඳහා මුදල් හෝ කොමිස් ඉල්ලීම උදාහරණ වේ.

### අනිසි පක්ෂපාතීත්වය

පෞද්ගලික දැනීම, පක්ෂ හිතවත්කම්, ජාතිය, ආගම, කුලය හෝ වෙනත් කැමැත්තක් හේතු කොටගෙන රජයේ නිලධාරියකු සේවාවක් හෝ සම්පත් ලබාදීමක් මෙයට අයත්ය. දේශපාලන සම්බන්ධතා මත රැකියා දීම සේවාවන් ලබා දීම මේ ගණයට වැටේ. මෙහි සුවිශේෂත්වය නම් සමාන්‍ය ජනතාවට නොලැබෙන ආකාරයේ සුවිශේෂ සැලකීමක් පෞද්ගලික කැමැත්ත මත රජයේ නිලධාරියාගේ හිතවතාට ලැබීමයි. මහජන දේපළ අවිධිමත්ව හා අක්‍රමවත්ව බෙදීයෑම මේ නිසා සිදු වේ.

### ඥාති සංග්‍රහ

රජයේ නිලධාරියාට ඇති ඥාතීත්වය නිසාම රජයේ තනතුරුවලට පත් කිරීම හෝ වෙනත් වාසි අත් කර දීම මෙහි ස්වභාවයයි. දේශපාලඥයින් තම නෑදෑ හිතවතුන් තම අමාත්‍යාංශවලට පත් කර ගැනීම මෙයට උදාහරණ වේ. මෙය රජයක ස්ථාවරත්වය හා සාමූහිකත්වයට අහිතකර ලෙස බලපායි.

## නීති විරෝධි ප්‍රදානයන්

දේශපාලන පක්ෂවලට හෝ ආණ්ඩු බලය හිමි පක්ෂවලට යම් යම් කටයුතුවලට මැදිහත් නොවීම වෙනුවෙන් ලැබෙන ප්‍රදානයන් මේ ගණයට අයත් වේ. රාජ්‍ය නිලධාරියකුගේ වගවීම පැහැර හැරීම වෙනුවෙන් ලැබෙන ප්‍රදානයන්ද, එක් ආකාරයක අල්ලසකි.

# PPT-03 දූෂණයේ බලපෑම සහ එහි ප්‍රතිවිපාක

**දූෂණයේ බලපෑම සහ ප්‍රතිවිපාක**

PPT - 03

1

## දූෂණය

- විශ්වීයව ක්‍රියාත්මක වෙමින් පවත්නා සංසිද්ධියකි.
- සමස්ත සමාජය පුරා පැතිරී ඇති දරුණු පිළිකාවක් බඳු සමාජ ව්‍යසනයකි.
- ලෝකය පුරා ආගමික,සංස්කෘතික,ජාතික,භූගෝලීය ආදී විවිධ විෂමතා අභිබවමින් වෛරසයක් ලෙස පැතිරී ඇත.

2

ලෝක බැංකු ආයතනය ගෘහස්ථ මට්ටමින් හා ආයතනික මට්ටමින් රැස්කරගත් තොරතුරු අනුව තක්සේරු කරඇති ආකාරයට,

වසරකට හුවමාරුවන අල්ලස් ප්‍රමාණය ට්‍රිලියන එකක් හෙවත් සමස්ත වියදම් වලින් 3% කි.
මෙම මුදල් ප්‍රමාණය ලෝක දරිද්‍රතාවය වෙනුවෙන් සටන් කිරීමට අවශ්‍ය මුදල් ආධාර ප්‍රමාණය මෙන් 200 ගුණයකි.

- "Governance and Corruption" in Global Crisis වාර්තාව

3

**අල්ලස් සඳහා පමණක් වසරකට ඩොලර් ට්‍රිලියන 1.5 ත් 2 ත් අතර මුදලක් වැයවේ.**

මෙය ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයෙන් දළ වශයෙන් 2% ක තරම් ප්‍රමාණයකි.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) 2016 වාර්තාව

4

**ජාත්‍යන්තර මට්ටමින් හඳුනාගෙන ඇති දූෂණයේ ප්‍රතිවිපාක**

*ඉතා අධික මට්ටමින් සිදුවන දූෂණ ක්‍රියා රටක ආර්ථික ස්ථාවරභාවයට තර්ජනයකි.එය රටේ සංවර්ධනය හීන කරයි.

*දූෂණය දේශීය හා විදේශීය ආයෝජනවල වටිනාකම අහුරන සාධකයක් ලෙස ක්‍රියාකරයි.ගණුදෙණුවල වැය වැඩිකරමින් අවිනිශ්චිත පරිසරයක් නිර්මාණය කරයි.

*දූෂණය මගින් ඵලදායීතාව මැඩ පවත්වයි.එය ආර්ථිකමය වශයෙන් අක්‍රමිකතා සහ අයථා ක්‍රියාවලට මඟ පාදයි.

5

*දූෂණය නිසා පොදු යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය හීන කරවයි.රජය පොදු යටිතල පහසුකම් සඳහා වෙන්කරන මුදල් දූෂණයට ලක්වූවිට එම යටිතල පහසුකම් ගොඩනැංවෙන්නේ ඉතාමත් දුර්වල තත්ත්වයෙනි .

*දූෂණය නිසා රටක මානව හිමිකම් උල්ලංඝණය වෙයි. නිතැතින්ම සුදුස්සාට සුදුසු තැන නොලැබී යයි.දූෂණය යුක්තිය ඉටුවීමට බාධා ඇති කරයි.

6

**දූෂණ සංජනන දර්ශකය (CPI) අනුව ශ්‍රී ලංකාවේ තත්ත්වය**

- ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් දූෂණ සංජනන දර්ශකය අනුව පසුගිය දශක දෙකකට ආසන්න කාල වකවානුව පුරාම ශ්‍රී ලංකාව පවතින්නේ 50% කට වඩා අඩු ලකුණු ප්‍රමාණයකට හිමිකම් කියන (දූෂිතභාවයෙන් වැඩි) රටක් වශයෙනි.


එම දර්ශකය අනුව, 2019 දී ලෝකයේ රටවල් 180 ක් අතර ශ්‍රී ලංකාවට හිමිවී ඇත්තේ 89 වන ස්ථානයයි.2019 වර්ෂයේදී ශ්‍රී ලංකාවට හිමිවී ඇති ලකුණු ප්‍රමාණය 38 කි.


7

## දූෂණ සංජනන දර්ශකය - 2019




8


CPI අනුව ශ්‍රී ලංකාවට හිමි තැන - ස්ථානය ?/180
100
95
90
85
80
75
2010
2012
2014
2016
2018
2020
9


CPI අනුව ශ්‍රී ලංකාවට හිමි තැන- ලකුණු ?/100
42
40
38
36
34
32
30
2010
2012
2014
2016
2018
2020
10

**රාජ්‍ය නිලධාරීන් සඳහා දූෂණ විරෝධී පුහුණු වැඩසටහන**
අත් පත්‍රිකා - අංක 03

# අල්ලස හා දූෂණයේ බලපෑම සහ එහි ප්‍රතිවිපාක

දූෂණය විශ්වීයව ක්‍රියාත්මක වෙමින් පවත්නා සංසිද්ධියකි. එසේම එය සමස්ත සමාජය පුරා පැතිරී ඇති දරුණු පිළිකාවක් බඳු බරපතල සමාජ ව්‍යසනයකි. දූෂණය ලෝකය පුරා ආගමික, සංස්කෘතික, ජාතික, භූගෝලීය ආදී විවිධ විෂමතා අභිබවමින් වෛරසයක් ලෙස පැතිර ගොස් තිබේ. ලෝකයේ සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවලටද පොදු තත්ත්වයක් වන දූෂණය විශේෂයෙන් සම්පත් සීමිත රටවලට වඩාත් විනාශකාරී ලෙස බලපායි.

ලෝක බැංකු ආයතනය (World Bank Institute) ගෘහස්ථ මට්ටමින් හා ආයතනික මට්ටමින් රැස්කරගත් තොරතුරු අනුව තක්සේරු කරඇති ආකාරයට වසරකට හුවමාරුවන අල්ලස් ප්‍රමාණය ට්‍රිලියන එකක් හෙවත් සමස්ත වියදම් වලින් 3% කි. මෙම මුදල් ප්‍රමාණය ලෝක දරිද්‍රතාවය වෙනුවෙන් සටන් කිරීමට අවශ්‍ය මුදල් ආධාර ප්‍රමාණය මෙන් 200 ගුණයක් බවද "Governance and Corruption" in Global Crisis නමින් නිකුත්කර ඇති එම වාර්තාව පෙන්වා දෙයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) 2016 වාර්තාවෙන් ඇස්තමේන්තු කර ඇත්තේ අල්ලස් සඳහා පමණක් වසරකට ඩොලර් ට්‍රිලියන 1.5 ත් 2 ත් අතර මුදලක් වැයවන බවයි. මෙය ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයෙන් දළ වශයෙන් 2% ක තරම් ප්‍රමාණයක් බවද එම වාර්තාව පෙන්වා දෙයි.

**ජාත්‍යන්තර මට්ටමින් හඳුනාගෙන ඇති දූෂණයේ ප්‍රතිවිපාක කිහිපයක්**

- දූෂණය දේශීය හා විදේශීය ආයෝජනවල වටිනාකම අහුරන සාධකයක් ලෙස ක්‍රියාකරන අතර ගණුදෙණුවල වැය වැඩිකිරීමක් සිදුකරමින් අවිනිශ්චිත පරිසරයක් නිර්මාණය කරයි.
- දූෂණය නිසා දේශීය ව්‍යවසායකයන්ට බාධා එල්ලවන අතර ආණ්ඩුවේ අභිමතානුසාරී බල විස්තීර්ණය පැතිරී ඇති අවස්ථාවල මෙය විශේෂයෙන් දක්නට ලැබෙයි.
- දූෂණය මගින් ඵලදායීතාව මැඩ පවත්වයි. එය ආර්ථිකමය වශයෙන් අක්‍රමිකතා සහ අයථා ක්‍රියාවලට මඟ පාදයි.
- දූෂණය නිසා පොදු යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය හීන කරවයි. රජය විසින් පොදු යටිතල පහසුකම් සඳහා වෙන්කරන මුදල් දූෂණයට ලක්වූවිට එම යටිතල පහසුකම් ගොඩනැංවෙන්නේ ඉතාමත් දුර්වල තත්ත්වයෙනි. එසේම මහජන සම්පත් පොදු කටයුතු වලට යොදා ගැනීම, සේවා තත්ත්වය හීනවීම, සම්පත් නිසිලෙස නඩත්තු නොවීම ආදී කාරණාද දූෂණය හා බැඳී පවතී.
- ඉතා අධික මට්ටමින් සිදුවන දූෂණ ක්‍රියා රටක ආර්ථික ස්ථාවරභාවයට තර්ජනයකි. එය රටේ සංවර්ධනය හීන කරයි.
- දූෂණය නිසා රටක මානව හිමිකම් උල්ලංඝණය වෙයි. දූෂණය නිසා නිතැතින්ම සුදුස්සාට සුදුසු තැන නොලැබී යයි. දූෂණය යුක්තිය ඉටුවීමට බාධා ඇති කරයි.
- දූෂණය නිසා සංවිධාත්මක අපරාධ සහ ත්‍රස්තවාදය වර්ධනය වෙයි. මුදල් විශුද්ධිකරණය. රහසිගත මූලාශ්‍ර මගින් ලැබෙන ධනය සහ අල්ලස් මගින් දූෂිත අධිකරණ නිලධාරීන් සහ දූෂිත දේශපාලනඥයින් සමාජයේ සාපරාධී කටයුතු වලට රැකවරණය ලබාදෙයි. මේ නිසා ප්‍රචණ්ඩත්වය, නීති විරෝධී මත් ද්‍රව්‍ය, ගණිකා වෘත්තිය, ලිංගික වහල්භාවය වැනි කාරණාද ඉහළ යයි.
- දූෂණය මගින් දරිද්‍රතාවය සහ අසමානතාවය වර්ධනය කරයි. ජාත්‍යන්තර තෙල් සමාගමක් වන ෂෙල් සම්බන්ධ සුප්‍රසිද්ධ අල්ලස් නඩු විභාගයකදී හෙළිවූයේ නයිජීරියාවේ ජාතික අයවැයටත් වඩා වැඩි මුදලක් දූෂිත නිලධාරීන්ට ෂෙල් සමාගම විසින් ගෙවා ඇති බවය. මෙම අල්ලස නිසා නයිජීරියානු ජනතාවට අහිමිවූ මුදල ඩොලර් බිලියන 11 කි.
- අල්ලස හා දූෂණය රාජ්‍ය ආයතන තුළ පැතිර යාම මගින් එම ආයතන කෙරෙහි මහජනතාව තුළ ඇති ගෞරවය හා විශ්වාසය බිඳ වැටෙයි.

## දූෂණ සංජනන දර්ශකය අනුව ශ්‍රී ලංකාවේ තත්ත්වය

ලෝකයේ එක් එක් රටවල පවත්නා දූෂණයේ ප්‍රමාණය මැන බැලෙන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් දූෂණ සංජනන දර්ශකය (CPI Index) අනුව පසුගිය දශක දෙකකට ආසන්න කාල වකවානුව පුරාම ශ්‍රී ලංකාව පවතින්නේ 50% කට වඩා අඩු ලකුණු ප්‍රමාණයකට හිමිකම් කියන (දූෂිතභාවයෙන් වැඩි) රටක් වශයෙනි, 2019 වසරේදී එම දර්ශකය අනුව, ලෝකයේ රටවල් 180 ක් අතර ශ්‍රී ලංකාවට හිමිවී ඇත්තේ 93 වන ස්ථානයයි. 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාවට හිමිවී ඇති ලකුණු ප්‍රමාණය 38 කි. දූෂණ සංජනන දර්ශකය අනුව 2019 වසරේ ඉහළින්ම පසුවන්නේ ලකුණු 87 බැගින් සම ලකුණු ලබා සිටින නවසීලන්තය සහ ඩෙන්මාර්කයයි. ඊළඟට වැඩිම ලකුණු හිමිවී ඇත්තේ ෆින්ලන්තයටයි. (ලකුණු 86) 2019 වසරේ දූෂණ සංජනන දර්ශකය අනුව ලෝකයේ රටවල් 180 අතර දූෂිත භාවයෙන් වැඩිම රට බවට පත්ව තිබෙන්නේ ලකුණු 9 ක් පමණක් හිමිකරගෙන සිටින සෝමාලියාවයි. එම දර්ශකය අනුව ඊළඟට අඩුම ලකුණු ප්‍රමාණයක් ලබා ඇති රටවල් වන්නේ දකුණු සුඩානය (ලකුණු 12) සහ සිරියාවයි (ලකුණු 13)

දූෂණ සංජනන දර්ශකය විශේෂයෙන් ආයෝජකයින් නිරන්තරයෙන් පරිශීලනය කරන දර්ශකයක් වන අතර යම් රටක් එම දර්ශකයේ පහළින් පවත්නා විට (දූෂිතභාවයෙන් වැඩි රටක් වශයෙන්) එම රටට ආයෝජන ලැබීමට ඇති ඉඩ ප්‍රස්ථා අඩුවේ.

# PPT-04 දූෂණය ජයගැනීම: හොං කොං ආදර්ශය

දූෂණය ජයගැනීම : හොංකොං ආදර්ශය

PPT - 04

1



Hong Kong ,1960

2

## හොංකොං දේශයේ කතාව - වර්ෂ 1960

*1960 දශකය වනවිට ලෝකයේ දූෂිතම පොලිසිය වශයෙන් සැලකුණේ හොංකොං දේශයේ පොලිසියයි.

*පොලිසියට අල්ලස් නොදී කිසිම කාර්යයක් ඉටුකරගැනීමට නොහැකි තත්ත්වයක් රටතුළ පැවැතුණි.

*නීතිය අක්‍රියවී තිබූ අතර සියලු නීති විරෝධී ගණුදෙනු සමඟ පොලිස් ප්‍රධානීන්ටද සබඳතා තිබිණි.

*නීති විරෝධී ජාවාරම්වල සැකකරුවන් ධනවතුන් නම් ඔවුන් කිසිවෙක් අත්අඩංගුවට පත් වූයේ නැත.ඔවුන්ට එරෙහිව නඩු පැවැරීම්ද සිදු නොවීය.

3



4

හොංකොං පොලිසියේ **ප්‍රධාන පොලිස් අධිකාරී පීටර් ගොඩ්බර්** හොංකොං ඩොලර් මිලියන 4.3 කට වඩා වැඩි මුදලක් අල්ලස් වශයෙන් උපයා ඇති බවට චෝදනා එල්ලවිය.

විමර්ශන වලින් මඟහැරීමට ඔහු වහාම එංගලන්තයට පැන ගියේය.



5

**ගොඩ්බර් සිද්ධියත්** සමඟ රජය දූෂණයට එරෙහිව කටයුතු කළයුතු බවට විශාල මහජන උද්ඝෝෂණ ඇතිවිය.

ගොඩ්බර් ආපසු ගෙන්වා අත්අඩංගුවට ගෙන නීතිය ක්‍රියාත්මක කරන්නැයි ඔවුහු රජයට බලකළහ.

මෙම විරෝධතා ව්‍යාපාරවල ඉදිරියෙන්ම සිටි පිරිස වූයේ ශිෂ්‍යයෝය.




6



7

## හොංකොං ස්වාධීන දූෂණ විරෝධී කොමිසම (ICAC) ඇරඹෙයි.

1974 දී හොංකොං රජය ස්වාධීන දූෂණ විරෝධී කොමිසම (ICAC) ස්ථාපනය කරන ලදී.

“හොංකොං රාජ්‍යය සාධාරණ යුක්තිගරුක,ස්ථාවර සහ සෞභාග්‍යමත් ලෙස පවත්වා ගැනීමට උපකාර කිරීමට ඵලදායක නීති ක්‍රියාත්මක කිරීම,අධ්‍යාපනය සහ නිවාරණය තුළින් ස්වාධීන දූෂණ විරෝධී කොමිසම ප්‍රජාව සමඟ දූෂණයට එරෙහිව සටන් කිරීමට කැපවී සිටින බව ” ICAC මෙහෙවර ප්‍රකාශයෙන් කියැවිණි.

8




9

ICAC කොමිසමේ ප්‍රථම ප්‍රධානියා වශයෙන් ජැක් කාටර් (Jack Carter) පත් කරනු ලැබීය.

එතෙක් පොලිසිය සතුව තිබූ දූෂණ විමර්ශන බලතල ICAC කොමිසමට හිමිවිය.

කොමිසමේ ප්‍රථම කාර්යය වශයෙන් **ගොඩ්බර් ට එරෙහි** පරීක්ෂණ කටයුතු ඇරඹිණ.



10

**ICAC ඉල්ලීම අනුව ප්‍රධාන පොලිස් අධිකාරී පීටර් ගොඩ්බර් එංගලන්තයෙන් හොංකොං වෙත භාරදෙනු ලැබීය.**

**චෝදනා පිළිබඳව සිදුකෙරුණ පරීක්ෂණයෙන් වරදකරු වූ ඔහුට සිරදඬුවම් නියමවිය.**




11




චෝදනාවට වරදකරු වීමෙන් අනතුරුව

**ප්‍රධාන පොලිස් අධිකාරී පීටර් ගොඩ්බර් ගේ ධනය රාජ සන්තක කරන ලදී.**



12

## වත්මන් හොංකොං දේශය - 2020



13

- වර්තමානය වනවිට හොංකොං දේශය ලොව දියුණුම රටවල් අතරින් එකකි.
- ICAC කොමිසම වර්තමානයේදීද ඉතා සක්‍රීය අයුරින් ක්‍රියාත්මක වෙයි.
- ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් දූෂණ සංජනන දර්ශකය අනුව හොංකොං දේශය පසුගිය දශක දෙකක කාලය පුරාම දූෂණය අවම කරගැනීමට සමත්වී ඇති මුල් පෙළේ රටවල් 20 ට අයත් වන රටකි.



14

# PPT-05 දූෂණයට වැටබඳින නීති රීති

**දූෂණයට වැටබඳින නීති රීති**

PPT - 05

1

ශ්‍රී ලංකාවේ **අල්ලස් හෝ දූෂණ** වැරදි සහ **වත්කම් හෝ බැරකම්** ප්‍රකාශ කිරීමේ පනත යටතේ වැරදි සම්බන්ධයෙන් විමර්ශන කිරීමේ හා නඩු පැවැරීමේ ප්‍රමුඛ නෛතික බලය හිමි වී ඇත්තේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවටය. (CIABOC)

(1954 අංක11 දරන අල්ලස් පනත සහ 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත් අනුව ).

*අල්ලස් හෝ දූෂණ පිළිබඳ වරද වරෙන්තුවක් නොමැතිව පුද්ගලයෙකු අත්අඩංගුවට ගතහැකි වරදකි.

2

**අල්ලස් පනතට අතිරේකව දූෂණය අවම කිරීමේ තවත් ප්‍රතිපාදන රැසක් ශ්‍රී ලාංකික නීති පද්ධතිය තුළ පවතී.**

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

"පොදු දේපළ සුරක්ෂිත කොට ආරක්ෂා කිරීමද,පොදු දේපළ අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීම සහ නාස්ති කිරීමට එරෙහිව ක්‍රියා කිරීමද ශ්‍රී ලංකාවාසී සෑම තැනැත්තෙකුගේම යුතුකම වන්නේය."

- 28 (1) වගන්තිය

3

**“රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුය.”**

*රජය සතුව ඒකාබද්ධ අරමුදලක් පවතින අතර එම අරමුදලෙන් මුදල් ඉවත් කර ගැනීම සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තු පාලනයට යටත්ව සිදු වේ.

*පාර්ලිමේන්තු ස්ථාවර කමිටු මගින් එම වියදම් කිරීම් අනුමත නීති රීතිවලට අනුව සිදු කර ඇත්දැයි විමර්ශනය කරනු ලැබේ.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII පරිච්ඡේදය

4

## විගණකාධිපතිවරයා

*රාජ්‍ය මූල්‍ය පිළිබඳව කටයුතු කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව මගින් විගණකාධිපතිවරයා පත් කර ඇත.

*ව්‍යවස්ථාවේ 154 (1) බලතල අනුව පළාත් පාලන ආයතන ඇතුළුව රජයේ සියලුම ආයතනවල හා රාජ්‍ය ගිණුම් විගණනය කිරීමේ බලතල විගණකාධිපති වරයාට හිමි වේ.

* විගණකාධිපතිවරයාගේ විගණන වාර්තා වාර්ෂිකව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් මහජනතාවගේද දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලැබේ.

* විගණනයේදී හෙළි වන දූෂණ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම හා නඩු පැවැරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබේ.

* මූල්‍ය කටයුතු පිළිබඳ ක්‍රියා කරන පාර්ලිමේන්තු ස්ථාවර කමිටු දෙක වන රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාව හා රාජ්‍ය ගිණුම් කාරක සභාව රාජ්‍ය ආයතන පිළිබඳව විමර්ශන සිදුකරන්නේද විගණකාධිපතිවරයාගේ වාර්තාව පදනම් කර ගෙනය.

5

## දණ්ඩ නීති සංග්‍රහය (15 වන අධිකාරය)

*අල්ලස අපරාධ වරදක් බවට හඳුන්වා දුන් පළමු නීතිය වන්නේ 1889 වර්ෂයේදී සම්මත කරන ලද දණ්ඩ නීති සංග්‍රහයයි. එහි IX වන පරිච්ඡේදය වෙන්ව ඇත්තේ, **“රජයේ සේවකයින් විසින් කරනු ලබන වැරදි හෝ රජයේ සේවකයින් සම්බන්ධ වැරදි”**වෙනුවෙනි.

*දණ්ඩ නීති සංග්‍රහයේ 158 වගන්තිය අනුව රජයේ සේවකයෙකු නිල ක්‍රියාවක් සම්බන්ධයෙන් නීත්‍යානුකූල ගෙවීමක් හැර තුටු පඬුරක් භාර ගැනීම වසර තුනක සිර දඬුවම් හා දඩයකින් දඬුවම් ලැබිය හැකි වරදකි.

6

## මැතිවරණ පනත්

1981 අංක 15 දරන ජනාධිපතිවරණ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මහ මැතිවරණ පනත, 1988 අංක 2 පළාත් සභා ඡන්ද විමසීම් පනත හා 1946 අංක 55 දරන පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනත අනුව,

* ඡන්ද විමසීමකදී නිදහස්ව ඡන්දය භාවිත කිරීම වැළැක්වීම සඳහා අල්ලස් දීම, සංග්‍රහ කිරීම හා අයුතු බලපෑම වරදකි. මෙම වැරදි එම පනත්වල දක්වා ඇති දූෂණ ක්‍රියා නැමති වැරදි ගණයට අයත්වන අතර එවැනි වරදකට වරදකරු වුවහොත් සිර දඬුවමට හා දඩයට අමතරව වසර හතක කාලයක් ඡන්දදායකයකු ලෙස ලියාපදිංචි වීම, ඡන්දය භාවිත කිරීම හා අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීම තහනම් වේ.

7

## වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත

(1975 අංක 01)

පනත අනුව,

*වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ වගකීම දරන තැනැත්තන් නිවැරදිව සම්පූර්ණ කරන ලද වත්කම් බැරකම් ප්‍රකාශ ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතුය.

*වත්කම් හා බැරකම් ප්‍රකාශයට පත් කළ යුතු වූ තැනැත්තෙකු සාධාරණ හේතුවකින් තොරව එලෙස ප්‍රකාශ කිරීමට අපොහොසත් වීම, වත්කම් බැරකම් ප්‍රකාශයේ අසත්‍ය තොරතුරු ඇතුළත් කිරීම, ඕනෑකමින්ම වත්කමක් හෝ බැරකමක් ප්‍රකාශ නොකිරීම, එම පනතේ යම් විධිවිධානයකට එරෙහිව කටයුතු කිරීම දඬුවම් හිමි විය යුතු වැරදි වේ.

8

## පොදු දේපළ විෂයෙහිලා සිදු කරන වැරදි පිළිබඳ පනත

1982 අංක 12 දරන මෙම පනතට අනුව,

- පොදු දේපළ විෂයෙහි අනර්ථය සිදු කිරීම, පොදු දේපළ සොරකම් කිරීම, පොදු දේපළ කොල්ලකෑම,පොදු දේපළ විෂයෙහි වංක ව්‍යාපහරණය සාපරාධී විශ්වාසය කඩකිරීම, ව්‍යාජ ලේඛන සෑදීම සහ ගිණුම් වරදවා පෙන්වීම **අපරාධ වැරදි** ලෙස හඳුනාගෙන ඇත.

- පොදු දේපළ යන්නෙන් ආණ්ඩුවේ දේපළද ,යම් දෙපාර්තමේන්තුවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රාජ්‍ය සංස්ථාවක, සමූපකාර සමිතියක හෝ සමූපකාර සංගමයක දේපළ අදහස් වේ.

- චෝදනාවට අදාළ දේපළෙහි වටිනාකම රුපියල් 25,000කට වඩා වැඩි වන අවස්ථාවකදී මෙවැනි වරදකට අත් අඩංගුවට පත්වූ අයකුට ඇප ලබාදිය හැක්කේ සුවිශේෂී කරුණු මත පමණි.

9

ප්‍රශ්න / ගැටලු ?

-ස්තුතියි.

10

## දූෂණයට වැට බඳින නීති රීති

අත් පත්‍රිකා - අංක 04

ශ්‍රී ලංකාවේ අල්ලස් හෝ දූෂණ වැරදි සහ වත්කම් හෝ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ වැරදි සම්බන්ධයෙන් විමර්ශන කිරීමේ හා නඩු පැවරීමේ ප්‍රමුඛ නෛතික බලය හිමි වී ඇත්තේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට (CIABOC) ය. ඒ 1954 අංක11 දරන අල්ලස් පනත, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත සහ 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේය. ඒ අනුව අල්ලස් හෝ දූෂණ පිටුදැකීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම පනත ලෙස අල්ලස් පනත හැඳින්විය හැකිය. එම පනතට අනුව අල්ලස් හෝ දූෂණ පිළිබඳ වරද වරෙන්තුවක් නොමැතිව පුද්ගලයෙකු අත්අඩංගුවට ගතහැකි වරදකි. අල්ලස් පනත සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතට අතිරේකව දූසැරිය හෙවත් දූෂණය අවම කිරීම සඳහා ආධාර කර ගතහැකි තවත් නීතිමය ප්‍රතිපාදන රැසක් ශ්‍රී ලාංකික නීති පද්ධතිය තුළ පවතී. එම ප්‍රතිපාදන අතරින් කිහිපයක් මෙසේය.

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

රටේ උත්තරීතර ලියැවිල්ල වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ 28 (1) වගන්තිය ජනතාවගේ මූලික යුතුකම් හා වගකීම් පිළිබඳව දක්වමින්,

"පොදු දේපළ සුරක්ෂිත කොට ආරක්ෂා කිරීමද,පොදු දේපළ අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීම සහ නාස්ති කිරීමට එරෙහිව ක්‍රියා කිරීමද ශ්‍රී ලංකාවාසී සෑම තැනැත්තෙකුගේම යුතුකම වන්නේය." යි සඳහන් කර තිබේ.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVll පරිච්ඡේදයට අනුව, රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුය. ඒ අනුව රජය සතුව ඒකාබද්ධ අරමුදලක් පවතින අතර එම අරමුදලෙන් මුදල් ඉවත් කර ගැනීම සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තු පාලනයට යටත්ව සිදු වේ. පාර්ලිමේන්තු ස්ථාවර කමිටු මගින් එම වියදම් කිරීම් අනුමත නීති රීතිවලට අනුව සිදු කර ඇත්දැයි විමර්ශනය කරනු ලැබේ.

රාජ්‍ය මූල්‍ය පිළිබඳව කටයුතු කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව මගින් විගණකාධිපතිවරයා පත් කර ඇති අතර ව්‍යවස්ථාවේ 154 (1) බලතල ප්‍රකාරව පළාත් පාලන ආයතන ඇතුළුව රජයේ සියලුම ආයතනවල හා රාජ්‍ය ගිණුම් සමාගම් විගණනය කිරීමේ බලතල විගණකාධිපති වරයාට හෝ ඔහුගේ අධිකාරය යටතේ ක්‍රියාකරන ඕනෑම තැනැත්තෙකුට හිමි වී තිබේ. විගණකාධිපතිවරයාගේ විගණන වාර්තා වාර්ෂිකව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් මහජනතාවගේද දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කරන අතර එහි දී හෙළි වන දූෂණ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම හා නඩු පැවරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබේ. එසේම පාර්ලිමේන්තුවේ මූල්‍ය කටයුතු පිළිබඳ ක්‍රියා කරන ස්ථාවර කමිටු දෙක වන රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාව හා රාජ්‍ය ගිණුම් කාරක සභාව, රාජ්‍ය ආයතන පිළිබඳව විමර්ශන සිදුකරන්නේද විගණකාධිපතිවරයාගේ වාර්තාව පදනම් කර ගෙනය.

### දණ්ඩ නීති සංග්‍රහය (15 වන අධිකාරය)

අල්ලස අපරාධ වරදක් බවට හඳුන්වා දුන් පළමු නීතිය වන්නේ 1889 වර්ෂයේදී සම්මත කරන ලද දණ්ඩ නීති සංග්‍රහයයි. එහි IX වන පරිච්ඡේදය වෙන්ව ඇත්තේ "රජයේ සේවකයින් විසින් කරනු ලබන වැරදි හෝ රජයේ සේවකයින් සම්බන්ධ වැරදි වෙනුවෙනි.

දණ්ඩ නීති සංග්‍රහයේ 158 වගන්තිය අනුව රජයේ සේවකයෙකු නිල ක්‍රියාවක් සම්බන්ධයෙන් නීත්‍යානුකූල ගෙවීමක් හැර තුටු පඬුරක් භාර ගැනීම වසර තුනක සිර දඬුවම් හා දඩයකින් දඬුවම් ලැබිය හැකි වරදකි. දූෂිත හෝ නීති විරෝධී මාර්ගවලින් රජයේ සේවකයෙකුට බලපෑම සඳහා තුටු පඬුරක් භාර ගැනීම (159 වගන්තිය), යම් තැනැත්තෙකුට හෝ ආණ්ඩුවට පාඩුවක් කිරීමේ චේතනාවෙන් නීතියේ නියමයකට රජයේ සේවකයෙකු අකීකරුවීම (162 වගන්තිය), රජයේ සේවකයෙකු විසින් සාපරාධී විශ්වාසය කඩ කිරීම (392 වගන්තිය), ආදී තවත් වැරදි රැසක්ද එහි අපරාධ වැරදි ලෙස දක්වා තිබේ.

1954 අංක 11 දරන අල්ලස් පනත නීතිගත වීමෙන් පසුව දණ්ඩ නීති සංග්‍රහයේ ප්‍රතිපාදන භාවිත නොකර

අල්ලස් පනතේ ප්‍රතිපාදන භාවිත කරනු ලැබීය.

### මැතිවරණ පනත්

1981 අංක 15 දරන ජනාධිපතිවරණ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මහ මැතිවරණ පනත, 1988 අංක 2 පළාත් සභා ඡන්ද විමසීම් පනත හා 1946 අංක 55 දරන පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනත අනුව ඡන්ද විමසීමකදී නිදහස්ව ඡන්දය භාවිත කිරීම වැළැක්වීම සඳහා අල්ලස් දීම, සංග්‍රහ කිරීම හා අයුතු බලපෑම වරදක් ලෙස දක්වා ඇත. මෙම වැරදි එම පනත්වල දක්වා ඇති දූෂණ ක්‍රියා නැමති වැරදි ගණයට වැටෙන අතර එවැනි වරදකට වරදකරු වුවහොත් සිර දඬුවමට හා දඩයට අමතරව වසර හතක කාලයක් ඡන්දදායකයකු ලෙස ලියාපදිංචි වීම, ඡන්දය භාවිත කිරීම හා අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීම තහනම් වේ.

### වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත

1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව, වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ වගකීම දරන තැනැත්තන් විසින් නිවැරදිව සම්පූර්ණ කරන ලද වත්කම් බැරකම් ප්‍රකාශ අදාළ ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතුය.

වත්කම් හා බැරකම් ප්‍රකාශයට පත් කළ යුතු වූ තැනැත්තෙකු විසින් සාධාරණ හේතුවකින් තොරව එලෙස ප්‍රකාශ කිරීමට අපොහොසත් වීම, වත්කම් බැරකම් ප්‍රකාශයේ අසත්‍ය තොරතුරු ඇතුළත් කිරීම, ඕනෑකමින්ම වත්කමක් හෝ බැරකමක් ප්‍රකාශ නොකිරීම, එම පනතේ යම් විධිවිධානයකට එරෙහිව කටයුතු කිරීම යනාදී වැරදි පනත යටතේ දඬුවම් හිමි විය යුතු වැරදි වේ. වත්කම් බැරකම් ප්‍රකාශ කළ යුතු තැනැත්තෙකු මුල් වත්කම් බැරකම් ප්‍රකාශයෙන් පසු වසරක් පාසා එම ප්‍රකාශන සිදු කිරීමේ වගකීමකින් බැඳෙන අතර මුල් වත්කම් බැරකම් ප්‍රකාශය හා ඊළඟ වත්කම් බැරකම් ප්‍රකාශ අතර ඇති වෙනස පැහැදිලි කිරීම එම තැනැත්තාගේ වගකීමක් වේ.

මේ අනුව අල්ලස් හෝ දූෂණ ක්‍රියාවලින් උපයාගනු ලබන ධනය නීත්‍යානුකූල ඉපයීමක් බව තහවුරු කිරීමට නොහැකි වීම මත පනතේ ප්‍රතිපාදන අනුව එම තැනැත්තා වරදකරුවෙකු  බවට පත් වේ.

### 1982 අංක 12 දරන පොදු දේපළ විෂයෙහිලා සිදු කරන වැරදි පිළිබඳ පනත

මෙම පනතට අනුව පොදු දේපළ විෂයෙහි අනර්ථය සිදු කිරීම, පොදු දේපළ සොරකම් කිරීම, පොදු දේපළ කොල්ලකෑම, පොදු දේපළ විෂයෙහි වංක ව්‍යාපහරණය, සාපරාධී විශ්වාසය කඩකිරීම, ව්‍යාජ ලේඛන සෑදීම සහ ගිණුම් වරදවා පෙන්වීම අපරාධ වැරදි ලෙස හඳුනාගෙන ඇත.

පනතට අනුව පොදු දේපළ යන්නෙන් ආණ්ඩුවේ දේපළද, යම් දෙපාර්තමේන්තුවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රාජ්‍ය සංස්ථාවක, සමූපකාර සමිතියක හෝ සමූපකාර සංගමයක දේපළ අදහස් වේ.

චෝදනාවට  අදාළ දේපළෙහි වටිනාකම රුපියල් 25,000කට වඩා වැඩි වන අවස්ථාවකදී මෙවැනි වරදකට අත් අඩංගුවට පත්වූ අයෙකුට ඇප ලබාදිය හැක්කේ සුවිශේෂී කරුණු මත පමණි.

### මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත - 2006 අංක 05

අල්ලස හා දූෂණය මගින් උපයා ගන්නා ලද ධනය සෘජුවම ඉදිරිපත් කිරීමේදී සමාජයේ සැක සංකා මතු වන බැවින් එවැනි පිරිස් අල්ලස හා දූෂණයෙන් උපයාගන්නා ධනය වෙනස් ගනුදෙනුවලට භාජනය කර සමාජයට ඉදිරිපත් කරනු ලැබේ. එය මුදල් විශුද්ධිකරණය ලෙස හැඳින්වේ. දූෂණය මැඩලීමේදී මුදල් විශුද්ධිකරණය වැළැක්වීම ප්‍රමුඛ අවශ්‍යතාවකි.

මෙම පනතට අනුව මුදල් විශුද්ධිකරණය අපරාධ වරදක් ලෙස හඳුනාගෙන ඇති අතර එවැනි වැරදි පිළිබඳව මහාධිකරණයකදී නඩු විභාග කළ යුතුය. වරදකරු වන තැනැත්තෙකුට විශුද්ධිකරණය කළ දේපළහි වටිනාකම මෙන් තුන්ගුණයක දඩයක්ද, වසර පහ සිට විස්ස දක්වා සිරදඬුවම්ද, නියම කරනු ලැබේ. එසේම මුදල් විශුද්ධිකරණයෙන් උපයාගත් දේපළ රාජසන්තක කෙරේ.

### 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත

විනිවිදභාවය වර්ධනය කිරීම දූෂණය වැළැක්වීමේ ප්‍රමුඛ අවශ්‍යතාවකි. පොදු අධිකාරීන්ගේ විනිවිදභාවය හා වගවීම වර්ධනය කිරීම සඳහා සම්මත කරන ලද තොරතුරු අයිතිවාසිකම් පනත මගින් සියලු පුරවැසියන්ට පොදු අධිකාරීන්ගේ භාරයේ සන්තකයේ හෝ පාලනයේ පවතින තොරතුරු ලබාගැනීම සඳහා ක්‍රමවේදයන් හඳුන්වා දී ඇත. එසේම පනත මගින් පුරවැසියන්ට පොදු අධිකාරීන්ගේ තොරතුරු ඉල්ලා ලබාගැනීමට ප්‍රතිපාදන සලස්වා ඇති අතර පුරවැසියන්ට නිරන්තරයෙන් අවශ්‍ය වන තොරතුරු ප්‍රගාමීව ප්‍රසිද්ධ කිරීමේ වගකීම පොදු අධිකාරීන් වෙත පවරා ඇත.

බඳවාගැනීම්, උසස්වීම්, ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් සහනාධාර ක්‍රියාවලිය වැනි තොරතුරු බාධාවකින් තොරව ජනතාවට ලැබෙන විට දූෂණය අවම කිරීමේ හැකියාව ඇත. එසේම පනත මගින් යම් ආකාරයකට දූෂණයට එරෙහිව හඬනගන්නන්ට ආරක්ෂාවක් සලසා දී තිබේ.

ඉහත නෛතික ප්‍රතිපාදනවලට අතිරේකව ජාතික විගණන කොමිෂන් සභා පනත, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත, විශේෂ ජනාධිපති කොමිෂන් සභා නීතිය, මූල්‍ය රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ආදී ප්‍රතිපාදන මගින්ද දූෂණයට වැට බඳින නීති රීති රැසක් හඳුන්වා දී තිබේ.

# PPT-06 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාවේ බලතල හා කාර්යභාරය (CIABOC)


අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ
කොමිෂන් සභාව
(CIABOC)

PPT - 05

1


අල්ලස් කොමිෂන් සභාවේ
ව්‍යුහය

2




3

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව.
කොමිෂන් සභාවේ සංයුතිය.




1994/19 පනතේ 3(2) (අ) වගන්තිය

4

- අල්ලස් පනත
- වත්කම් හා බැරකම් නීතිය
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත

ඉහත පනත් සහ නීති යටතේ මෙම කොමිෂන් සභාවට ක්‍රියාත්මක වීමේ බලතල හිමිව ඇත.

5

බලතල

- සියලු ලිඛිත / වාචික සාක්ෂි ලබා ගැනීම.
- ඉහත කාරණා සඳහා කොමිෂන් සභාවට පැමිණෙන ලෙස හෝ දිවුරුම් පිට වාචිකව පිළිතුරු දෙන ලෙස නියම කිරීම.
- තම සන්තකයෙහි හෝ පාලනයෙහි තිබෙන ලේඛන / වෙනත් දෙයක් ඉදිරිපත් කිරීමට වෙනත් කෙනෙක් කැඳවීම.
- වත්කම් රැස්කිරීම ගැන තිරතුරු ඇතිවිටක එම තැනැත්තන්ගේ / භාර්යාවගේ / දරුවන්ගේ බැංකුපොත් හෝ චෙක්පොත් හෝ සහතික පිටපත් ලබා දෙන ලෙස බැංකු කළමනාකාරීත්වයට නියෝග කිරීම.

6

- දේශීය අදායම් කොමසාරිස් වරයාට විධානය කිරීම.
- ආණ්ඩුවේ ආයතනයක් භාරව සිටින තැනැත්තාට එකී දෙපාර්තමේන්තුවේ ඇති යම ලේඛනයක් හෝ එහි පිටපතක් ලබා දෙන ලෙස විධානය කිරීම.
- වත්කම් විමර්ශන පැවැත්වෙන අවස්ථාවල ඒ තැනැත්තාට දිවිරුම්පිට කරනලද ප්‍රකාශයක් ලියවිල්ලකින් ඉදිරිපත් කිරීමට විධානය කිරීම.
- විමර්ශනය පැවැත්වෙන අවස්ථාවක අදාළ තැනැත්තාගේ විදේශ ගමන් බලපත්‍රය සහ වෙනත් ලේඛන මාස 3 ක් නොඉක්මවන කාලයකට තහනම් කරන ලෙස ආගමන විගමන පාලකයාට නියෝග කිරීම.

7

අල්ලස් පනත

8

## අල්ලස යනු කුමක්ද..?

රජයේ සේවකයෙකු විසින් හෝ රජයේ සේවකයෙකු වෙනුවෙන් නීත්‍යානුකූල නොවන තුටුපඬුරක් ඉල්ලීම හෝ ලබා ගැනීම සහ රජයේ සේවකයෙකු වෙත හෝ ඔහු වෙනුවෙන් නීත්‍යානුකූල නොවන තුටුපඬුරක් පිරිනැමීම හෝ පිරිනැමීමට තැත් කිරීම අල්ලසකි.

90 වන වගන්තිය.

9

## අල්ලස වරදක් ද..?

තුටුපඬුරු අයැදීම,ලබා ගැනීම,පිරිනැමීම හෝ පිරිනැමීමට තැත්කිරීම රජයේ සේවකයෙකුගේ නිල කාර්යයක් ඉටු කිරීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් වන්නේ නම් එය අල්ලස් පනත යටතේ වරදකි.

10

## නිල කාර්යය ඉටු කිරීම

නිල කාර්යය ඉටුකිරීම යන්නට එය ඉක්මන් කිරීම, ප්‍රමාද කිරීම, ඉටු කිරීමට බාධා කිරීම, ඉටු කිරීම වැලැක්වීම, ඉටු කිරීමේදී පක්ෂග්‍රාහී වීම මෙන්ම නිල කාර්යයක් ඉටු නොකර සිටීමක්ද ඇතුලත් වේ.

11

## අල්ලස = තෑග්ග ?

- අල්ලස සහ තෑග්ග අතර පැහැදිලි වෙනසක් ඇත.
- තෑග්ගක් පිරිනැමීමේදී හෝ බාර ගැනීමේදී එතන කිසිදු වරද කාරී අදහසක් නැත. අල්ලසකදී සැමවිටම වරද කාරී අදහසක් ඇත.

12

## අල්ලස් පිළබඳ වැරදි

**14** අධිකරණ නිලධාරීන් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සම්බන්ධයෙන් වූ අල්ලස්.

**15** රජයේ සේවකයෙකු සම්මුඛ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් තුටු පඬුර බාර ගැනීම.

**16 / 17** පොලිස් නිලධරයන් සාම නිලධරයන් වෙනත් රජයේ සේවකයන් සම්බන්ධයෙන් වූ අල්ලස්.

**18** ටෙන්ඩර් පත්‍ර අවලංගු කරගැනීම පිණිස වූ අල්ලස්.

13

19 ආණ්ඩුවේ කටයුතු සම්බන්ධ වූ අල්ලස්.

**20** ඉල්ලීම් ගෙවීම්, පත කිරීම්, සේවයෙහි යෙදවීම, ප්‍රධාන බදු දීම් සහ වෙනත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් වූ අල්ලස්.

**21** ආණ්ඩුව සමග ගනුදෙනු ඇති තැනැත්තන් විසින් රජයේ සේවකයන්ට දෙන අල්ලස්.

**22** පළාත් පාලන ආයතනයක හෝ උපලේඛණ ගත ආයතනයක හෝ උපලේඛණ ගත ආයතනයක පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු සඳහා වූ අල්ලස් සහ පළාත් පාලන ආයතනයක හෝ එබඳු ආයතනයක නිලධාරීයකු හෝ සේවකයෙකු සඳහා වූ අල්ලස්.

14

**23** පළාත් පාලන ආයතනයක හෝ උපලේඛණ ගත ආයතනයක හෝ උපලේඛණ ගත ආයතනයක පාලක මණ්ඩලයේ සාමාජිකයෙකුගේ ඡන්දය කෙරෙහි බලපෑම පිණිස තර්ජනය කිරීම හෝ වංචා කිරීම.

**23 අ** අල්ලස් වලින් අත්කරගත් දේපල හෝ අල්ලස් වලින් අත්කරගත් දේපලින් පරිවර්තනය කර ඇති හෝ කර තිබූ දේපල ලෙස මෙම වගන්තිය යටතේ සැලකෙන දේපල අයත්ව සිටීම හෝ අයත්ව සිටි බව වරදක් වියයුතු බව

**25** මෙම කොටස යටතේ වූ වරදක් කිරීමට තැත් කිරීම සහ අනුබල දීම.

15

## අල්ලසක් සඳහා..

- මුදල්,
- මුදලින් අගය මැනිය හැකි දෙයක්,
- මුදලින් අගය මැනිය නොහැකි දෙයක්,

හුවමාරු විය හැකිය.

16

## එනම්..

1. ණයක්, ගාස්තුවක්, පාරිතෝෂිකයක් ලැබීමක්..
2. යම් ධුරයක් හෝ රැකියාවක් ලැබීමක්..
3. යම් ණයක් හෝ බැදීමක් නිදහස් කිරීමක්..
4. අයිතිවාසිකමක් හෝ විනය ක්‍රියාමාර්ගයකින් ආරක්ෂාවක්..
5. කවර හෝ වර්ගයකට අයත් වෙනයම් සේවයක් උපකාරයක් හෝ වාසියක් ලබා දීමක්..

17

## වෙනයම් සේවයක්, උපකාරයක්, හෝ වාසියක් යනු..

1. ලිංගික තෘප්තියක් ලබා ගැනීම තුළින් කායිකව ලබන්නාවූ සේවයක්..
2. දරුවෙකු ජනප්‍රිය පාසලකට ඇතුල් කරවා දීඑම මගින් ලබන්නා වූ උපකාරයක්..
3. විදේශ ශිෂ්‍යත්වයක් ලබා ගැනීම තුළින් මානසිකව ලබන්න වූ වාසියක්..

අල්ලසක් විය හැකිය..

18

## අතරමැදියෙකු මගින් අල්ලස..?

අතරමැදියෙකුගේ දැනුම හෝ එකඟතාවය ඇතිව එකී තැනැත්තා හෝ වෙනයම් තැනැත්තෙකු වෙනුවෙන් කෙලින්ම හෝ අන් අයුරකින් ඕනෑම අල්ලසක් වරදක් කළහොත් එකී වරද මුල් තැනැත්තා කරන ලද වරදක් ලෙස නීතිය සලකයි.

89 වන වගන්තිය.

19

## දූෂණය

20

## දූෂණය යනු කුමක්ද ?

යම් රාජ්‍ය සේවකයෙකු විසින් තම ධුරය පෞද්ගලික ලාබ ප්‍රයෝජන ලබා ගැනීම සඳහා යොදා ගැනීම දූෂණය යනුවෙන් හැදින්වේ.

70 වන වගන්තිය.

21

## දූෂණයක් යනු කුමක්ද ?

රජයේ සේවකයෙක් තමාට අයුතු වාසියක් කර ගැනීමට හෝ වෙනත් අයෙකුට අයුතු වාසියක් කිරීමට හෝ ආණ්ඩුවට පාඩුවක් කිරීමට හෝ වෙනත් අයෙකුට අයුතු පාඩුවක් කිරීමට

තම නිල කාර්යය යොදා ගැනීම දූෂණයයි...!

22

## අල්ලස සහ දූෂණය පිළිබඳව පැහැදිලි සාක්ෂි නොමැති විට..

එකී අවස්ථා වලදී වත්කම් නීතිය යටතේ එම වරද කළ අයට එරෙහි නීතිය ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇත.

23

## වත්කම් නීතිය

යම් තැනැත්තෙකු සතු වත්කම් එම තැනැත්තාගේ දැනගත් ආදායම් හෝ ලැබීම් වල කොටසක් නොවන අවස්ථා වලදී එම වත්කම් අල්ලස් මඟින් අත්පත් කරගත් බවට නීත්හිය සලකනු ලබයි..

යමෙකුගේ භාර්යාව / ස්වාමි පුරුෂය හෝ වයස අවරුදු 18 ට අඩු අවිවාහක දරුවෙකුගේ නමට ඇති මුදල් හෝ මුදල් නොවන දෙපල එම තැනැත්තා විසින් අත්පත් කර ගන්නා ලද දේ ලෙස නීතිය සලකනු ලබයි..

24

## දඬුවම්..

- අවුරුදු 07 නොඉක්මවන කාලයක බරපතල වැඩ සහිත සිර දඬුවමක් සහ රු.5000.00 ක් නොඉක්මවන දඩයක්..
- දූෂණය සම්බන්ධව වැරදිකරුවෙකු නම වසර 10 ක් නොඉක්මවන සිරදඬුවමක් සහ රු.10000.00 ක් නොඉක්මවන දඩයක්..
- තුටුපඬුරේ වටිනාකමට සරිලන දඩයක්..
- දේපල රාජසන්තක කිරීමක්..
- ප්‍රජා අයිතිය අහෝසි කිරීමක්..

25

## විපාක..?

26

# PPT-07 සුපිළිපන්භාවය යනු කුමක්ද?

## සුපිළිපන්භාවය යනු කුමක්ද?

1

## අපේ අතීත හරයන්/වටිනාකම්

- දුටුගැමුණු රජතුමා මහා ස්ථූපය හෙවත් රුවන්වැලි මහා සෑය නිමවීමෙන් පසු සතර වාහල්කඩ කාසි කල්දේරම් 4ක් තබා, තමන් මෙම ස්ථූපය ඉදිකිරීමේදී කැප කළ ශ්‍රමයේ පරිමාණයට සුදුසු මුදලක් එම කල්දේරම් වලින් ලබාගන්නා ලෙස එය ඉදිකිරීමට දායක වූ රටවැසියන්ගෙන් ඉල්ලා සිටිබව ඉතිහාසයේ සඳහන්වේ.

2

* Oxford ශබ්ද කෝෂය Integrity යන්න අර්ථ දක්වන්නේ“ the quality of being honest and having strong moral principles.”(අවංකවීම සහ ශක්තිමත් සදාචාරාත්මක මූලධර්ම පැවතීම) ලෙසය.

*මලලසේකර ශබ්ද කෝෂය Integrity යන්නට සිංහල අරුත් සැපයීමේදී සෘජුකම;අවංකත්වය;සාධු ගුණය වැනි වචන කිහිපයක් භාවිත කර තිබේ.

3

## සුපිළිපන්භාවය -විවිධ නිර්වචන

*සුපිළිපන්භාවය යනු තමාට සත්‍යවාදී වීමයි. අවංකභාවය වනාහි අන්‍යයන්ට සත්‍ය පැවසීමයි. (Integrity is telling myself the truth. And honesty is telling the truth to other people)

- ඇමරිකානු ජාතික ලේඛක ස්පෙන්සර් ජොන්සන්.

* සුපිළිපන්භාවය යනු පහසු විකල්පය සහ නිවැරදි ක්‍රියාව අතරින් එකක් තෝරාගැනීමයි

(Integrity – the choice between what’s Convenient and what is right) -ටෝනි ඩන්ජි

*** සුපිළිපන්භාවය යනු අන්‍යයන් ඔබ දෙස බලා නොසිටින අවස්ථාවකදී පවා නිවැරදි දේ කිරීමයි.**

(Integrity is doing the right thing. Even when no one is watching)

- ඉංග්‍රීසි ජාතික ලේඛක සී.එස්. ලුවිස්

4

## සුපිළිපන්භාවය

- විශ්වාසය,වගකීම,සහානුකම්පාව,නීතිගරුකබව,විනය,සෘජු බව,ප්‍රතිපත්තිගරුකබව යනාදී ලක්ෂණ වලින් හෙබි **පුද්ගලයෙකුගේ වටිනාකම් සහ ක්‍රියාවන් අතර සම්මිශ්‍රණයකි.**
- සුපිළිපන්භාවයෙන් යුතු පුද්ගලයෙකු **සමාජය ඉදිරියේ අන් අයට සත්‍යවාදී** පුද්ගලයෙකු වියයුතුවාක් මෙන්ම තමාගේ **හෘද සාක්ෂිය ඉදිරියේ තමාටද සත්‍යවාදී** පුද්ගලයෙකු විය යුතුය.

5

## සුපිළිපන්භාවය හා බැඳී ඇති වටිනාකම් හා ගුණාංග

*ධාර්මිකත්වය - RIGHTEOUS
*ගරුත්වය - HONORABLE
*සත්‍යවාදීබව - TRUTHFUL
*නිදොස්බව - BLAMELESS
*සුන්දරත්වය - GRACEFUL
*සෘජුබව - UPRIGHT
*විනීතබව - DISCIPLINED
*භක්තිමත් බව - FAITHFUL
*පවිත්‍රත්වය/ශුද්ධබව - HOLY

6

## සුපිළිපන් දේශයක් බිහිකරගැනීම උදෙසා...

- **පුද්ගලයා** සුපිළිපන් විය යුතුයි.
- පුද්ගල කණ්ඩායම් එකතුව සැදුම්ලත් **සමාජය** සුපිළිපන් විය යුතුයි.
- **ආයතන** සුපිළිපන් විය යුතුයි.
- **දේශය** සුපිළිපන් විය යුතුයි.
- දේශයන්ගෙන් සැදුම්ලත් **ලෝකය** සුපිළිපන් විය යුතුයි.

7

## සුපිළිපන්භාවය වඩාත්ම අවශ්‍ය අංශ/ආයතන

- නීතිය හදන තැන
- නීතිය ක්‍රියාත්මක කරන තැන
- යුක්තිය පසිඳලන තැන
- රාජ්‍ය අංශය
- පෞද්ගලික අංශය
- ආගමික,මාධ්‍ය,සිවිල් සමාජය ඇතුළු සියලු අංශ
- මහජනතාව
- අනාගත පරපුර වන තරුණ තරුණියන් හා ළමයින්

8

## සුපිළිපන්භාවය යනු කුමක්ද?

අත් පත්‍රිකා - අංක 05

සුපිළිපන් යනු ඉංග්‍රීසි භාෂාවෙන් Integrity යන වචනය අර්ථ දැක්වීම සඳහාම භාවිතා වන සිංහල වචනයයි. සුපිළිපන්භාවය යන්නෙහි වචනාර්ථය තව දුරටත් විග්‍රහ කළවිට "මනා පිළිවෙතින් සපිරි" වැනි අරුතක් එයින් ගම්‍ය වේ. Oxford ශබ්ද කෝෂය Integrity යන්න අර්ථ දක්වන්නේ "the quality of being honest and having strong moral principles'" (අවංකවීම සහ ශක්තිමත් සදාචාරාත්මක මූලධර්ම පැවතීම) ලෙසය. මලලසේකර ශබ්ද කෝෂය Integrity යන්නට සිංහල අරුත් සැපයීමේදී ඍජුකම, ආර්ජවය, අවංකත්වය, සාධු ගුණය වැනි වචන කිහිපයක් භාවිත කර තිබේ.

සුපිළිපන්භාවය යනු කුමක්ද? යන්නට නිශ්චිත සම්මත නිර්වචනයක් මෙතෙක් ඉදිරිපත්වී නොමැති වුවද ඒ පිළිබඳව ඉදිරිපත් වී ඇති විවිධ නිර්වචන සහ පැහැදිළි කිරීම් ඇසුරින් එයින් ගම්‍යවන අර්ථය තේරුම් ගැනීමට අපහසු නොවේ.


- සුපිළිපන්භාවය යනු තමාට සත්‍යවාදී වීමයි. අවංකභාවය වනාහි අන්‍යයන්ට සත්‍ය පැවසීමයි. (Integrity is telling myself the truth' And honesty is telling the truth to other people) - ඇමරිකානු ජාතික ලේඛක ස්පෙන්සර් ජොන්සන්.

- සුපිළිපන්භාවය යනු පහසු විකල්පය සහ නිවැරදි ක්‍රියාව අතරින් එකක් තෝරාගැනීමයි (Integrity - the choice between what’s Convenient and what is right) - ටෝනි ඩන්ජී

- සුපිළිපන්භාවය යනු අන්‍යයන් ඔබගේ ක්‍රියාව ගැන බලා නොසිටින අවස්ථාවකදී පවා නිවැරදි දේ කිරීමයි.

- (Integrity is doing the right thing' Even when no one is watching) - ඉංග්‍රීසි ජාතික ලේඛක සී.එස්. ලුවිස්

- සුපිළිපන්භාවය යනු පුද්ගලයින් මෙන්ම ආයතන විසින් පිළිගතයුතු, දූෂණයට එරෙහි බාධක නිර්මාණය කරන, සදාචාරයට සහ ආචාරධර්මවලට අනුකූල ප්‍රතිපත්තීන් සහ ප්‍රමිතීන් සමුදායයක්ය යන්න ඒ පිළිබඳව ඉදිරිපත්ව ඇති තවත් නිර්වචනයකි.




### සුපිළිපන්භාවය - පුද්ගලයෙකුගේ වටිනාකම් සහ ක්‍රියාවන් අතර සම්මිශ්‍රණයකි

ඉහත නිර්වචන සහ පැහැදිළි කිරීම් වලින් ගම්‍යවන අර්ථය අනුව සුපිළිපන්භාවය යනු අවංක වීම, සදාචාරාත්මකවීම, ආචාරධාර්මිකබව, යහගුණමත පිහිටා ක්‍රියාකිරීම, සම්මුති විරහිතව සදාචාරාත්මක මූලධර්ම හා සාරධර්මවලට අනුකූලව ක්‍රියාත්මකවීම වැනි වටිනාකම් (Values) සහ ක්‍රියාවන්ගේ (Action) සම්මිශ්‍රිත

තත්ත්වයක් ලෙස සැලකීම වඩාත් සාධාරණ බව පෙනේ.

සුපිළිපන්භාවයෙන් යුතු පුද්ගලයෙකු, සමාජය ඉදිරියේ අන් අයට සත්‍යවාදී පුද්ගලයෙකු විය යුතුවා මෙන්ම තමාගේ හෘද සාක්ෂිය ඉදිරියේ තමාටද සත්‍යවාදී පුද්ගලයෙකු විය යුතුය.

### සුපිළිපන්භාවය හා බැඳී ඇති වටිනාකම් ලෙස පහත ගුණාංග හඳුනාගත හැකිය.

- ධාර්මිකත්වය - RIGHTEOUS
- ගරුත්වය - HONORABLE
- සත්‍යවාදීබව - TRUTHFUL
- නිදොස්බව - BLAMELESS
- සුන්දරත්වය - GRACEFUL
- ඍජුබව - UPRIGHT
- විනීතබව - DISCIPLINED
- භක්තිමත් බව - FAITHFUL
- පවිත්‍රත්වය/ශුද්දබව - HOLY

සුපිළිපන්භාවය ශ්‍රී ලාංකික අපට නව්‍ය සංකල්පයක් නොවේ.අපේ අතීත හරයන් සහ වටිනාකම් සොයායාමේදී සුපිළිපන්භාවය ගැන කියැවෙන විවිධ නිදසුන් රැසක් අපේ අතීත උරුමයන් තුළින් හමුවේ. දුටුගැමුණු රජතුමා මහා ස්ථූපය හෙවත් රුවන්වැලි මහා සෑය නිමවීමෙන් පසු සතර වාහල්කඩ කාසි කල්දේරම් 4ක් තබා, තමන් මෙම ස්ථූපය ඉදිකිරීමේදී කැප කළ ශ්‍රමයේ පරිමාණයට සුදුසු මුදලක් එම කල්දේරම් වලින් ලබාගන්නා ලෙස එය ඉදිකිරීමට දායක වූ රටවැසියන්ගෙන් ඉල්ලා සිටිබව ඉතිහාසයේ සඳහන්වේ. අවශ්‍යනම් ඊට දායක නොවූ අයටද එම අවස්ථාව වැරදි ලෙස ප්‍රයෝජනයට ගැනීමට හැකියාව තිබූ නමුත් කිසිවෙකු එලෙස ක්‍රියා නොකළ බවද ඉතිහාසයේ සඳහන්ය.

සුපිළිපන් දේශයක් බිහිකරගැනීමේ ප්‍රයත්නය සියලු පාර්ශව එකට එක්ව යථාර්තයක් බවට පත්කරගතයුතු ඉලක්කයකි. එහිදී පුද්ගලයා සුපිළිපන් විය යුතුවා සේම එක් එක් පුද්ගල කණ්ඩායම් එකතුව සැදුම්ලත් සමාජයද සුපිළිපන් විය යුතුය. එසේම ඒ සමාජය තුළ පවත්නා ආයතන පද්ධතියද සුපිළිපන් වීම අවශ්‍යය. දේශය සුපිළිපන් දේශයක් බවට පත් වන්නේ මෙම සියලු අංශ එකට ඒකරාශී වීමෙනි.

### රටක සුපිළිපන්භාවය වඩාත්ම අවශ්‍ය අංශ/ආයතන

- නීතිය ක්‍රියාත්මක කරන තැන
- යුක්තිය පසිඳලන තැන
- රාජ්‍ය අංශය
- පෞද්ගලික අංශය
- ආගමික, මාධ්‍ය, සිවිල් සමාජය ඇතුළු සියලු අංශ
- මහජනතාව
- අනාගත පරපුර වන තරුණ තරුණියන් හා ළමයින්

# PPT-08 බැඳියාවන් අතර ගැටුම් පිළිබඳ රීති

## බැඳියාවන් අතර ගැටුම් පිළිබඳ රීති

1

## බැඳියාවන් අතර ගැටුම යනු කුමක්ද?

මිනිසුන් ලෙස අප සියලු දෙනාටම විවිධ බැඳියාවන් පවතී.
(ඥාතිත්වය,ගමේ කම, ආගම, ජාතිය, කුලය ,ඉගෙනගත් පාසල යනාදී වශයෙන්........)
ඒ බැඳියාවන් සමඟ ඇතැම් විට ගැටුම් ඇති වීමද සාමාන්‍ය දෙයකි.
එහෙත්, මෙහිදී සාකච්ඡා කරන්නේ එවැනි ගැටුම් ගැන නොවේ.
**බැඳියාවන් අතර ගැටුම යනුවෙන් අදහස් කරන්නේ දූෂණය, වංචාව, සොරකම වැනි සමාජ උවදුරක් බවට පත්ව ඇති, රාජකාරිමය වගකීම අභිභවා පෞද්ගලික ළැදියාවන් මත කටයුතු කිරීමේ ගැටලුවයි.**
මෙහිදී තමන්ගේ විශේෂ බැඳියාවකට සම්බන්ධ අයට රාජකාරියේදී අයුතු අනුග්‍රහයක් ලබා දීම සිදුවේ.

2

## බැඳියාවන් අතර ගැටුම යනු ,

**“යමෙකුගේ රාජකාරිමය අභිලාශ කිසිඳු අවස්ථාවකදී පුද්ගලික අභිලාශවලින් ප්‍රතික්ෂේප නොකළ යුතුය“**
යන මූලධර්මයට පටහැනිව කටයුතු කිරීමයි.

“බැඳියාවන් අතර ගැටුම ප්‍රකාශයට පත් නොකිරීම“ අල්ලස් පනතට යෝජිත සංශෝධන අනුව නීතිමය වරදක් ලෙස අර්ථ දක්වා තිබේ.ඒ අනුව ආයතන සංග්‍රහයේ XLVII සහ XXIX පරිච්ඡේදවල මේ පිළිබඳව සඳහන්ව ඇති කරුණුද වර්තමානයට ගැලපෙන ලෙස පුළුල් කර ඇත. මෙම මාර්ගෝපදේශවල අරමුණ වන්නේ, බැඳියාවන් අතර ගැටුම පිළිබඳව දැනුවත්ව කටයුතු කරන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමයි.

3

## බැඳියාවන් අතර ගැටුමේ ස්වරූප

- **සැබැවින්ම බැඳියාවන් අතර ගැටුමක් ඇති අවස්ථාව-**

ගනුදෙනුව සිදු කරන අවස්ථාවේදී හෝ තීරණ ගන්නා අවස්ථාවේදී ගැටුමක් තිබීම පැහැදිලිව පෙනේ. එය වර්තමාන මොහොතේ කෙළින්ම දැකිය හැකිය.

- **අනාගතයේදී බැඳියාවන් අතර ගැටුමක් ඇති විය හැකි අවස්ථාව-**

ගැටුමක් අනාගතයේදී ඇති විය හැකි විය හැකිය. එවැන්නක් දැනට පැහැදිලිව නොපෙනුණත් අනාගතයේදී එවැනි ගැටුමක් ඇති වීමේ හැකියාව පවතී.

- **බැඳියාවන් අතර ගැටුමක් සැබෑවටම නැතත්, එසේ ඇති බව පෙනී යන අවස්ථාව-**

සැබෑ හෝ අනාගතයේදී ඇති විය හැකි ගැටුමක් නොමැති වුවද අන් අය ඒ දෙස බලන ආකාරයට බැඳියාවන් අතර ගැටුමක් තිබේය යන අදහසක් ඇති විය හැකිය.

4

## බැඳියාවන් අතර ගැටුමක් මතු වූ විට කළ යුත්තේ කුමක්ද?

- බැඳියාවන් අතර ගැටුම් තත්ත්වයන් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ වගකීම පැවරෙන්නේ ආයතන ප්‍රධානියාටය.
- ඒ සඳහා කළමනාකරණ කමිටුවක් පිහිටුවනු ලැබේ.
- යම් නිලධාරියකුට බැඳියාවන් පිළිබඳ ගැටුම්සහගත තත්ත්වයක් ඇති වුවහොත් පළමුව කළ යුතු වන්නේ ඒ බව අදාළ කමිටුව වෙත අනාවරණය කිරීමයි.
- එතැන් සිට, මතු වී ඇති ගැටලුව කළමනාකරණය කිරීම පිළිබඳව තීරණ ගැනීම කමිටුවේ වගකීමකි. මෙසේ අනාවරණයක කිරීමෙන් අදාළ නිලධාරියාට ගැටලුවට මුහුණදීම පහසු වන අතර ඔහුට රැකවරණයක් හිමි වේ.

5

## ගැටුම් සහගත තත්ත්වයකදී කළමනාකරණ කමිටුවට එළැඹිය හැකි විනිශ්චයන් ...

**1. අත්හැරීම-** යම් හේතු මත ගැටුම නොතකා හැරීමට තීරණය කිරීම

**2.ඉවත් කිරීම-** තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් ඉවත් වන ලෙස නිලධාරියාට උපදෙස් දීම
.

**3. අවසතු කිරීම-** නිලධාරියා විසින් ගැටුමට තුඩු දෙන බැඳියාවෙන් ඉවත් වීම (උදා-කොටස් හිමිකමක් වෙනත් කෙනෙකුට පැවරීම)

**4. සීමා කිරීම-** මෙහිදී සිදුවන්නේ අදාළ නිලධාරියා ක්‍රියාවලියෙන් සම්පූර්ණයෙන් ඉවත් වීම වෙනුවට යම් සීමාවන්ට යටත්ව කටයුතු කිරීමයි.

**5. බඳවා ගැනීම-** කාරණය සම්බන්ධ ක්‍රියාවලියෙන් කොටසක් හෝ සමස්තය අධීක්ෂණය කිරීම අපක්ෂපාත තෙවැනි පාර්ශ්වයක් වෙත පැවරීම.

**6. ඉල්ලා අස්වීම-** නිලධාරියා ආයතනයෙහි දරන තනතුරින් ඉල්ලා අස් වීම.

6

# PPT-09 **ත්‍යාග රීති**

## තෑගි රීති යනු කුමක්ද?

1

## තිවංකාගේ ත්‍යාගය

තිවංකා, රජිත සමඟ කුඩා කළ සිටම ඉගෙනුම ලැබූ මිතුරියෙකි.ඇය මේ වනවිට විදෙස් තානාපති සේවයේ පළවෙනි පන්තියේ ලේකම්වරියක් ලෙස සේවය කරයි. කෙටි නිවාඩුවකට දිවයිනට පැමිණ සිටින අතර ඇය පැරණි මිතුරා (රජිත) හමුවීමට සියඹලාණ්ඩුව ප්‍රා.ලේ කාර්යාලයට පැමිණෙයි.

තිවංකා රජිත හමුවීමට පැමිණෙන්නේ හිස් අතින් නොවේ.ඇය රජිත වෙනුවෙන් විශේෂයෙන් සූදානම් කරගෙන ආ පුංචි පාර්සලය තුළ ගාන්ධිගේ අවිහිංසාවාදී අරගලය ගැන අලුතින් ලියැවුණ ග්‍රන්ථයක්ද, රජිත කැමතිම විදියේ ටයිපටියක්ද, රජිතගේ බිරිඳට තිළිණයක් ලෙස ගෙන ආ කුඩා පසුම්බියක්ද, රජිතගේ පුංචි දියණිය වෙනුවෙන් ජපානයෙන්ම ගෙනෙන ලද කුඩා බෝනික්කෙක්ද ඇත.

**රාජකාරී ස්ථානය තුළදී රජිත ට තිවංකාගේ ත්‍යාගය භාරගත හැකිද?**

2

## සුසිරිපාල මුදලාලිගේ සාහිත්‍ය අනුග්‍රහය

සුසිරිපාල මුදලාලි දැව ව්‍යාපාරිකයෙකි.එසේම නගරයේ තවත් විවිධ ව්‍යාපාර කිහිපයකම නිරත ප්‍රමුඛ පෙළේ ධනවතෙකි. ඔහුගේ විවිධ කාර්යයන් සඳහා නිරන්තරයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යන එන අයෙකි. ඒ අතර ම ඔහු කලා සාහිත්‍ය කටයුතු පිළිබඳව ද උනන්දුවක් දක්වන රසකාමියෙකි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය සාහිත්‍ය උළෙලේ සියලුම බරපැන තනියම දැරීමට තමා සූදානම් බව සුසිරිපාල මුදලාලි ප්‍රාදේශීය ලේකම්වරයාට පවසයි. ඒ වෙනුවෙන් තමාට ප්‍රසිද්ධියක් අනවශ්‍ය බවද ඔහු වැඩිදුරටත් කියා සිටී.

ප්‍රාදේශීය ලේකම්වරයා, සුසිරිපාල මුදලාලිගේ සාහිත්‍ය අනුග්‍රහය ලබාගැනීමේ වරදක් තිබේද?

3

## අල්ලස් සහ **තෑගි බෝග**

අල්ලස හෝ දූෂණය විවිධ ස්වරූප වලින් රාජ්‍ය සේවය තුළත්,එයින් පරිබාහිරවත් පවතී.

**තෑගි බෝග** ලෙස අල්ලස හෝ දූෂණය පැවැතීම සමාජය තුළ කතාබහට ලක්ව ඇති කාරණයකි.

**රාජ්‍ය සේවකයෙකු තම නිල රාජකාරිය කඩිනමින් ඉටුකිරීමට හෝ ඉන් වැලකී සිටීම සඳහා පෙළඹවීමක් ලෙස යම් තුටු පඬුරක් ලබාගන්නේ නම් ඔහු අල්ලස් පනත යටතේ වරදකරුවෙකු ලෙස සැලකිය හැකි වරදක් සිදුකරයි.**

4

## ත්‍යාගය හා තුටු පඬුරු

*අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සම්පාදනය කර ඇති **තෑගි රීති චර්යා පද්ධතිය** මගින් **ත්‍යාගයක් හා තුටු පඬුරක් අතර වෙනස** දැක්වීම සඳහා විධිවිධාන ඉදිරිපත් කරයි.

බැලූ බැල්මට ත්‍යාගයක් සේ පෙනීයන සමහර ක්‍රියාවන්ට ඉඩ ලබාදෙන යම් යම් ව්‍යාතිරේඛයන් දැක්වීම සඳහාද එහි විධිවිධාන සලස්වා ඇත.

* පෞද්ගලික සබඳතාවක් තුළ පිළිගතහැකි චර්යාව හා නිල තත්ත්වයක් තුළ අපක්ෂපාතීත්වයට හානිකර විය හැකි සදාචාරාත්මක නොවන හෝ සාපරාධී චර්යාව සම්බන්ධ විධිවිධාන ත්‍යාග රීති වල දක්වා තිබේ.

5

## ත්‍යාග පිළිගැනීම ගැන විධිවිධාන

වර්තමානයේ ත්‍යාග පිළිගැනීමේ විධිවිධාන සම්බන්ධයෙන් සඳහන් වන්නේ ආයතන සංග්‍රහයේ XLVII වැනි පරිච්ඡේදය,අදාළ චක්‍රලේඛ සහ විධිවිධානවලය.

මෙම ව්‍යාතිරේඛයන්හි සීමාවන් පුළුල් කරමින් එකිනෙකට වෙනස් අවස්ථාවන්හිදී ඒවා අදාළ කරගන්නා ආකාරය මෙන්ම ඒවා අර්ථකථනය කරන්නේ කෙසේද යන්න ද මෙම ත්‍යාග රීති **මාගෝර්පදේශ** මගින් පැහැදිලි කරයි.

6

## ත්‍යාග රීතිවල අරමුණු -

*ත්‍යාගයක් අයැද සිටීම තහනම් කිරීම.

*ත්‍යාග පිරිනැමීම හා භාර ගැනීම සීමා කිරීම.

*ත්‍යාගයක් භාර ගැනීමේදී තහනම් වියයුතු මූලාශ්‍ර හා අදාළ තහනම සඳහා ව්‍යාතිරේඛයක් නියම කිරීම.

*භාරගන්නා ත්‍යාගයන් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා ක්‍රියාවලියක් සැකසීම.

*ත්‍යාග බැහැර කිරීම සඳහා ක්‍රියාවලියක් සැකසීම.

*මෙම රීති සඵලදායීව ක්‍රියාත්මක කිරීම පරිපාලනය සඳහා අවශ්‍යවන මාර්ගෝපදේශ සැපයීම.

7

## ප්‍රශ්න / ගැටලු ?

-ස්තුතියි.

8

**රාජ්‍ය නිලධාරීන් සඳහා දූෂණ විරෝධී පුහුණු වැඩසටහන**
අත් පත්‍රිකා - අංක 06

**"සුපිළිපන් ශ්‍රී ලංකාවක්"**

**ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2023**

ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීමේ වගකීම රාජ්‍ය හා පුද්ගලික යන දෙඅංශයම වෙත පැවරී තිබේ. 2017 ඔක්තෝබර් 24 වැනි දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් ඒකමතිකව අනුමත කරන ලද යෝජනාවක් අනුව සැකසූ එම ක්‍රියාකාරී සැලැස්ම සියලු පාර්ශව එකට ඒකරාශී වී ජයගතයුතු සාමූහික ඉලක්කයක් ලෙස සලකා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (CIABOC), ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය, ස්වාධීන කොමිෂන් සභා, පුද්ගලික අංශය, සිවිල් සමාජය, ජනමාධ්‍ය, කලාකරුවන්, දේශපාලන පක්ෂ, ආගමික ආයතන ආදී සියලු පාර්ශ්වවලට සහභාගී වියහැකි වන පරිදි එය සම්පාදනය කර ඇත.

මෙරට පවතින සියලු අංශ ආවරණය වන පරිදි කෙටිකාලීන (මාස 1 සිට 12), මධ්‍ය කාලීන (මාස 12 සිට 36) සහ දිගුකාලීන (මාස 36 සිට 60) වශයෙන් ඉටු කිරීමට තෝරාගත් විවිධ ක්‍රියාකාරකම් 221ක් එම ජාතික ක්‍රියාකාරී සැලසුමට ඇතුළත්ය.

අල්ලසින් හා දූෂණයෙන් තොර ශ්‍රී ලංකාවක් ඇති කර ගැනීම සඳහා ප්‍රජාව විසින් හා විවිධ ආයතන විසින් ඒකාත්මිකව හා වෙන් වෙන් වශයෙන් ගතහැකි පියවර සැලසුම තුළ ප්‍රධාන උපායමාර්ග 4ක් ඔස්සේ හඳුනාගෙන ඇත. එහි පස්වන උපායමාර්ගය වශයෙන් සුපරීක්ෂාකාරිත්වය හෙවත් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ඇගයීම සිදු විය යුතු බවද ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළම අවධාරණය කර තිබේ.

A - පළමුවන උපායමාර්ගය - නිවාරණ කටයුතු
B - දෙවන උපායමාර්ගය - සාරධර්ම මත පදනම් වූ අධ්‍යාපනය හා ප්‍රජා සහභාගීත්වය
C - තුන්වන උපායමාර්ගය - නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන ශක්තිමත් කිරීම
D - හතරවන උපායමාර්ගය - නීති හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය
E - පස්වන උපායමාර්ගය - ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ඇගයීම

**A - නිවාරණ කටයුතු**

දූෂණයට එරෙහි සටන තුළ නිවාරණය යන කාරණය ශ්‍රී ලංකාවට නව්‍ය සංකල්පයකි. මෙය ලොව වෙනත් රටවලල විශේෂයෙන්ම ප්‍රබල දූෂණ මර්දන ආයතන පවතින රටවල විශේෂ ආකර්ෂණයක් ලබා ගැනීමට සමත්ව ඇති කරුණකි. නිවාරණයේ අරමුණ වන්නේ දූෂණයට ඇති අවස්ථා අඩු කිරීම හෝ මුලිනුපුටා දැමීමයි. ඒ අනුව නිවාරණය යනු විමර්ශනය හා නඩු පැවරීම යන කාර්යයන්ට ඉදිරියෙන් ඇති ක්‍රියාවක් වන අතර එය සාර්ථක වන්නේ නම් විමර්ශනයක්ද අවශ්‍ය නොවේ. නිවාරණය, විශේෂයෙන්ම ඉතා අධික පිරිවැයක් දැරීමට සිදු වන දණ්ඩන ක්‍රමවේදයට ඇති ඉතා සාර්ථක තිරසර විකල්පයකි. අපරාධ ක්‍රියාවක් සිදු වූ පසුව විමර්ශනය හා නඩු පැවරීම් සිදු කිරීම පමණක් දූෂණය මැඩපැවැත්වීමට ඵලදායී ක්‍රියාවක් වන්නේද යන කාරණය වර්තමානයේ විශාල විමසුමකට භාජනය වී ඇත. එවැනි තත්ත්වයක් යටතේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ වඩාත් වැඩි අවධානයක් යොමු කර ඇත්තේ ප්‍රතිකාරයට වඩා වැළැක්වීම යහපත් වේ යන ප්‍රතිපත්තිය සම්බන්ධයෙනි. එහි දී අල්ලස හා දූෂණය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමට ඇති එකම මාර්ගය දඬුවම් පැමිණවීම පමණක්මය යන අදහසද බැහැර කරනු ලැබේ.

ජාතික ක්‍රියාකාරී සැලැස්මේ නිවාරණ කටයුතු සම්බන්ධයෙන් හඳුනාගෙන ඇති මූලික පියවර කිහිපයක් මෙසේය.

### A-1. CIABOC දූෂණ නිවාරණ අංශයක් ස්ථාපිත කිරීම.

දූෂණ නිවාරණ අංශයක්, නිවාරණ නිලධාරීන්, මානව සම්පත්, නිවාරණ නිලධාරීන්ට හා වෙනත් නිලධාරීන්ට නිවාරණ පුහුණුව, ජාතික උපදේශක කවුන්සිලයක් ස්ථාපනය කිරීම.

### A-2. රාජ්‍ය අංශය තුළ සුපිළිපන් බව වර්ධනය කිරීම හා දූෂණ නිවාරණ අංශයක් ස්ථාපිත කිරීම.

ජාතික සුපිළිපන් උපායමාර්ග, සුපිළිපන් නිලධාරීන්, දූෂණ නිවාරණ කමිටුව, ආයතනික ක්‍රියාකාරී සැලැස්ම, අවදානම් තක්සේරුව, පහසුකම් සැපයීමේ නිලධාරීන්, ත්‍යාග නීති, බැඳියාවන් අතර ගැටුම් රීති, ආචාරධර්ම පද්ධති, සුපිළිපන් ප්‍රතිඥා, සුපිළිපන් ලාංඡන, දූෂණ මුක්ත කලාප, සුපිළිපන් ප්‍රතිඥාව.

### A-3. රාජ්‍ය සේවා ලැබීම සඳහා මහජනතාවට ඇති ඉඩකඩ ඉහළ මට්ටමකට ගෙන ඒම.

පුරවැසි ප්‍රඥප්ති, විද්‍යුත් ගෙවීම් පද්ධති, ප්‍රමිති ක්‍රියාවලි ප්‍රදර්ශනය, ඩිජිටල් පුවරු, පිළිගැනීමේ නිලධාරීන්

### A-4. පෞද්ගලික අංශය තුළ දූෂණය නිවාරණය කිරීම.

භාවිත ආචාරධර්ම පද්ධති සමාලෝචනය, සුපිළිපන් ආචාරධර්ම පද්ධති හඳුන්වා දීම, නිරන්තර විගණනය

### A-5. මහජන නියෝජිතයන්ගේ සුපිළිපන්තාව තහවුරු කිරීම.

පාර්ලිමේන්තු ආචාරධර්ම පද්ධති සමාලෝචනය, තේරී පත් වූ නියෝජිතයන්ට ආචාරධර්ම පද්ධතියන් හඳුන්වා දීම, සුපිළිපන් ප්‍රතිඥාව.

### A-6. රාජ්‍ය ප්‍රසම්පාදන හා මහජන මූල්‍ය පරිපාලනය යන අංශයන්හි සුපිළිපන්තාව නැංවීම.

ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හඳුන්වා දීම, භාණ්ඩ සමීක්ෂණ වාර්තා සමාලෝචනය, ආයතන මෙහෙයුම් මාර්ගෝපදේශ සමාලෝචනය, තාක්ෂණ ඇගයීම් සම්බන්ධ අත්පොත්, යෝජිත ව්‍යාපෘති තෝරා ගැනීමේ ක්‍රමවේද, අභිමතය ප්‍රකාශ කිරීමේ ලේඛන, දැනුම්වත් කිරීම, දූෂණ මර්දන ප්‍රමිති ඇති කිරීම, සම්මත ලංසු ලේඛන, රාජ්‍ය දේපළ අපහරණය කිරීමේ ක්‍රමවේදය, විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමයක් හඳුන්වා දීම, ඩිජිටල් පුවරු මෘදුකාංග හඳුන්වා දීම, PEPA 2013 ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘති ප්‍රමුඛතා ලැයිස්තු, කුසලතා ඇගයීම.

### A-7. අපරාධ යුක්ති ක්‍රමයේ සුපිළිපන්තාව වර්ධනය කිරීම.

විනිසුරුවන් සඳහා වන හැසිරීම් පද්ධතිය සමාලෝචනය, නීතිඥවරු සඳහා වන හැසිරීම් පද්ධතිය සමාලෝචනය, නඩු මෙහෙයවන්නන්, විමර්ශකයන් සඳහා හැසිරීම් පද්ධති හඳුන්වා දීම.

## B - සාරධර්ම මත පදනම් වූ අධ්‍යාපනය හා ප්‍රජා සහභාගිත්වය

සාරධර්ම මත පදනම් වූ අධ්‍යාපනය හා ප්‍රජා මැදිහත්වීම් ලොව පුරා දූෂණය තුරන් කිරීම කෙරෙහි තීරණාත්මක ලෙස බලපා ඇත. අල්ලසට හා දූෂණයට එරෙහි සටන හුදෙක්ම නීතිය හා ප්‍රතිපත්ති සම්පාදනයට පමණක් සීමා කළ නොහැක. එය ඉන් එහාට ගියා වූ පුරවැසි මතවාදයන්හි පරිවර්තනයක් ඇති කිරීමේ ක්‍රියාවක් විය යුතුය. ක්‍රියාකාරී සැලැස්මෙහි 'ඊ' උපායමාර්ගය මගින් ශ්‍රී ලංකාව තුළ ඉදිරි පරම්පරා වෙනුවෙන් තිරසර සුපිළිපන් සංස්කෘතියක් නිර්මාණය කිරීමට අවශ්‍ය පදනම නෙළා ඇත. සාරධර්ම මත පදනම් වූ අධ්‍යාපනය හා ප්‍රජා මැදිහත්වීම් ලොව පුරා දූෂණය තුරන් කිරීම කෙරෙහි තීරණාත්මක ලෙස බලපා ඇත. අල්ලසට හා දූෂණයට එරෙහි සටන හුදෙක්ම නීතිය හා ප්‍රතිපත්ති සම්පාදනයට පමණක් සීමා කළ නොහැක. එය ඉන් එහාට ගියා වූ පුරවැසි මතවාදයන්හි පරිවර්තනයක් ඇති කිරීමේ ක්‍රියාවක් විය යුතුය.

## B-1. ළමුන් හා තරුණයන් සඳහා සුපිළිපන් අධ්‍යාපනය ලබා දීම.

සුපිළිපන් අධ්‍යාපනය - අධ්‍යාපන නිලධාරීන්, විදුහල්පතිවරු, ගුරුවරු දැනුවත් කිරීම, 1ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා ආචාරධර්ම හඳුන්වා දීම, සුපිළිපන් ක්‍රියාකාරකම් හඳුන්වා දීම, සුපිළිපන් සමාජ, ගුරුවරු සඳහා සුපිළිපන් දැනුම්වත් කිරීම්, ගුරුවරුන්ගේ පශ්චාත් උපාධි සඳහා සුපිළිපන් වැඩසටහන්, විශ්වවිද්‍යාල තුළ සුපිළිපන් අධ්‍යාපනය, විශ්ව විද්‍යාල ආචාර්යවරු දැනුවත් කිරීම, විශ්වවිද්‍යාල විෂය නිර්දේශ, තාක්ෂණ ආයතන හා වෘත්තීය පුහුණු ආයතන, මූලික වැඩසටහන්, සංස්කෘතික තරග, විශ්වවිද්‍යාල තුළ සුපිළිපන් සමාජ ඇතුළත් ජාතික ප්‍රතිපත්ති සැකසීම.

## B-2. රාජ්‍ය අංශයේ දැනුම්වත්භාවය වැඩි කිරීම.

පුහුණු වැඩසටහන් සඳහා සුපිළිපන් මොඩියුල, මූලික වැඩසටහන් සඳහා සුපිළිපන් ආචාරධර්ම, රැකියා දැනුම්වත් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් සඳහා අල්ලස් ප්‍රශ්න, අන්තර් ආයතන තරග හා අත්දැකීම් හුවමාරු වැඩසටහන්.

## B-3. වගවීම සඳහා මහජන ඉල්ලුමක් ඇති කිරීම.

RTI සම්බන්ධ දැනුම්වත් කිරීම, RTI සම්බන්ධ මාධ්‍ය ප්‍රචාරණය, මූලික මිනිස් අයිතිවාසිකම් සම්බන්ධ දැනුම්වත් කිරීම, පුරවැසි ප්‍රඥප්ති හා සේවා ලැබීමට ඇති පුරවැසි අයිතිය සම්බන්ධ වැඩමුළු, දූෂණයට එරෙහිව සන්ධාන ගොඩනැගීම.

## B-4. සුපිළිපන් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍යවල කාර්යභාරය ශක්තිමත් කිරීම.

මාධ්‍ය සමඟ ඉදිරියට යෑම, ප්‍රචාරක වැඩසටහන් සඳහා මාධ්‍ය සමග අත්වැල් බැඳ ගැනීම, මාධ්‍ය සඳහා ආචාරධර්ම පද්ධතියක්, මාධ්‍ය වෙනුවෙන් පුහුණු සැසි, නඩු සම්බන්ධ ප්‍රචාරය කිරීම.

## B-5. පුරවැසියන් හා සිවිල් සමාජ දැනුම්වත් කිරීම තුළින් සුපිළිපන් සංස්කෘතියක් සඳහා ඔවුන්ගේ දායකත්වය ප්‍රවර්ධනය කිරීම.

වෘත්තීය සමිති, ප්‍රජා නායකයන්, ආගමික නායකයන්, සිවිල් සමාජ නියෝජිතයන්, දැනුම්වත් කිරීම. දූෂණ මර්දනය සම්බන්ධයෙන් උපකරණ හා පණිවුඩ සම්පාදනය, සුපිළිපන් පරීක්ෂණ, CIABOC වෙබ් අඩවියේ ප්‍රචාරය කිරීම, කලාව හා සංස්කෘතිය හරහා සමාජය පරිවර්තනය කිරීම.

## B-6. සුපිළිපන් සමාජයක් ඇති කිරීම සඳහා පෞද්ගලික අංශය දායක කර ගැනීම

දූෂණ මර්දනය සඳහා පුද්ගලික අංශය සමඟ සම්බන්ධ වීම, දැනුම්වත් කිරීම, CSR වැඩසටන් ලෙස සුපිළිපන්තාව ප්‍රවර්ධනය" CIABOC නිලධාරීන් වෙනුවෙන් පුද්ගලික අංශයේ කණ්ඩායම් සමඟ පුහුණුවීම්" රාජ්‍ය හා පුද්ගලික අංශයේ සුපිළිපන් ගිවිසුම් අත්සන් කිරීම'

## B-7. මහජන නියෝජිතයන්ගේ දැනුම්වත්භාවය වර්ධනය කිරීම.

මහජන නියෝජිතයන් හා පාර්ලිමේන්තු අධීක්ෂණ කාරක සභා වෙනුවෙන් ලොව ඇති මනා ලෙස භාවිත වන හා වගකීම් සම්බන්ධව දැනුවත් කිරීම.

## B-8. විනිසුරුවරු හා අධිකරණ නිලධාරීන් දැනුම්වත් කිරීම.

ලොව ඇති මනා භාවිතාවන් සම්බන්ධව විනිසුරුවරු දැනුම්වත් කිරීම, අත්දැකීම් හුවමාරු කිරීමේ වැඩසටහන් සංවිධානය.

## C - නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන ශක්තිමත් කිරීම

දූෂණ මර්දන ආයතනයන්ට නීතිය ක්‍රියාත්මක කිරීමේ හා නඩු පැවරීමේ ආයතනද ඇතුළත් වේ. නමුත් එවැනි ආයතන ස්ථාපිත කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. එවැනි ආයතනවල කාර්යයන් ක්‍රියාවට නැංවීම සඳහා සම්පත් අවශ්‍ය කෙරේ. බොහෝ අපරාධකරුවන් අන්තර්ජාතිකව පවත්නා සූක්ෂම අපරාධ විධි භාවිත කරනු ලැබුවද දූෂණ මර්දන ආයතන සතුව ඒවාට මුහුණ දීමට හැකි ප්‍රමාණවත් විශේෂඥ දැනුමක් නොවීම විශාල ගැටලුවක් බවට පත්ව තිබේ. මීට ප්‍රධානතම හේතුව වී ඇත්තේ දූෂණ මර්දන ආයතන සතුව ඇති මූල්‍ය හා මානව සම්පත් ප්‍රමාණවත් නොවීමයි. කෙසේ වෙතත් මෙම තත්ත්වය එක් පසකින් සිටින අපරාධකරුවන් හා අනෙක් පසින් සිටින විමර්ශකයන් හා නඩු මෙහෙයවන්නන් අතර අසමතුලිතතාවක් ඇති කිරීමට හේතු වී ඇත. එය අපරාධකරුවන්ට වාසි සහගත තත්ත්වයක් ඇති කර තිබේ.

මෙම තත්ත්වයන්ට විසඳුම් වශයෙන් ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ පහත යෝජනා ඉදිරිපත් කර තිබේ.

### C-1. CIABOC සම්පත් හා මෙහෙයුම් රාමුව

විමර්ශන අංශයේ යටිතල පහසුකම් හා මෘදුකාංග ප්‍රවර්ධන සැලැස්ම, අභ්‍යන්තර කාර්යාල අලුත්වැඩියාව, ICT මත පදනම් වූ වැඩිදියුණු කිරීම්, වත්කම් විමර්ශනයට උපකරණ 12ක්, CIABOC සඳහා මානව සම්පත් ප්‍රතිපත්තියක් ඇති කිරීම, CIABOC සඳහා අතිරේක ඒකක ඇති කිරීම, බාහිර ව්‍යවහාරික කාර්ය මණ්ඩල ජාලය, මූල්‍ය ස්වාධීනත්වය සම්බන්ධ නිර්දේශ, පළාත් මධ්‍යස්ථාන, CIABOC පිළිවෙත් ප්‍රදර්ශනය කිරීම.

### C-2. විමර්ශන හා නඩු පැවරීම් සම්බන්ධ විධිමත්භාවය

කාර්ය මණ්ඩල වැඩි කිරීම, විශේෂඥ කාර්ය මණ්ඩල පත් කිරීම, විමර්ශකයන් සඳහා පුහුණු ක්‍රියාවන් ඇති කිරීම හා පුහුණු සැසි ලබා දීම, කාර්ය අධීක්ෂණ කමිටු, විමර්ශකයන් සඳහා ආචාරධර්ම පද්ධතියක්, නඩු මෙහෙයවන්නන්ගේ වැටුප් වැඩි කිරීම, නඩු මෙහෙයවන්නන්ට පුහුණුවීම්, නඩු මෙහෙයවන්නන් හා විමර්ශකයන් අතර ආචාරධර්ම හා මනා භාවිතය පිළිබඳ දැනුම්වත් කිරීම්, නව මහාධිකරණ සම්බන්ධ ප්‍රගතිය සමාලෝචනය, විමර්ශන අත්පොත්, නඩු තෝරා ගැනීම සම්බන්ධ මාර්ගෝපදේශයක් ඇති කිරීම, විනිසුරුවරුන්ට විශේෂ නඩු සම්බන්ධ දේශීය හා විදේශීය පුහුණුවීම් ලබා දීම.

### C-3. මූල්‍ය අපරාධ සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන ශක්තිමත් කිරීම

විමර්ශකයන් සඳහා පුහුණු, COPA, COPE, PERC සාමාජිකයන් වෙනුවෙන් තාක්ෂණික හා විශේෂඥ පුහුණුවීම් ලබා දීම, ඉගෙනුම් හුවමාරු වැඩසටහන් හා පුහුණු වැඩසටහන් පැවැත්වීම, ආචාරධර්ම පද්ධතිය, ද්විතියන පදනමින් විශ්ලේෂකයන් බඳවා ගැනීමේ වැඩසටහන්, ව්‍යවහාරික ගිණුම් ඒකකය සඳහා ICT සම්බන්ධ කිරීම, කුඩා ව්‍යවහාරික පර්යේෂණාගාර, සොරකම් කරන ලද වත්කම් නැවත අය කර ගැනීමේ සන්ධාන, නීති නිලධාරි බඳවා ගැනීම, මනා භාවිතාවන් හුවමාරු කිරීම.

### C-4. අන්තර් ආයතන සම්බන්ධතා ශක්තිමත් කිරීම

නීතිය ක්‍රියාත්මක කරන ආයතන අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම (මූල්‍ය අපරාධවලට අදාළව), ඉහළ මට්ටමේ වට මේස සාකච්ඡා හරහා අත්දැකීම් හා මනා භාවිතාවන් හුවමාරුව, සම්බන්ධීකරණය වූ විමර්ශන හා තොරතුරු හුවමාරු කිරීම පිණිස යෝජනා ඉදිරිපත් කිරීම, MLA සඳහා අන්තර් ආයතනික ජාලය, ආයතන අතර විමර්ශකයන්ගේ සන්ධානයක් ඇති කිරීම.

## D - නීති හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය

දූෂණය තුරන් වූ තිරසර සමාජයක් ඇති කිරීමට ශක්තිමත් හා නම්‍යශීලී නීති හා ප්‍රතිපත්ති අවශ්‍ය කෙරේ. දූෂණය මර්දනය සඳහා වන සිව්වන උපායමාර්ගය තුළින් අනෙකුත් උපායමාර්ගයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීතිමය පදනම ලබාදීම සිදු කරයි. ශ්‍රී ලංකාව තුළ අල්ලස හා දූෂණයට අදාළ විමර්ශනයන් සහ පැමිණිලි මෙහෙයවීමට අදාළ නීති දශක දෙකක කාලයක් තුළ සමාලෝචනයට ලක් වී නැත. එසේම නිවාරණ ක්‍රමවේද

ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීතිද සැකසී නොමැති බැවින් නීතිමය හා ප්‍රතිපත්තිමය රාමු දෙසද අවධානය යොමු කළ යුතුව තිබේ.

ජාතික ක්‍රියාකාරී සැලැස්ම ඒ සම්බන්ධයෙන් පහත යෝජනා ඉදිරිපත් කරයි.

### D-1. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව හා සම්බන්ධ නීති සංශෝධන, අල්ලස් පනත, වත්කම් ප්‍රකාශ කිරීමේ නීතිය, අල්ලස් කොමිෂන් සභා පනත.

### D-2. දූෂණ මර්දනය සම්බන්ධ වෙනත් නීති සංශෝධනය

පරීක්ෂණ කොමිෂන් සභා පනත, වත්කම් නැවත පවරා ගැනීම, මුදල් විශුද්ධිකරණය, මැතිවරණ නීතිය, MLA, තොරතුරු ලබා දෙන්නන් හා හඬ නගන්නන් ආරක්ෂා කිරීමේ නීතිය.

### D-3. ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ

විගණන පනත කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, අනෙකුත් දූෂණ විරෝධී නීති සංශෝධනයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම.

### D-4. අන්තර්ජාතික බැඳීම් සමඟ අනුගත වීම.

UNCAC, OGP, බැංගලෝර් මූලධර්ම, පැල්මෝ සම්මුතිය.

### E - පස්වන උපාය මාර්ගය - ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ඇගයීම

ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් කුලු හතර රඳා පවතින ආධාරකය අධීක්ෂණය හා ඇගයීම ලෙස හැඳින්විය හැකිය. ජාතික ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධව මහජනතාව දැනුම්වත් විය යුතුය. එහි ප්‍රතිඵල ජනතාවට ලැබිය යුතුය. ඒ අනුව මෙම සැලැස්ම තුළ අධීක්ෂණ හා ඇගයීම් යාන්ත්‍රණයක් තිබිය යුතුය. උපායමාර්ග ලෙස භාවිත කිරීමට හා නිසි කලට යාවත්කාලීන කිරීමට එම උපායමාර්ග ආයතන හා සම්බන්ධ කළ යුතු බව දූෂණ මර්දන උපායමාර්ග පිළිබඳ 2013 ක්වාලාලම්පූර් මාර්ගෝපදේශය මගින් පෙන්වා දී තිබේ. යෝජිත කාලරාමුවලට අනුව, ජාතික හා විදේශීය මට්ටමින් යෝජනා ක්‍රියාත්මක කිරීම, ක්‍රියාකාරී සැලැස්ම තුළ විශේෂයෙන් අවධානය යොමු කර ඇත. ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි සමස්ත ගුණාත්මකභාවය සම්බන්ධ අවධානය යොමු කරමින් ක්‍රියාවලි අධීක්ෂණය හා ඇගයීමද E උපායමාර්ගය හරහා සිදු කරනු ලැබේ.

#### අධීක්ෂණ හා ඇගයීම් සැලැස්මෙහි මූලික අරමුණු

ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අධීක්ෂණය, ප්‍රගතිය තක්සේරු කිරීම හා නැවත ඇගයීම මෙමගින් සිදු කෙරේ. මේ තුළින් වගකිව යුතු ආයතන හා ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත නිවැරදි තොරතුරු ලබා දීම සිදු වේ. මෙහි ප්‍රධාන අරමුණු පහත පරිදි වේ.

- ජාතික ක්‍රියාකාරී සැලැස්ම නිසි කාල රාමුවට අනුව අරමුණු ඉටු කර තිබේද යන්න අධීක්ෂණය කිරීම.
- දූෂණ නිවාරණය සම්බන්ධ ආයතනික සැලසුම් වරින් වර අධීක්ෂණයට ලක් කිරීම.
- සැලසුම් ක්‍රියාවන් හරහා දූෂණ අඩු වීම සම්බන්ධ තක්සේරු කිරීම.
- නැවත ඇගයීම හරහා ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමට සම්පත් ලබා දීම.

#### පහත කරුණු ක්‍රියාකාරී සැලැස්මෙහි E උපායමාර්ගය තුළ අන්තර්ගත කර ඇත:

- ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සඳහා අවශ්‍ය ආකෘති ස්ථාපිත කිරීම.
- ආයතනික ක්‍රියාකාරී සැලසුම් නිසි කලට පරීක්ෂා කිරීම.
- ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම නිසි කලට ඇගයීම.
- අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධ හැකියා වර්ධනය.
- ආදර්ශක හා සංවිධාන ඇගයුම් කිරීම.

### අධීක්ෂණය හා ඇගයීම සඳහා වන යාන්ත්‍රණය

ක්‍රියාකාරී සැලැස්ම නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න සොයා බැලීමේ වගකීම අධීක්ෂණ යාන්ත්‍රණයට පැවරෙයි.

ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ජනාධිපති, අගමැති හා අමාත්‍ය මණ්ඩලය වෙත අවසානාත්මක වගකීම හිමි වෙයි. සැලසුම් ක්‍රියාත්මක කිරීමට අදාළව රාජ්‍ය ආයතන වෙත ප්‍රමාණවත් සම්පත් ලබා දීමට අමාත්‍ය මණ්ඩලය විසින් කටයුතු කළ යුතුව ඇත.

ජාතික සුපිළිපන් කවුන්සිලය, ජනාධිපති විසින් පත් කරනු ලැබූ ස්වාධීන විශේෂඥයන්ගෙන් සමන්විත වේ. එහි එක් සාමාජිකයෙකු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිවාරණ අංශයේ නිලධාරියෙකු වනු ඇත. ජාතික ක්‍රියාකාරී සැලැස්ම අධීක්ෂණය හා ඇගයීම මෙම කවුන්සිලය විසින් සිදුකරනු ලැබේ. ඒ අනුව මෙම කවුන්සිලය ජනාධිපති ලේකම් කාර්යාලයට වාර්තා කිරීම සිදු කරනු ලැබේ.

### ජාතික සුපිළිපන් කවුන්සිලයේ මූලික වගකීම්

- සැලසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධ සමාලෝචන සිදු කිරීම.
- අදාළ ආයතන වාර්තා පරීක්ෂා කර මාස හයකට වරක් අමාත්‍ය මණ්ඩලයට වාර්තා කිරීම
- සමාලෝචනය පදනම් කර ගනිමින් නිරීක්ෂණ, යෝජනා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් සම්බන්ධ නිරීක්ෂණ, නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම.
- සැලැස්මෙහි ක්‍රියාකාරකම් ප්‍රධාන දර්ශක පදනම් කර ගනිමින් සමාලෝචනය හා හැඩගස්වා ගැනීම.
- ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අදාළ අයවැය ආයතන අධීක්ෂණය හා වෙනස් කිරීම්. නිර්දේශ කිරීම හා අමතර සම්පත් වෙන් කිරීම.

ජාතික ක්‍රියාකාරී සැලැස්මට අදාළ උපායමාර්ග ක්‍රියාත්මක කරවීම සම්බන්ධයෙන් පළාත් පාලන, සැලසුම්, අධ්‍යාපන, මූල්‍ය, රාජ්‍ය පරිපාලන සහ අනෙකුත් විෂයන් සම්බන්ධ අමාත්‍යාංශ සහ ආයතන වග බලා ගත යුතුය.

ජාතික ක්‍රියාකාරී සැලැස්මෙන් යෝජිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරවීම සම්බන්ධයෙන් ආයතනික ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කරවීම, දූෂණ නිවාරණ කමිටු ඇති කිරීම, සුපිළිපන් නිලධාරීන් පත් කිරීම හා ප්‍රගතිය වාර්තා කිරීම සම්බන්ධව ආයතන ප්‍රධානීන් වෙත වගකීම් පැවරේ.

ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම, ශක්‍යතා වර්ධනය, තාක්ෂණ සහාය ලබා දීම සම්බන්ධීකරණය සිදු කිරීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැවරෙන වගකීමකි. ආයතනික ක්‍රියාකාරී සැලසුම් වරින්වර පරීක්ෂා කිරීම සෑම ආයතනයකම ස්ථාපිත කර ඇති දූෂණ නිවාරණ කමිටු හා ජාතික සුපිළිපන් කවුන්සිලය ඒකාබද්ධව සිදු කරන අතර ජාතික ක්‍රියාකාරී සැලැස්ම පරීක්ෂා කිරීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමඟ ඒකාබද්ධව ජාතික සුපිළිපන් කවුන්සිලය විසින් සිදු කරනු ලැබේ.

(ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2023 ඇසුරින් සැකසූ සංක්ෂප්ත සටහනකි.)

විස්තරාත්මක වාර්තාව සඳහා (https://sinhala.ciaboc.gov.lk/images/nap/NAP-BOOK-SIN.pdf)

# ඇමිණුම්

I. වැඩසටහන් න්‍යාය පත්‍රය (ආකෘතිය)
II. වැඩමුළුව පිළිබඳ වාර්තාව.
III. ඇගයීම් පත්‍රය.

# ඇමුණුම් 1

CIABOC

**"සුපිළිපන් දේශයක් කරා"**

ශ්‍රී ලංකාවෙන් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැගීම :

## රාජ්‍ය නිලධාරීන් සඳහා දූෂණ විරෝධී එක්දින පුහුණු වැඩසටහන

සංවිධානය
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
සමඟ
බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

**2020 මාර්තු 16 බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී**

**සැසි සැලැස්ම**

(වැඩසටහන් න්‍යාය පත්‍රය - ආකෘතියකි.)

| වැඩසටහන් පෙළගැස්ම | | |
|---|---|---|
| 08.30-09.00 | සහභාගීවන්නන් පැමිණීම හා ලියාපදිංචිය | |
| 09.00-09.30 | **සමාරම්භක සැසිය** | |
| **සැසියේ අරමුණු**<br><br>වැඩමුළුවේ අරමුණු පැහැදිලි කිරීම, පුහුණුකරුවන් හා සහභාගීවන්නන්ගේ අරමුණු අතර සමායෝජනයක් ඇති කිරීම හා සමස්ත වැඩමුළුව සඳහා හිතකර පරිසරයක් සකසා ගැනීම. | | |
| වේලාව | තේමාව | සම්පත්දායක |
| 9.00-09.10 | පිළිගැනීම හා අරමුණ පැහැලි කිරීම සහ සම්පත්දායකයින් හඳුන්වාදීම | වැඩමුළුවේ සංවිධායකවරයා/වරිය |
| 9.10-9.20 | සුපිළිපන් රාජ්‍ය සේවයක් කරා යන ගමනේදී රාජ්‍ය නිලධාරීන් වෙත පැවරෙන වගකීම | ආයතන ප්‍රධානී හෝ විශේෂ ආරාධිතවරයාගේ කෙටි අදහස් දැක්වීම |
| 9.20-9.30 | සහභාගීවන්නන් හඳුනාගැනීම (සහභාගීවන්නන් සමඟ සුහදතාව වර්ධනය කර ගැනීම - උපදෙස් බලන්න.) | |
| **දෙවන සැසිය - දූෂණය හඳුනාගැනීම.**<br><br>**සැසියේ අරමුණු**<br><br>දූෂණය යනු කුමක්ද? (විවිධ නිර්වචන ඇසුරින්), දූෂණයේ විවිධ ස්වරූපයන් මොනවාද ?, දූෂණය නිසා අහිමිවන ජාතික ධනය සහ එහි ප්‍රතිවිපාක, දූෂණයට එරෙහි ගෝලීය පෙළගැස්ම යනාදී කරුණු පිළිබඳව සහභාගීවන්නන්ට අවබෝධයක් ලබාදීම. | | |

<table>
<tr><td>9.30-10.30</td><td>දූෂණය, දූෂණයේ ප්‍රතිවිපාක හා දූෂණය මැඬලීම පිළිබඳ සාර්ථක නිදර්ශන</td><td>පුහුණුකරු - 1</td></tr>
<tr><td>10.30-11.00</td><td colspan="2">තේ පානය</td></tr>
<tr><td colspan="3">තෙවන සැසිය - දූෂණයට එරෙහි ශ්‍රී ලාංකික පෙළගැස්ම.<br>සැසියේ අරමුණු<br>■ දූෂණය මැඬලීමේ යාන්ත්‍රණ, දූෂණ වැලැක්වීමේදී රාජ්‍ය නිලධාරීන්ට පැවරෙන වගකීම්, දූෂණයට වැටබඳින නීතිරීති, අල්ලස් කොමිසමේ බලතල හා කාර්යභාරය පිළිබඳව සහභාගිවන්නන් දැනුම්වත් කිරීම.</td></tr>
<tr><td>11.00-12.30</td><td>දූෂණයට වැටබඳින නීතිරීති සහ අල්ලස් කොමිසමේ බලතල හා කාර්යභාරය</td><td>පුහුණුකරු - 2</td></tr>
<tr><td>12.30-13.30</td><td colspan="2">දිවා ආහාරය</td></tr>
<tr><td colspan="3">සිව්වන සැසිය - දූෂණය පිටුදැකීමේ ශ්‍රී ලාංකික සැලසුම්.<br>සැසියේ අරමුණු<br>■ සුපිළිපන්භාවය පිළිබඳව දැනුම්වත්වීම සහ සුපිළිපන්භාවයේ අගය පිළිබඳව සංවේදීභාවයක් ඇතිකිරීම.<br>■ තෑගි රීති පිළිබඳ ප්‍රතිපාදන ගැන සහභාගීවන්නන් දැනුම්වත් කිරීම සහ ඒ පිළිබඳ සංවාදයක් ඇතිකිරීම.<br>■ බැඳියාවන් අතර ගැටුම පිළිබඳව රීති ගැන දැනුම්වත් කිරීම සහ ඒ පිළිබඳ සාකච්ඡාවක් ඇතිකිරීම.<br>■ රාජ්‍ය සේවය තුළ සුපිළිපන්භාවය ඇතිකිරීමට අදාළව පවත්නා ප්‍රතිපාදන ගැන සහභාගිවන්නන් දැනුම්වත් කිරීම.<br>■ දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව මූලික අවබෝධයක් ලබාදීම.</td></tr>
<tr><td>13.30-14.30</td><td>සුපිළිපන් රාජ්‍ය සේවකයා සතු හරයාත්මක භාවිතාව</td><td>පුහුණුකරු - 1</td></tr>
<tr><td colspan="3">පස්වන සැසිය - ආයතන තුළ පවත්නා දූෂණ අවධානම් හඳුනාගැනීම.<br>සැසියේ අරමුණු<br>■ ආයතන තුළ පවත්නා දූෂණ අවධානම් තත්ත්වයන් හඳුනා ගැනීම.<br>■ අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීමට පෙළඹවීමක් ඇතිකිරීම.</td></tr>
<tr><td>14.30-15.30</td><td>ආයතන තුළ පවත්නා දූෂණ අවධානම් තත්ත්වයන් හඳුනා ගැනීම</td><td>පුහුණුකරු - 2</td></tr>
<tr><td>15.30-16.00</td><td colspan="2">සමාප්ති සැසිය<br>වැඩසටහන ඇගයීම<br>ස්තුතිය</td></tr>
<tr><td>16.00-16.30</td><td colspan="2">තේ පානය හා විසිරයාම</td></tr>
</table>

# ඇමුණුම් 2

CIABOC

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**
සංවිධානය කරන
රාජ්‍ය නිලධාරීන් සඳහා දූෂණ විරෝධී එක්දින පුහුණු වැඩසටහන
(2020 දිනය ...................... ) (ස්ථානය .............................. )

**01. සැසිවාර තුළින් ඔබ ලබාගත් දැනුමෙහි මට්ටම** (ඔබගේ එකඟතාව අදාළ කොටුව තුළ ලකුණු කරන්න)

| | **දේශන මාතෘකාව** | **බොහෝ දේ දැනගත්තෙමි** | **සාමාන්‍ය දැනුමක් ලැබීම** | **යම් දෙයක් දැනගතිමි** | **කිසිම දැනුමක් නොලැබිණි** |
|---|---|---|---|---|---|
| 1 | දූෂණය හඳුනාගැනීම හා දූෂණයේ ප්‍රතිවිපාක | | | | |
| 2 | දූෂණය වැළැක්වීමේ ක්‍රියාමාර්ග | | | | |
| 3 | සුපිළිපන් රාජ්‍ය සේවකයා සතු හරයාත්මක භාවිතාව (තෑගි රීති, බැඳියාවන් අතර ගැටුම පිළිබඳ රීති ආදිය ඇතුළත්ව...) | | | | |
| 4 | ආයතන තුළ පවත්නා දූෂණ අවධානම් හඳුනාගැනීම | | | | |

**02. පහත සඳහන් ප්‍රකාශ සම්බන්ධයෙන් ඔබගේ ප්‍රතිචාරය සලකුණු කරන්න.**

| | **දේශන මාතෘකාව** | **තරයේම එකඟ වෙමි** | **එකඟ වෙමි** | **එකඟ වන්නේවත් එකඟ නොවන්නේවත් නැත** | **ප්‍රතික්ෂේප කරමි** | **තරයේම ප්‍රතික්ෂේප කරමි** |
|---|---|---|---|---|---|---|
| 1 | වැඩමුළුවේදී විෂය කරුණු ප්‍රමාණවත් ලෙස ආවරණය විය. | | | | | |
| 2 | විෂය කරුණුවල අන්තර්ගතය මගේ පසුබිමට හා අත්දැකීම් වලට හොඳින් සම්බන්ධ වේ. | | | | | |
| 3 | වැඩසටහන හොඳින් සූදානම්කර තිබිණි. | | | | | |
| 4 | දූෂණය මැඩලීම සඳහා මටත් දායකවිය හැකි බවට විශ්වාසයක් ඇතිවිය. | | | | | |
| 5 | වීඩියෝ වැඩසටහන් ගැලපෙන ලෙස යොදාගෙන තිබිණි. | | | | | |
| 6 | වැඩමුළුවේදී සපයන ලද අත්පත්‍රිකා ආදිය ප්‍රයෝජනවත්ය. | | | | | |

**03. පහත කරුණු පිළිබඳව ඔබගේ එකඟතාවය දක්වන්න.**

| | දේශන මාතෘකාව | විශිෂ්ටයි | හොඳයි | සාමාන්‍යයි | අසතුටුදායකයි | දුර්වලයි |
|---|---|---|---|---|---|---|
| 1 | පුහුණු ක්‍රමවේද | | | | | |
| 2 | සම්පත්දායකයින් සතු දැනුම සහ ඉදිරිපත් කිරීම් | | | | | |
| 3 | ශාලා පහසුකම් | | | | | |
| 4 | ආහාර සහ සංග්‍රහ කටයුතු | | | | | |
| 5 | සහභාගීවූවන් තුළ වැඩසටහන කෙරෙහි පැවැති උනන්දුව | | | | | |
| 6 | වැඩසටහනේ සංවිධාන කටයුතු | | | | | |
| 7 | වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු | | | | | |

**04. වැඩමුළුවේ කාලසීමාව**

ඉතා හොඳයි ☐ කෙටියි ☐ කාලය වැඩියි ☐

**05. සහභාගී වූ ප්‍රමාණය**

ප්‍රමාණවත් විය ☐ ප්‍රමාණවත් නැත ☐ ප්‍රමාණය ඉක්මවීය ☐

**06. සහභාගිවූවන් අතර ප්‍රමාණවත් කාන්තා නියෝජනයක් තිබුණේද?**..........................................................

**07. වැඩමුළුවේ පුහුණුකරුවන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳව සංවේදීව කටයුතු කළේද?**..............................

**08. පුහුණුකරුවන්, සියලු දෙනාගේම සහභාගීත්වය ලබාගනිමින් වැඩමුළුව පැවැත්වීමට සමත්වීද?**

..........................................................................................................................................

**09. මෙම වැඩමුළුවෙන් ඉවත් කළ යුතු හෝ සංශෝධනය කළයුතු මාතෘකා තිබේද? ඒ මොනවාද?**

..........................................................................................................................................

**10. අලුතින් එක්කළ යුතුයැයි ඔබ සිතන මාතෘකා/තේමා මොනවාද?**

..........................................................................................................................................

**11. මෙම වැඩසටහන දියුණු කිරීම සඳහා ඔබ ඉදිරිපත් කරන යෝජනා මොනවාද?**

..........................................................................................................................................

**12. මෙම වැඩමුළුවේදී ලබාගත් දැනුම භාවිත කරමින් ඔබට කළ හැක්කේ මොනවාද ?**

..........................................................................................................................................

**13. මෙම වැඩමුළුව සම්බන්ධයෙන් ඔබගේ සමස්ත වර්ගීකරණය කුමක්ද?**

අති විශිෂ්ටයි ☐ ඉතා හොඳයි ☐ හොඳයි ☐ සාමාන්‍යයි ☐ දුර්වලයි ☐

# ඇමුණුම් 3

CIABOC

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**
සංවිධානය කරන
රාජ්‍ය නිලධාරීන් සඳහා දූෂණ විරෝධි එක්දින පුහුණු වැඩසටහන
( ................................. දිස්ත්‍රික්කය)

## වැඩමුළු වාර්තාව

| **දේශන මාතෘකාව** | |
|---|---|
| දිනය | |
| ස්ථානය | |
| වැඩසටහන් සංවිධායක/පහසුකාරක ගේ නම | |
| පුහුණුකරු-1 | |
| පුහුණුකරු-2 | |
| සහභාගිවූවන්ගේ සංඛ්‍යාව | |
| වැඩමුළුවේ සමස්ථ වියදම | |
| සහභාගීවන්නන් විසින් මතුකළ විශේෂ ප්‍රශ්න /අදහස් | |
| සහභාගීවූවන්ගෙන් ඉදිරිපත්වූ විශේෂ ඉල්ලීම් | |
| සහභාගීවූවන් තුළ පැවැති උනන්දුව | |
| ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව සහභාගීවන්නන්ගෙන් ලැබුණ ප්‍රතිචාර | |
| වැඩමුළුව පිළිබඳ පුහුණුකරුගේ සටහන් | |

*සැ.යු.
පූර්ව ඇගයුම් ප්‍රශ්නාවලිය,පසු ඇගයුම් පත්‍රිකා, අත්සන් ලේඛනය සහ වැඩමුළුවේ ඡායාරූප 05 ක් සමඟ කෙටි සටහනක් මෙම අයදුම්පත සමඟ ඊ-මේල් මගින් CIABOC වෙත යොමු කරන්න.

දිනය ----------------------------------------------------------------

අත්සන ----------------------------------------------------------------

නම ----------------------------------------------------------------

'. . . . . . . මෙහි නොමිලයේ කර්මයක් නොකොට යුතුයැයි ද දැන්වූයේය. එක එක දොර දොළොස් ලක්ෂය බැගින් කහවණුද ඉතා බොහෝ වූ වස්ත්‍රයන්ද තැබ්බවූයේය. නානාප්‍රකාර ආහරණද පාන වර්ගද සහිත වූ ඛාද්‍ය බෝජ්‍යයන්ද සුවඳ මල් උක් සකුරු ආදියද මුව සුවඳ කරන්නා වූ තකුල් කපුරු ආදී වූ භෛෂජ්‍ය පංචකය ද " රිසි වූ පරිද්දෙන් කර්මාන්තය කොට ඒ දෙය රිසි සේ ගනිත්වා" යි කියා තැබ්බ වූයේය. රජහුගේ කම්කරුවෝ එසේම බලා දුන්හ. . . . . . . ." (මහා වංශයේ තිස්වෙනි පරිච්ඡේදය)

දුටුගැමුණු මහරජතුමා විසින් ස්වර්ණමාලි සෑයට ශ්‍රමදායකත්වය සැපයූ කම්කරුවන්ට ගාස්තු ගෙවා ඇති ආකාරය ඉහත ඡේදයෙන් විස්තර වේ. ඒ අනුව කම්කරුවන් තමන් කළ කාර්යයට අදාළ වටිනාකම තමන්ම තීරණය කර ඇත. තමා විසින් තීරණය කළ වටිනාකමට අදාළව රජතුමා විසින් විහාර බිම අසල තැන නැන තබා තිබූ මුදල් හා අනෙකුත් භාණ්ඩ ලබාගැනීම ඔවුන් විසින්ම සිදුකර ඇත. චෛත්‍යය ඉදිකිරීම නිමවන තෙක්ම මෙම ස්වේච්ඡා තක්සේරුව හා ගාස්තු ලබාගැනීම සිදුවී ඇත.

එවැනි ක්‍රියාවලියක් අඛණ්ඩව පවත්වාගෙන යාමට තරම් එකල ලාංකිකයා සුපිළිපන්නව කටයුතු කර ඇති බව මෙයින් පැහැදිලිවේ.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාව විසින් ඉතා පුළුල් සංවාදයක් මගින් "ශ්‍රී ලංකාව තුලින් අල්ලස සහ දූෂණය වැළැක්වීම සදහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2023" සකස් කරන ලද්දේඑවැනි අතීත සුපිළිපන් මිනිසුන්ගෙන් පන්නරය ලබමිණි.

ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රධාන අංගයක් වන "**සාරධර්ම පදනම් කරගත් අධ්‍යාපනය හා ප්‍රජාව සම්බන්ධකර ගැනීම**" ට අදාළ සුපිළිපන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් මාලාව උදෙසා ප්‍රකාශන තුනක් එළිදක්වා තිබේ. එනම්,

1- **තෙදින වැඩමුළු මාර්ගෝපදේශ සංග්‍රහය** - සුපිළිපන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ තෙදින වැඩමුළු මාලාවේ පුහුණුකරුවන්, සම්පත්දායකයින් හා සංවිධායකයින් සදහා මගපෙන්වීම.

2- **සම්පත් අත්පොත** - සුපිළිපන් පුහුණුකරුවන්ගේ විෂය දැනුම වර්ධනය කිරීම සදහා වන විෂය කරුණු.

3- **එක්දින වැඩමුළු මාර්ගෝපදේශ සංග්‍රහය** - එක් දින පුහුණු වැඩසටහන් පැවැත්වීම සදහා අදාළ මගපෙන්වීම්, අත් පත්‍රිකා සහ පුහුණු මෙවලම්.

CIABOC

9 786245 040209

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION